

වාර්ෂික වාර්තාව 2022

හා මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

දැක්ම

"සමාන ඉගෙනුම් අවස්ථා ලබා දෙමින් ජීවිතයේ කඩඉම් වෙනස් කරන අධ්‍යාපනයේ විශිෂ්ටත්වය අත් කර ගැනීම."

මෙහෙවර

"ඉගැන්වීමේ සහ පර්යේෂණයේ විශිෂ්ටත්වය සඳහා වූ කැපවීම සහිත විවෘත, දුරස්ථ හා නම්‍යශීලී අධ්‍යාපනය හරහා යාවජීව ඉගෙනුම් අවස්ථා සැලසීම."

ආයතනික අරමුණු

1. ජීවිතයේ කඩඉම් වෙනස් කරන අධ්‍යාපනය සඳහා සහාය දක්වන ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවයේ විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම.

2.ගෝලීය දෘශ්‍යතාව සහ පිළිගැනීම සමඟ පර්යේෂණයේ විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම.

3. මානව ප්‍රාග්ධනය සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

4. අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීම පුළුල් කිරීම සහ ජීවිතයේ කඩඉම් වෙනස් කිරීමේ අධ්‍යාපනය සඳහා අවස්ථා වැඩි දියුණු කිරීම.

5. උසස් ගුණාත්මකභාවයෙන් යුත් අධ්‍යාපනික උපකාරක සේවා සහතික කිරීම.

6. සමාජ සහ පාරිසරික ප්‍රතිචාර්යතාව සහතික කිරීම.

උපකුලපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන් සඳහා පදනම් අදියරේ සිට ආචාර්ය උපාධි අදියර දක්වා තම අධ්‍යාපන කටයුතු සිදු කළහැකි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විවෘත හා දුරස්ථ ඉගෙනුම් ආයතනය වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් රජයේ ජාතික විශ්වවිද්‍යාල 17න් එකක් වන විවෘත විශ්වවිද්‍යාලය, නෛතික, ආයතනික හා අධ්‍යාපනය යන ක්ෂේත්‍රවලින් ශ්‍රී ලංකාවේ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාල හා සමානව ක්‍රියාකරයි. විශ්වවිද්‍යාලය අනුගමනය කරන ඉගැන්වීම් ක්‍රමවේදවල ස්වභාවය සහ අප සතුව ඇති යටිතල පහසුකම් හේතුවෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය දිවයින පුරා ව්‍යාප්තව සිටින විශාල ශිෂ්‍යයන් සංඛ්‍යාවකට සේවා සැපයිය හැකි තත්ත්වයක පවතී. වර්තමානය වන විට, දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය මධ්‍යස්ථාන 9කින් හා අධ්‍යයන මධ්‍යස්ථාන 18කින් සේවා ලබා ගන්නා 45000කට අධික ශිෂ්‍යයින් සංඛ්‍යාවක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ ඉගෙනුම ලබයි.

විශ්වවිද්‍යාලයේ මෙහෙවර වන්නේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය හරහා උසස් තත්ත්වයේ, දැරිය හැකි මිලකට සහ අදාලත්වයකින් යුත් අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශ පහසුකම් වැඩි දියුණු කිරීම සහ 21 වන සියවසේ එල්ල වන අභියෝගවලට මුහුණ දීම සඳහා ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා සහතික කිරීමයි. මෙම මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්ව විද්‍යාලය බොහෝ උපායමාර්ග අනුගමනය කරයි. විශ්වවිද්‍යාලය සෑම විටම ශිෂ්‍ය ප්‍රජාව කේන්ද්‍රකරගත් උසස් අධ්‍යාපන පහසුකම් සපයන ආයතනයකි. විශ්වවිද්‍යාලය පීඨ හයක් යටතේ අධ්‍යයන දෙපාර්තමේන්තු තිස් එකක් හරහා විවිධ අධ්‍යයන වැඩසටහන් අසුවකට වඩා ඉදිරිපත් කරයි.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවෙමින් පවතින තාක්ෂණික වර්ධනයන්ට සමගාමීව, අපගේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා මාර්ගගත සහාය ලබා දීම ඇතුළුව නවීන තාක්ෂණය හරහා සිසුන්ට වැඩි ඉගෙනුම් සහායක් ලබා දීමට විශ්වවිද්‍යාලය දැඩි උත්සාහයක් දරා ඇත. වැඩ කරන වැඩිහිටියන්ට සහ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට අවස්ථාවක් නොලැබුණු අයට අධ්‍යාපනය සඳහා විකල්ප මාර්ග සපයමින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇතුළුවීමට අවකාශය ලබා දී ඇත.

ශ්‍රී ලංකා රජය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය රටේ ගුණාත්මක උසස් අධ්‍යාපනය සඳහා වැඩිවන ඉල්ලුම සඳහා අධ්‍යාපනික සේවා සැපයීමේ වැදගත් හවුල්කරුවෙකු ලෙස බැරෑරුම් ලෙස සලකන බව අපි සතුටින් සටහන් කරමු. උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා වන රජයේ පුළුල් දැක්මට ප්‍රතිචාර වශයෙන්, 2022 වසර තුළ නව රැකියා ඉලක්ක කරගත් උපාධි වැඩසටහන් 20 ක් පිරිනැමීමට විශ්වවිද්‍යාලයය කටයුතු කර ඇත. රට තුළ පැවති කැලඹිලි සහිත ආර්ථික පරිසරය නොතකා ජාතික විශ්වවිද්‍යලයක් ලෙස එහි සේවාවන් ඉදිරිපත් කිරීම මගින් 2022 වර්ෂයේදී ජාතික හා ජාත්‍යන්තරව කීර්තියක් අත්කර ගැනීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට හැකිවිය.

මහාචාර්ය පී.එම්.සී තිලකරත්න
උපකුලපති

පටුන

1 කොටස – සාමාන්‍ය 1

1.0 සාමාන්‍ය 2

1.1 විශ්ලේෂණය 2

1.2 පාලන අධිකාරිය 4

2 කොටස – කාර්ය මණ්ඩලය 8

2.0 කාර්ය මණ්ඩලය 9

2.1ආයතනික ව්‍යූහය 9

2.2කාර්ය මණ්ඩල තොරතුරු 11

3 කොටස – ශිෂ්‍ය කාර්ය සාධනය 12

3.0 ශිෂ්‍ය කාර්ය සාධනය 13

3.1බඳවා ගැනීම් 13

3.1.1 දේශීය ශිෂ්‍යයින් 13

3.1.2 විදේශීය ශිෂ්‍යයින් 13

3.2 සම්පූර්ණ කිරීම් 14

3.2.1 උපාධි ප්‍රදානෝත්සවය 14

3.2.2 සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 14

3.3ශිෂ්‍ය ප්‍රජාවගේ ජයග්‍රහණ 15

4 කොටස - පීඨ වාර්තා 18

4.0 පීඨ වාර්තා 19

4.1 අධ්‍යාපන පීඨය 19

4.1.1 විශ්ලේෂණය 19

4.1.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 20

4.1.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 21

4.1.4 මාර්ගගත පාඨමාලා 21

4.2 ඉංජිනේරු තාක්ෂණ පීඨය 24

4.2.1 විශ්ලේෂණය 24

4.2.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනිපුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 26
4.2.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 26
4.2.4 නව පාඨමාලා/ වැඩසටහන් 26
4.2.5 මාර්ගගත පාඨමාලා 27
4.3 සෞඛ්‍ය විද්‍යා පීඨය 33
4.3.1 විශ්ලේෂණය 33
4.3.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 35
4.3.3 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 35
4.3.4 නව පාඨමාලා/ වැඩසටහන් 35
4.3.5 මාර්ගගත පාඨමාලා 36
4.4 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය 38
4.4.1 විශ්ලේෂණය 38
4.4.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 42
4.4.3 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 43
4.4.4 මාර්ගගත පාඨමාලා 44
4.5 කළමනාකරණ අධ්‍යයන පීඨය 45
4.5.1 විශ්ලේෂණය 45
4.5.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 46
4.5.3 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 46
4.5.4 නව පාඨමාලා/ වැඩසටහන් 46
4.5.5 මාර්ගගත පාඨමාලා 47
4.6 ස්වභාවික විද්‍යා පීඨය 48
4.6.1 විශ්ලේෂණය 48
4.6.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 49
4.6.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 50
4.6.4 නව පාඨමාලා/ වැඩසටහනa 50
4.6.5 මාර්ගගත පාඨමාලා 50
5 කොටස - පර්යේෂණ සහ ප්‍රකාශන 52
5.0 පර්යේෂණ හා ප්‍රකාශන 53
5.1 පර්යේෂණ ව්‍යාපෘති/ පත්‍රිකා 53
5.2ග්‍රන්ථ/පේටන්ට් 54
5.3සම්මාන 54

6 කොටස – මධ්‍යස්ථාන හා ඒකක 55
6.0 මධ්‍යස්ථාන හා ඒකක 56
6.1 ප්‍රාදේශීය අධ්‍යාපන සේවා 56
6.2 පුස්තකාලය 57
6.3 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 58
6.4 වෘත්තීය උපදේශන ඒකකය 59
6.5 මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය 60
6.6 ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය 61
6.7 ජාත්‍යන්තර සබඳතා ඒකකය 62
6.8 ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය 66
6.9 අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය 73
6.10 උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය 84
6.11 පර්යේෂණ අංශය 84
6.12 පාරිසරික අධ්‍යයනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය 88

7 කොටස – අනාගත සැලසුම් 90
7.0අනාගත සැලසුම් - 2023 91

8 කොටස - මූල්‍ය තොරතුරු 93
8.0 මූල්‍ය තොරතුරු 94
8.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර: 94
8.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර: 94
8.3 ව්‍යාපෘති ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සපයන ලද) 95
8.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්): 97
8.5 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදනය කළ ආදායම): 97
8.6 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2022: 97
9 කොටස - අවසාන ගිණුම් 98
9.0 අවසාන ගිණුම් 99
9.1 2022.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය 99
9.2 2022.12.31 දිනට මුල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය 101
9.3 2022.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය 129
9.4 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 130

9.5 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.....131
9.6 අයවැය හා තත්‍ය මුදල් සංසන්දනය කිරීම පිළිබඳ ප්‍රකාශය.....137
9.7 ස්වභාවය අනුව වියදම් වර්ගීකරණය කිරීම.....138
9.8 පසුගිය වර්ෂ පහ තුළ මූල්‍යමය ලෙස වැදගත් සිදුවීම්.....139
10 කොටස - විගණන වාර්තා.....140
10.0 විගණන වාර්තා.....141
10.1 විගණකාධිපති වාර්තා.....141
10.2 පිළිතුරු වාර්තාව.....151

❖ පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු (ඉංග්‍රීසි මාධ්‍යයෙන් සඳහන් කොටසෙහි ඇමුණුම්වල ඇතුළත් වේ. පිටු අංක 171 - 200)

1 කොටස – සාමාන්‍ය

1.0. සාමාන්‍ය

1.1 විශ්ලේෂණය



විවෘත හා දුරස්ථ ඉගෙනුම් විශ්වවිද්‍යාලයක් ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලද්දේ වර්ෂ 1980 ජූනි මස 19 වැනිදාය. 1978 විශ්වවිද්‍යාල පනතෙහි අංක 16 හි 23 (01) හා 18 වගන්ති ප්‍රකාරව 1980 අංක 03 දරණ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ආඥා පනත අනුව ද ඉන් අනතුරුව සංශෝධිත 1983 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ආඥා පනත් අංක 01 හා 1996 ආඥා පනත් අංක 12 යටතේ එම ස්ථාපනය සිදු විය. මෙම ආරම්භක පියවරෙහි අවසාන අරමුණ වූයේ "යාවජීව අධ්‍යාපන අවස්ථා සැලසීමත් එමඟින් උසස් අධ්‍යාපනයට පිවිසීම තුළින් ජීවන අවස්ථා වැඩිදියුණු කර ගැනීමට සෑම පුරවැසියෙකු සතු හිමිකම සලසා දීමත්ය."

ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ විශ්වවිද්‍යාල 17න් එකක් වන විවෘත විශ්වවිද්‍යාලය, නීතිමය, ආයතනමය හා අධ්‍යාපනය යන ක්ෂේත්‍රවලින් ශ්‍රී ලංකාවේ අනිකුත් විශ්වවිද්‍යාල හා සමානව ක්‍රියාකරයි. එසේ වුවද, වයස, පූර්ව අධ්‍යාපන සුදුසුකම්, ආදායම, භූගෝලීය සාධක සහ වෘත්තීමය වශයෙන් ඇති බාධා යන කරුණු කිසිවක් නොතකමින් උසස් අධ්‍යාපනය සඳහා ඉඩකඩ වඩාත් ප්‍රසාරණය කිරීම අරභයා විවෘත හා දුරස්ථ අධ්‍යාපන දර්ශනය කෙරෙහි එහි පවතින නිදහස් ස්වභාවය කරණකොට ගෙන අනිකුත් ජාතික තලයේ විශ්වවිද්‍යාලවලින් මෙම ආයතනය වෙන් කර දැක්විය හැකිය.

දැක්ම

"සමාන ඉගෙනුම් අවස්ථා ලබා දෙමින් ජීවිතයේ කඩඉම් වෙනස් කරන අධ්‍යාපනයක් ලබාදීම තුලින් විශිෂ්ටත්වය අත් කර ගැනීම."

මෙහෙවර

"ඉගැන්වීමේ සහ පර්යේෂණයේ විශිෂ්ටත්වය සඳහා වූ කැපවීම සහිත විවෘත, දුරස්ථ හා නම්‍යශීලී අධ්‍යාපනය හරහා යාවජීව ඉගෙනුම් අවස්ථා සැලසීම."

මේ වනවිට වර්ෂ දෙකකට ආසන්න කාලයක් පුරා ලෝකය විනාශ කරමින් සිටින ගෝලීය කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2022 වර්ෂය මුළු ලෝකයට, රටට හා අප සියළු දෙනාටම වඩාත්ම අභියෝගාත්මක වර්ෂයක් වී ඇත. සියලු බාධක නොතකා විවෘත විශ්වවිද්‍යාලය 2022 දී සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කළේය. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය අතිරික්තයක් වාර්තාකල රාජ්‍ය විශ්වවිද්‍යාලයක් බවට පත්කිරීමට සමත්විය.

පුද්ගලයින්, සමාජය සහ විශ්වවිද්‍යාල ප්‍රජාව වශයෙන් අපට ඇති අභියෝගය වන්නේ නව සාමාන්‍ය තත්ත්වයට අනුකූලව හැඩගැසීමයි. අපගේ අභියෝගයන්ට ගැළපෙන පිළිතුර රඳා පවතින්නේ අප නව සාමාන්‍ය තත්ත්වයට හැඩගැසෙන ආකාරය සහ අප සඳහා මෙන්ම ජාතිය සහ විශ්වවිද්‍යාලය වෙනුවෙන් අප විසින් සැලසුම් කර ඇති ගමනාන්තයට ළඟා වීම සඳහා අපගේ ප්‍රවේශයන් සහ ක්‍රියාවලීන්හි යම් යම් වෙනස්කම් සිදු කරන ආකාරය මතය.

හුරුපුරුදු, සිරිත්, ස්ථාන හා පුද්ගලයින් කෙරෙහි ඇති බැඳීම අත්හැරීමට මිනිසුන් අකමැත්තක් දක්වන බැවින් පුද්ගලික හෝ සංවිධානාත්මක වෙනසක් ක්‍රියාත්මක කිරීම සෑමවිටම අපහසු වේ. මිනිසුන් වෙනසට බියක් දක්වති. ජීවිතය හා අවස්ථාවන් පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රවේශයන් තුළ ආරක්ෂාව සොයා ගැනීමට පුද්ගලයින් නැඹුරු වෙති. වෙනස් වීමට විරෝධය දැක්වීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ වෙනසෙහි බලපෑම පිළිබඳව ඇති අවිනිශ්චිතතාවයයි. නොදන්නා දේ පිළිබඳව ඇති බිය සෑම විටම පුද්ගලයින්ගේ තීරණ කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. එසේම, වර්තමාන තත්ත්වයට බාධා වන බැවින් වෙනස් වීමට එරෙහි වන පුද්ගලයින්ද සිටිති.

විශ්වවිද්‍යාලයක් ලෙස ඉදිරි පස් වසර සඳහා අපගේ උපායමාර්ගික කළමනාකරණ සැලැස්ම (Strategic Management Plan) සකස් කර ඇත. මෙම සැලැස්ම විශ්වවිද්‍යාලයක් ලෙස 2025 දී අප සිටිය යුතු තත්ත්වය පැහැදිලි කරයි.

කොවිඩ් 19 මාර්ගෝපදේශයන්ට අනුකූලව විශ්වවිද්‍යාලය විසින් පරිපාලන ක්‍රියාවලීන් බොහෝමයක් ස්වයංක්‍රීය කිරීමට පියවර ගෙන ඇති අතර එමඟින් හැකි සෑම තැනකම සම්බන්ධතාවයක් ඇති වීමෙන් තොරව සන්නිවේදන කටයුතු සිදු කිරීම සහ බෙදා හැරීමේ යාන්ත්‍රණ අනුගමනය කළ හැකිය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 2022 වර්ෂය වන විට ජාතිය වෙනුවෙන් වර්ෂ 42ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බැවින් එම වර්ෂය විශ්වවිද්‍යාලයට ඉතා වැදගත් වසරක් විය. එසේ ගැටළු තිබියදීත් 2021 වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් විවිධ ව්‍යාපෘති ආරම්භ කරන ලදි. විශ්වවිද්‍යාලයීය ප්‍රධාන මණ්ඩපය සහ කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය හරිත විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගන්නා ලදි. මේ සඳහා විශ්වවිද්‍යාලය වෙනුවෙන් හරිත ප්‍රතිපත්තියක් සකස් කර අනුමත කිරීම සිදු විය.

විශ්වවිද්‍යාලය සතුව සියලුම අධ්‍යයන සහ කළමනාකරණ කාර්යයන් සහ ඉගැන්වීම්-ඉගෙනීමේ කාර්යයන් සඳහා සහය වන තොරතුරු තාක්ෂණය යටිතල පහසුකම් සඳහා සහය දැක්වීම සඳහා කලමනාකරණ තොරතුරු පද්ධතියක් පැවතුනද එම පද්ධතිය යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ. එබැවින් විශ්වවිද්‍යාලය තොරතුරු තාක්ෂණ අංශයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ නායකත්වයෙන් නව කලමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළේය.

IOURS-2022 විශ්වවිද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය සම්පූර්ණයෙන්ම මාර්ගගත ජාත්‍යන්තර (Fully-online) සම්මන්ත්‍රණයක් ලෙස සාර්ථකව පවත්වන ලදී. විශ්ව විද්‍යාලය තුළ ක්‍රීඩා ක්‍රියාකාරකම් දියුණු කිරීම සඳහා භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ පියවරක් ලෙස විශ්ව විද්‍යාලය සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා අංග සම්පූර්ණ ව්‍යායාම ශාලාවක් විවෘත කරන ලදී.

යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ යෝජිත සිව්මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2022 දී අවසන් කර විවෘත කරන ලදී.

ඕනෑම අධ්‍යාපන ආයතනයක අවධාරණය කළ යුතු වැදගත් අංශයක් වන්නේ අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාලත්වය සහතික කිරීමයි. තත්ත්ව සහතික මධ්‍යස්ථානය විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා වල ගුණාත්මක භාවය සහ අදාළත්වය ඉහළ නැංවීම සඳහා කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය එක්ව වැඩමුළු කිහිපයක් පවත්වන ලදී.

විශ්වවිද්‍යාලයේ කර්මාන්ත සම්බන්ධතා මධ්‍යස්ථානය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, විශේෂයෙන්ම කෘෂිකර්මාන්තයේ සහ ආහාර කර්මාන්තයේ සහයෝගිතා ව්‍යාපෘති සඳහා එම කර්මාන්තයන් සමඟ හවුල්කාරිත්වයකට එළඹීමේ ක්‍රියාවලියකට අවතීරණ විය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කැපී පෙනෙන ප්‍රවේශයක් සිදු කර ඇති බවට කිසිදු සැකයක් නැත. විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති අවස්ථාවන් තෝරා ගත් රැකියා කරන වැඩිහිටියන්ට සහ තරුණයන්ට අධ්‍යාපනය සඳහා විකල්ප අධ්‍යාපන සපයා දී ඇත.

ශ්‍රී ලංකා රජය උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීමට සුදුසුකම් ඇති සියලුම දෙනාට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කිරීමට උනන්දු වන අතර ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය එම වැඩිවන ඉල්ලුම සැපයීම සඳහා වැදගත් හවුල්කරුවෙකු ලෙස සලකන බව සඳහන් කල හැකිය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සක්‍රීය දායකත්වයත් සමඟ මෙම ඉලක්කය සපුරා ගැනීමට රටට හැකි වනු ඇතැයි විවෘත විශ්වවිද්‍යාලය විශ්වාස කරයි.

1.2 පාලන අධිකාරිය

විශ්වවිද්‍යාලයේ කුලපති: මහාචාර්ය. ධම්මික ඒ. තන්ත්‍රිගොඩ

විශ්වවිද්‍යාලයීය පාලක සභාව:

නිල බලයෙන් සාමාජික:

උපකුලපති: මහාචාර්ය. පී.එම්.සී තිලකරත්න

පීඨාධිපතිවරු:

අධ්‍යාපන පීඨය: මහාචාර්ය. එස්.කුගමූර්ති
ඉංජිනේරු තාක්ෂණ පීඨය: මහාචාර්ය. එච්.පී.ජී.ඒ රත්නවීර
සෞඛ්‍ය විද්‍යා පීඨය: ආචාර්ය. බී.එස්.එස්. ද සිල්වා
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය: ආචාර්ය.එස්.එන්. මොරායස් (2022.10.24 දක්වා)
මහාචාර්ය.ඩී.ඩී.ඒ. පියරත්න
ස්වභාවික විද්‍යා පීඨය: ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. ජී.ඩබ්ලිව්.ඒ.ආර්. ප්‍රනාන්දු
කළමනාකරණ පීඨය: මහාචාර්ය. වී. සිවලෝකතාසන් (2022.05.13 සිට)
මහාචාර්ය. එන්. අබේසේකර

සනාතන සභාව විසින් පත් කළ සාමාජිකයින් වනුයේ,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. එස්.ආර්. වීරකෝන් (2022.08.19 දක්වා)
මහාචාර්ය. වී. සිවලෝගතාසන්
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. සී.එස්. ද සිල්වා

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කළ සාමාජිකයා වනුයේ,

එම්.එම්. ක්‍රිශාන්ති මෙය

රාජ්‍ය තොරතුරු අමාත්‍යාංශය විසින් පත් කළ සාමාජිකයා වනුයේ,

ඩී.පී.යූ වේලාරත්න මෙය

උපකුලපතිවරුන් සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව විසින් පත් කළ සාමාජිකයා වනුයේ,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. චන්ද්‍රිකා එන්. විජේරත්න
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. එච්.ඩී. කරුණාරත්න (2022 මැයි සිට)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් වනුයේ,

මහාචාර්ය. රංජිත් ජයසේකර
ආචාර්ය. අනුර ඒකනායක (2022.03.24 දක්වා)
ආචාර්ය. චානක තල්පහේවා
ආචාර්ය. එන්.සී. කුමාරසිංහ
පී. රණේපුර මහතා
රංජිත් ජී. රූපසිංහ මහතා
රූබන් වික්‍රමාරච්චි මහතා
තිස්ස නන්දසේන මහතා
අශේන් ජයසේකර මහතා
තුසාන්ත විජේමාන්න මහතා
ජී. තිස්සකුට්ටිආරච්චි මහතා
ගයානි ද අල්විස් මෙය

විශ්වවිද්‍යාලයීය සනාතන සභාව:

නිල බලයෙන් සාමාජිකඃ

උපකුලපතිඃ මහාචාර්ය. පී.එම්.සී තිලකරත්න

පීඨාධිපතිවරුඃ

අධ්‍යාපන පීඨයඃ	මහාචාර්ය. එස්.කුගමූර්ති
ඉංජිනේරු තාක්ෂණ පීඨයඃ	මහාචාර්ය. එච්.පී.ජී.ඒ රත්නවීර
සෞඛ්‍ය විද්‍යා පීඨයඃ	ආචාර්ය. බී.එස්.එස්. ද සිල්වා
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයඃ	ආචාර්ය.එස්.එන්. මොරායස් (2022.10.24 දක්වා) මහාචාර්ය.ඩී.ඩී.ඒ. පියරත්න
ස්වභාවික විද්‍යා පීඨයඃ	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. ජී.ඩබ්ලිව්.ඒ.ආර්. ප්‍රනාන්දු
කළමනාකරණ පීඨයඃ	මහාචාර්ය. වී. සිවලෝකතාසන් (2022.05.13 සිට) මහාචාර්ය. එන්. අබේසේකර

අධ්‍යක්ෂවරු

අධ්‍යක්ෂ/ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනයඃ	ආචාර්ය. රොමෝලා රසූල්
වැඩබලන අධ්‍යක්ෂ/ අධ්‍යාපන තාක්ෂණික සහ මාධ්‍යය මධ්‍යස්ථානයඃ	මහාචාර්ය. සී.එස්. ද සිල්වා
වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවාඃ	අනුෂ්ක බණ්ඩාර මහතා

අධ්‍යනාංශ ප්‍රධානීන්

ප්‍රධානී/ මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනඃ	ආචාර්ය. ටී. මුකුන්තන්
ප්‍රධානී/ ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනඃ	ආචාර්ය. එස්.එන්. ජයසිංහ
ප්‍රධානී/ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනඃ	ආචාර්ය.කේ.ඩී.ආර්.එල්. ජේ.පෙරේරා
ප්‍රධානී/ අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණඃ	ඩබ්ලිව්.එම්.එස්. වීරකෝන් මහතා
ප්‍රධානී/ කෘෂිකාර්මික සහ වැවිලි ඉංජිනේරු විද්‍යාවඃ	ආචාර්ය. ඒ.ජී.බී අරුග්ගොඩ මෙය
ප්‍රධානී/ පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණයඃ	ආචාර්ය. ඩී. එස්. විජේරත්න
ප්‍රධානී/ සිවිල් ඉංජිනේරුඃ	මහාචාර්ය. ටී.එම් පල්ලේවත්ත
ප්‍රධානී/ විදුලි සහ පරිගණක ඉංජිනේරුඃ	එච්. පැස්කුවල් මෙය
ප්‍රධානී/ ගණිත සහ ඉංජිනේරු විද්‍යාවේ දර්ශණයඃ	ජී. නන්දසේන මහතා
ප්‍රධානී/ යාන්ත්‍රික ඉංජිනේරුඃ	ආචාර්ය.අයි.යූ. අත්තනායක මෙය
ප්‍රධානී/ භාෂා අධ්‍යයනඃ	ආචාර්ය. කේ.චන්ද්‍රමෝහන් මෙය
ප්‍රධානී/ සමාජ අධ්‍යයනඃ	ආචාර්ය. එස්. පත්මනීසන්
ප්‍රධානී/ නීති අධ්‍යයනඃ	ඊ.එන්.ආර් ද සිල්වා මහතා
ප්‍රධානී/ ඉංග්‍රීසි භාෂා ඉගැනවීම්ඃ	ආචාර්ය. එස්.ඒ.ඒ.කේ සතරසිංහ
ප්‍රධානී/ ගණිතඃ	ආචාර්ය.ඩබ්ලිව්.සී.ඩබ්ලිව්. නවරත්න
ප්‍රධානී/ පරිගණක විද්‍යාඃ	අයි.ඩී.අයි.ඩී ආරියසිංහ මෙය
ප්‍රධානී/ භෞතික විද්‍යාඃ	ආචාර්ය. ජේ.වී.පී ප්‍රනාන්දු
ප්‍රධානී/ රසායන විද්‍යාඃ	මහාචාර්ය. ආර්. සෙන්තිල්නිති

ප්‍රධානී/ උද්භිද විද්‍යා:	ආචාර්ය.කේ.ඕ.එල්.සී කරුණානායක
ප්‍රධානී/ සත්ව විද්‍යා:	ආචාර්ය. ටී.එස්.පී ප්‍රනාන්දු
ප්‍රධානී/ වෛද්‍ය රසායනාගාර විද්‍යා:	ආචාර්ය.බී.එම්.සී.ආර්.ඩබ්ලිව්.යාපා මෙය
ප්‍රධානී/ ඖෂධ විද්‍යා:	ආර්.බී.ජේ බුද්ධිකා මෙය
ප්‍රධානී/ හෙද විද්‍යා:	ආචාර්ය.කේ.ඒ ශ්‍රියානි මෙය
ප්‍රධානී/ මනෝවිද්‍යා සහ උපදේශන:	ආචාර්ය.එච්.එම්.සී.ජේ හේරත් මෙය
ප්‍රධානී/ මූලික විද්‍යා:	ආචාර්ය.කේ. විවේහනාදන් මෙය
ප්‍රධානී/ අලෙවිකරණ කළමනාකරණ:	ආචාර්ය.එස්. සපුකොටනගේ
ප්‍රධානී/ සංවිධාන අධ්‍යයන:	ආචාර්ය.එස්.එස්.කේ එදිරිසිංහ
ප්‍රධානී/ ගිණුම්කරණය හා මූල්‍ය:	මහාචාර්ය.එච්.ඩී.සී.සී ලියනගමගේ
ප්‍රධානී/ මානව සම්පත් කළමනාකරණය:	කේ.පී නිශාන්ත මහතා

ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්

රසායන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය.කේ.එස්.ඩී.පෙරේරා
කෘෂි කාර්මික සහ වැවිලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය.සී.එස් ද සිල්වා මෙය
පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය පිළිබඳ : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය. එස්.ඒ. අරියදුරෙයි
සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය.කේ.එස්.වීරසේකර
භෞතික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය. ජේ.සී.එන් රාජේන්ද්‍ර
නීති අධ්‍යයනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය.සී.ඊ ගුණරත්න
සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය. ජී.ආර්.ආර් රණවක
උද්භිද විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය. එස්.ආර්. වීරකෝන් මෙය
අධ්‍යාපනික තාක්ෂණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය. එස්.පී. කරුණානායක
භෞතික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය. වී.පී.එස් පෙරේරා

මහාචාර්යවරුන්

සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. ඩී.ඒ.ආර්. දොලගේ
පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. සී.එන් හේරත්
යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එස්.ඒ.එම්.ඒ.එන්.එස් සේනානායක
කළමනාකරණ අධ්‍යයන පිළිබඳ මහචාර්ය:	මහාචාර්ය.වී. සිවලෝගතාසන්
පාරිසරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය: සහ අධ්‍යක්ෂ/ පාරිසරික අධ්‍යයනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය	මහාචාර්ය.බී.සී.එල් අතපත්තු
භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.ජී.කේ.ආර් සේනාධීර
රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එස්.ආර් හෙට්ටිආරච්චි
උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එච්.එල්.ඩී වීරහේවා
විදුලි හා පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ	මහාචාර්ය. එච්.යූ.ඩබ්ලිව්. රත්නායක

මහාචාර්ය:

ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. ඩබ්ලිව්.එම්.එස්. වනසිංහ
ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. එෆ්.එම් නවස්තීන්
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මහාචාර්ය	මහාචාර්ය.එච්.එස්. රඹුක්වැල්ල
(ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය):	
මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.ඩී.එම්.ඩබ්ලිව්. මුණසිංහ

පුස්තකාලයාධිපති

නියෝජ්‍ය පුස්තකාලයාධිපති:	ආචාර්ය.අයි.එම්. නවරත්න

පීඨ නියෝජිතයින්

නියෝ/ අධ්‍යාපන පීඨය:	එම්.එල්. සුදර්ශන මහතා
නියෝ/ අධ්‍යාපන පීඨය:	ආචාර්ය.ජේ.ඩී. කරීම්ඩීන්
නියෝ/ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය:	ආචාර්ය.එන්.කේ. අබේසේකර
නියෝ/ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය:	එච්.එන්.ඩී. ගම්ලත් මෙය
නියෝ/ ස්වභාවික විද්‍යා පීඨය:	ආචාර්ය. එම්.ඒ.යූ මාම්පිටිය
නියෝ/ ස්වභාවික විද්‍යා පීඨය:	ආචාර්ය. එම්. පුංචිමුදියන්සේ
නියෝ/ සෞඛ්‍ය විද්‍යා පීඨය:	පී.ඩබ්ලිව්.ජී.ඩී.පී. සමරසේකර මෙය
නියෝ/ සෞඛ්‍ය විද්‍යා පීඨය:	ආචාර්ය. එම්.පී. දිසානායක
නියෝ/ කළමනාකරණ අධ්‍යයන පීඨය:	එස්. මොනෝෂිකා මෙය
නියෝ/ කළමනාකරණ අධ්‍යයන පීඨය:	සී.පී. වීරසේකර මහතා
නියෝ/ ඉංජිනේරු තාක්ෂණ පීඨය:	ආචාර්ය.එස්.ඩී.ආර්. පෙරේරා
නියෝ/ ඉංජිනේරු තාක්ෂණ පීඨය:	සී.ජේ. බස්නායකගේ මහතා

ලේකම්

නියෝජ්‍ය ලේඛකාධිකාරී/අධ්‍යයන පරිපාලන	පී.කේ. සෙනෙවිරත්න මහතා

විශ්වවිද්‍යාලයීය නිලධාරීන්:

උපකුලපති:	මහාචාර්ය. පී.එම්.සී තිලකරත්න
ලේඛකාධිකාරී:	ඩබ්ලිව්.එල්.වී. ජයසේන මෙය
අධ්‍යාපන පීඨය:	මහාචාර්ය. සසිකලා කුගමූර්ති
ඉංජිනේරු තාක්ෂණ පීඨය:	ආචාර්ය. එච්.ජී.පී.ඒ. රත්නවීර
සෞඛ්‍ය විද්‍යා පීඨය:	ආචාර්ය. බී. සුනිල් එස්. ද සිල්වා
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය:	මහාචාර්ය. ඩී.ඩී.ඒ. පියරත්න
කළමනාකරණ අධ්‍යයන පීඨය:	මහාචාර්ය.එන්. අබේසේකර
ස්වභාවික විද්‍යා පීඨය:	මහාචාර්ය. ජී.ඩබ්ලිව්.ඒ. රොහාන් ප්‍රනාන්දු
වැඩබලන පුස්තකාලයාධිපති:	අයි.එම්. නවරත්න මහතා
මූල්‍යාධිකාරී:	ආචාර්ය. ඩබ්ලිව්.එම්.කේ.ජී.ඒ වික්‍රමසිංහ
වැඩබලන අධ්‍යක්ෂ/ අධ්‍යාපනික තාක්ෂණික සහ මාධ්‍ය මධ්‍යස්ථානය:	මහාචාර්ය.සී.එස්. ද සිල්වා
වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා:	අනුෂ්ක බණ්ඩාර මහතා

2 කොටස – කාර්ය මණ්ඩලය


2.0 කාර්ය මණ්ඩලය

2.1 ආයතනික ව්‍යූහය

විවෘත විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යූහය (රූපසටහන 2) සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයක ආයතනික ව්‍යූහය හා බෙහෙවින් එක සමාන වන අතර විවෘත හා දුරස්ථ අධ්‍යාපනික විශ්වවිද්‍යාලවලට විශේෂිත වූ අමතර තනතුරු කිහිපයක් එනම් අධ්‍යක්ෂ තනතුරු යනාදියත්, ප්‍රාදේශීය අධ්‍යාපනික සේවාවන්, අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය යනාදී සේවාවලින් පමණක් වෙනස්කමක් දක්වයි. කුලපති තනතුර ගෞරවාන්විත තනතුරක් වන අතර උපකුලපතිවරයා ප්‍රධාන විධායක නිළධාරී සහ ගිණුම් නිළධාරී වේ. ලේඛකාධිකාරී ආයතනයෙහි පරිපාලනය, ආයතන සතු ලිපි ලේඛන හා වත්කම්වලට වගකිව යුතු වේ. ලේඛකාධිකාරී විශ්වවිද්‍යාලයේ සහකාර ගිණුම් නිළධාරී වේ. අනෙක් නිළධාරීන් වනුයේ පීඨාධිපතිවරුන්, අධ්‍යක්ෂ/ අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා, පුස්තකාලයාධිපති හා මූල්‍යාධිකාරීවරයා වේ.

ඊට අමතරව විශ්වවිද්‍යාල කටයුතු පුළුල් කිරීම හා අධික්ෂණය කිරීම සඳහා එම අංශවල අර්ධකාලීන අධ්‍යක්ෂවරුන් ලෙස ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රධානත්වයෙන් ඒකක කිහිපයක් විශ්වවිද්‍යාලය විසින් ස්ථාපිත කර ඇත. උදාහරණයක් ලෙස,

- ප්‍රාදේශීය අධ්‍යාපන සේවා
- වෘත්තීය උපදේශන ඒකකය
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
- මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය
- ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය
- ජාත්‍යන්තර සබඳතා ඒකකය
- ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
- අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය
- උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය
- පර්යේෂණ ඒකකය
- පාරිසරික අධ්‍යයනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය



රූපසටහන 1 - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යූහය

2.2 කාර්ය මණ්ඩල තොරතුරු

විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයට 2022 වර්ෂය වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලය (ස්ථිර) **349** ක් ද අනධ්‍යයන පරිපාලන කාර්ය මණ්ඩලය (ස්ථිර) **73** ක් ද, අනධ්‍යයන පරිපාලන නොවන කාර්ය මණ්ඩලය හා අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය **657** ක් ද ඇතුලත් වූහ.

සේවා කාණ්ඩය	වැටුප් ක්‍රේතය	වර්තමාන කාර්ය මණ්ඩලය		
		ස්ථිර		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව
ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය — නුපුහුණු	PL-1	114	18	132
ප්‍රාථමික ශ්‍රේණිය — අර්ධ පුහුණු	PL-2	19	1	20
ප්‍රාථමික ශ්‍රේණිය — පුහුණු	PL-3	64	1	65
ද්විතියික මට්ටම				
කළමනාකාර සහකාර — තාක්ෂණික නොවන	U-MN I	87	148	235
කළමනාකාර සහකාර — තාක්ෂණික	U-MT I	56	13	69
සහාය නිලධාරීන් — 2 කාණ්ඩය	U-MN2	4	1	5
සහාය නිලධාරීන් —1 කාණ්ඩය	U-MN3	11	2	13
මාණ්ඩලික සහකාර / විශේෂ සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U-MN4	25	74	99
තෘතියික මට්ටම				
අධ්‍යයන සහාය — 2 කාණ්ඩය	U -AS1	1	0	1
කණිෂ්ඨ විධායක / කළමනාකාරවරුන්	U -EX1	29	20	49
අධ්‍යයන සහාය —1 කාණ්ඩය	U -AS2	13	5	18
ජ්‍යෙෂ්ඨ මට්ටම				
වෛද්‍ය නිලධාරී	U-MO 1	-	-	-
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U-MO 2	-	-	-
මධ්‍යම මට්ටමේ විධායකයින්	U-EX2	12	9	21
මධ්‍යම මට්ටමේ විධායකයින්	U-EX 2(a)	-	-	-
ජ්‍යෙෂ්ඨ විධායකයින්	U-EX3	2	1	3
කථිකාචාර්ය	U-AC 3	113	200	313
සහාය මහාචාර්ය	U-AC 4	-	3	3
මහාචාර්යවරුන් / ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්	U-AC 5	19	14	33
එකතුව		**569**	**510**	**1079**

1 වගුව: ස්ථිර කාර්ය මණ්ඩලය

3 කොටස – ශිෂ්‍ය කාර්ය සාධනය

3.0 ශිෂ්‍ය කාර්ය සාධනය

3.1 බඳවා ගැනීම්

3.1.1 දේශීය ශිෂ්‍යයින්

2022 වර්ෂයේ සම්පූර්ණ ශිෂ්‍ය බඳවාගැනීම් සංඛ්‍යාව **39436**ක් විය.

බඳවාගැනීමේ අදියර	පීඨය							
	ඉංජිනේරු තාක්ෂණය	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	කළමනාකරණ අධ්‍යයන	අධ්‍යාපන	ස්වභාවික විද්‍යා	සෞඛ්‍ය විද්‍යා	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	එකතුව
සහතික පත්‍ර	62	675	567	24	1116	-	-	**2444**
ඩිප්ලෝමා	-	155	-	189	78	-	-	**422**
උපාධි	6343	8108	4102	1683	3937	3542	-	**27715**
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	1	-	-	4370	-	-	-	**4371**
ශාස්ත්‍රපති	83	160	202	706	169	52	-	**1372**
StART@OUSL*	-	-	-	-	-	-	8890	**8890**
වෙනත්	-	-	-	-	-	-	-	
දර්ශනශූරි/ දර්ශනපති	14	03	04	05	15	02	-	**46**
එකතුව	**6503**	**9101**	**4875**	**6977**	**5315**	**3596**	**8890**	**45257**

2 වගුව: 2022 වසරේ ශිෂ්‍ය බඳවාගැනීම් -දේශීය

3.1.2 විදේශීය ශිෂ්‍යයින්

පීඨය	වැඩසටහන	සංඛ්‍යාව
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය	තරුණ හා ප්‍රජා සංවර්ධනය ශාස්ත්‍රවේදී උපාධිය	02
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය	දෙවන භාෂාවක් ලෙස සිංහල පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	02
	බාහිර පර්යේෂණ ශිෂ්‍යයින්	05

3 වගුව: 2022 වසරේ ශිෂ්‍ය බඳවාගැනීම් - විදේශීය

3.2 සම්පූර්ණ කිරීම්

3.2.1 උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2022 (i) වන උපාධි ප්‍රදානෝත්සවය 2023 ජනවාරි 05 වන දින සහ 2023 ජූලි 19 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි යන අදියර යටතේ ශිෂ්‍යයින් **2350** දෙනෙක් උපාධි වරම් ලැබූහ. ඔවුන් විශ්වවිද්‍යාලයේ පීඨ 3ක් පමණක් නියෝජනය කරන ලදි.

පීඨය	ආචාර්ය උපාධි	දර්ශනපති	ශාස්ත්‍රපති/ විද්‍යාපති	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	උපාධි	එකතුව
අධ්‍යාපන	-	-	435	38	148	**621**
ඉංජිනේරු තාක්ෂණ	-	1	108	1	341	**451**
සෞඛ්‍ය විද්‍යා	-	-	-	-	450	**450**
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	-	-	41	1	9	**51**
කළමනාකරණ අධ්‍යයන	-	-	63	13	306	**382**
ස්වභාවික විද්‍යා	-	-	27	-	368	**395**
එකතුව	**0**	**1**	**674**	**53**	**1622**	**2350**

4 වගුව : පීඨ අනුව උපාධි ප්‍රදාන

3.2.2 සහතික පත්‍ර ප්‍රදානෝත්සවය

සහතික පත්‍ර සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ ප්‍රදානෝත්සවය මෙම වර්ෂයේදී නොපවත්වන ලදි. ශිෂ්‍යයන් **1310** දෙනෙකුට සහතික පත්‍ර හා ඩිප්ලෝමා පිරිනමන ලදි. ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන 05 වගුවෙහි අඩංගු වේ.

ප්‍රදාන / පීඨය	උසස් ඩිප්ලෝමා	ඩිප්ලෝමා	උසස් සහතික පත්‍ර	සහතික පත්‍ර	එකතුව
අධ්‍යාපන	-	66	31	205	**302**
ඉංජිනේරු තාක්ෂණ	148	2	7	-	**157**
සෞඛ්‍ය විද්‍යා	-	-	-	-	**-**
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	13	11	152	61	**237**
කළමනාකරණ අධ්‍යයන	347	-	176	-	**523**
ස්වභාවික විද්‍යා	11	44	36	-	**91**
එකතුව	**519**	**123**	**402**	**266**	**1310**

5 වගුව : පීඨය අනුව සහතික පත්‍ර ප්‍රදාන

3.3 ශිෂ්‍ය ප්‍රජාවගේ ජයග්‍රහණ

❖ ඉංජිනේරු තාක්ෂණ පීඨය

2021 - කර්මාන්ත අධ්‍යනවේදී (ගෞරව) උපාධියෙහි කෘෂිකර්මය පිළිබඳ හොඳම ශිෂ්‍යයා සඳහා වන ලියනගුරුගේ අසී ඇනට් ද සිල්වා රන් පදක්කම

පදක්කම් ප්‍රදානය: ආචාර්ය. පී. රොෂාන් ද සිල්වා
පදක්කම්ලාභියා: සිරිපුරගේ ප්‍රබෝධා රෂ්මි විජේවර්ධන මෙය

2021 - මෘදුකාංග ඉංජිනේරුවේදී (ගෞරව) උපාධිය වෙනුවෙන් හොඳම ශිෂ්‍යයා සඳහා වන වර්චුසා අධ්‍යයන විශිෂ්ටත්ව රන් පදක්කම

පදක්කම් ප්‍රදානය: වර්චුසා (පුද්) සමාගම
පදක්කම්ලාභියා : ප්‍රාන්ගිගේ පමෝධ දිල්රංග පෙරේරා මහතා

2021 - ඉංජිනේරු විද්‍යාව පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය වෙනුවෙන් හොඳම ශිෂ්‍යයා සඳහා වන ඕ.පී. කුල්ශේෂ්ත්‍ර රන් පදක්කම

පදක්කම් ප්‍රදානය: ආචාර්ය. ඕ.පී. කුල්ශේෂ්ත්‍ර
පදක්කම්ලාභියා : හේනගම ලියනගේ දිල්ශාන් නදීර ගුණතිලක මහතා

2021 ඉංජිනේරු විද්‍යාව පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය වෙනුවෙන් හොඳම ව්‍යාපෘතිය සඳහා වන තුරෙයිරාජා රන් පදක්කම

පදක්කම් ප්‍රදානය: ඉංජිනේරු පර්යේෂණ ඒකකය
පදක්කම්ලාභියා: භාග්‍ය කවින්ද සුභසිංහ ආරච්චි මහතා

2021 – ඉංජිනේරු විද්‍යාව පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාවෙහි ව්‍යාපෘතිය පදනම් කරගත් හොඳම තාක්ෂණික පත්‍රිකාව සඳහා වන ඉංජිනේරු පර්යේෂණ ඒකක රන් පදක්කම

පදක්කම් ප්‍රදානය: ඉංජිනේරු පර්යේෂණ ඒකකය
පදක්කම්ලාභියා: අතපත්තු මුදියන්සේලාගේ ලක්ෂ්මන් උදය කුමාර මහතා
අරුන්දතී චමිලක්ෂ්මි ගල්හේනගේ මෙනවිය

2021 - ඉංජිනේරු විද්‍යාව පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාවෙහි මෙකාට්‍රොනික්ස් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ හොඳම ශිෂ්‍යයා සඳහා වන එස්.එම්. අබේගුණසේකර ද සිල්වා රන් පදක්කම

පදක්කම් ප්‍රදානය: මහාචාර්ය. ක්ලැරන්ස් ඩබ්ලිව්. ද සිල්වා
පදක්කම්ලාභියා: උඩුවතනගේ මිනිඳු මෙහෙරාන් මදුසංක මහතා

2021 - ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධි වැඩසටහනෙහි සිවිල් ඉංජිනේරුවේදය පිළිබඳ හොඳම ශිෂ්‍යයා සඳහා වන රන් පදක්කම

පදක්කම් ප්‍රදානය: මහාචාර්ය. කෝලිත වීරසේකර
පදක්කම්ලාභියා: සුරවීර ආරච්චිගේ හසිත් මාලිංග මහතා

2021 - ඉංජිනේරු විද්‍යාව පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාවේ සිවිල් ඉංජිනේරු විද්‍යාවේ හොඳම ව්‍යාපෘතිය සඳහා වන රන් පදක්කම

පදක්කම් ප්‍රදානය: මහාචාර්ය. කෝලිත වීරසේකර
පදක්කම්ලාභියා: මීගල්ල ආරච්චිගේ විභාරා සුගන්ධි ඥාණසිරි මීගල්ල මෙනවිය

❖ ස්වභාවික විද්‍යා පීඨය

2021 - විද්‍යාව සඳහා වන ඩී.බී ඇල්ලේපොල රන් පදක්කම - 2021

පදක්කම් ප්‍රදානය: සී. ඇල්ලේපොල මහතා
පදක්කම්ලාභියා: නජ්මුඩීන් නුසා ශනාස් මෙනවිය

2021 - රසායන විද්‍යාව විශිෂ්ටතාව සඳහා වන ජේ.එන්. ඔලීප් ප්‍රනාන්දු රන් පදක්කම

පදක්කම් ප්‍රදානය: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය බකීබෝල් සමාජය
පදක්කම්ලාභියා: නානායක්කාරගේ ඉසුරුසිරි ශනිල්ක දිල්ෂාන් මහතා

2021 - භෞතික විද්‍යාව විශිෂ්ටතාව සඳහා වන ඊ.එම්. ජයසිංහ අනුස්මරණ රන් පදක්කම

පදක්කම් ප්‍රදානය: ආචාර්ය. උපාලි ජයමහ, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ස්පෙක්ට්‍රම් සමාජය
පදක්කම්ලාභියා: වෙන්ගප්පුලිආරච්චිගේ චතුරංග ජීවන් වෙන්ගප්පුලිආරච්චි

සත්ත්ව විද්‍යාව හොඳම කාර්යසාධනය සඳහා වන ස්වභාවික විද්‍යා පීඨ තිළිණය

<u>ලියාපදිංචි අංකය</u>	<u>නම</u>
116940272	සචිනි එරංගා වීරකෝන් මෙනවිය

උද්භිද විද්‍යාව

<u>ලියාපදිංචි අංකය</u>	<u>නම</u>
716105735	ඕදාත විමලබණ්ඩාර කොටගම මහතා

රසායන විද්‍යාව

<u>ලියාපදිංචි අංකය</u>	<u>නම</u>
216940883	නානායක්කාරගේ ඉසුරුසිරි ශනිල්ක දිල්ෂාන් මහතා

භෞතික විද්‍යාව

<u>ලියාපදිංචි අංකය</u>	<u>නම</u>
616976793	වෙන්ගප්පුලිආරච්චිගේ චතුරංග ජීවන් වෙන්ගප්පුලිආරච්චි

ව්‍යවහාරික ගණිතය

<u>ලියාපදිංචි අංකය</u>	<u>නම</u>
116976538	ගීගනගේ රොෂානි දිල් රුක්ෂි මෙනවිය

❖ අධ්‍යාපන පීඨය

2021 - අධ්‍යාපනපති උපාධිය පිළිබඳ ජී. ඩේවිඩ් ද සිල්වා අනුස්මරණ තිළිණ ප්‍රදානය

තිළිණ ප්‍රදානය: මහාචාර්ය.ජී.අයි.සී. ගුණවර්ධන
තිළිණලාභියා: උඩුමාන් ලෙබ්බේ මොහොමඩ් රිසාන් මහතා
රාජපක්ෂ මුදියන්සේලාගේ නෙලුම් කුමාරි විජේසේකර මහතා

❖ <u>සෞඛ්‍ය විද්‍යා පීඨය</u>

පාඨමාලා ත්‍යාගලාභීන්ගේ නම් ලැයිස්තුව

පහත දැක්වෙන වැඩසටහන් සඳහා පහත සඳහන් ශිෂ්‍යයින් වෙත රු. 2000ක මූල්‍ය ත්‍යාගයක් සහ සහතික පත්‍රයක් ලබා දෙන ලදි.

2019/2020 අධ්‍යයන වර්ෂය (2 වන අධ්‍යයන වාරය)

- **හෙද විද්‍යා අධ්‍යනාංශය**

II වන අධ්‍යයන වාරයේ පාඨමාලා

1.	NGU5401	-හෙද විද්‍යාව ඉගැන්වීම හ ඉගෙනීම	-ආර්.එම්.එස්.එච්. ජයසේකර මෙය
2.	NGU5302	-හෙද සේවයේ වෘත්තීය සංවර්ධනය	-ඩබ්ලිව්.කේ.එච්. පෙරේරා මෙය
3.	NGU5404	-මාතෘ නවජ හා නාරිවේද හෙද විද්‍යාව	-ඩබ්ලිව්.කේ.එච්. පෙරේරා මෙය
4.	NGU5207	-අවදානම් සත්කාර පිළිබඳ හෙද විද්‍යාව	-ඩබ්ලිව්.කේ.එච්. පෙරේරා මෙය
5.	NGU6400	-හෙද විද්‍යා ප්‍රවණතා සහ ගැටළු	-ඒ.එම්.අයි.ඩී. අබේසිංහ මෙය

I සහ II වන අධ්‍යයන වාර පාඨමාලා

1.	NGU6601	- හෙද විද්‍යා කළමනාකරණය හා නායකත්වය	- ජී.ඒ. ප්‍රියදර්ශනී මෙය
2.	NGU6602	- මහජන සෞඛ්‍ය පිළිබඳ හෙද විද්‍යාව	- එස්.ඒ.එස්. ප්‍රසාදිනී මෙය - ඒ.එම්.අයි.ඩී. අබේසිංහ මෙය - කේ.ඒ.අයි ශ්‍රීමාලි මෙය
3.	NGU5910	- ප්‍රාථමික සෞඛ්‍ය සේවය I	- ආර්.ඩී. ගබ්බලගේ මෙය
4.	NGU6910	- ප්‍රාථමික සෞඛ්‍ය සේවය II	- ඩී.එස්.එම්. පෙරේරා මෙය

- **ඖෂධ විද්‍යා අධ්‍යනාංශය**

II වන අධ්‍යයන වාරයේ පාඨමාලා

1.	FMU3204	-ඖෂධ ක්ෂුද්‍රජීව විද්‍යාව I	- ඩබ්ලිව්.ආර්.සී.ඩී බණ්ඩාර
2.	FMU3205	-සෞඛ්‍ය සන්නිවේදනය	- ඩබ්ලිව්.වයි.සී. ප්‍රනාන්දු
3.	FMU3401	-හිෂග්ඥෙයය I	- ඩබ්ලිව්.වයි.සී. ප්‍රනාන්දු
4.	FMU4205	-ප්‍රජා ඖෂධ විද්‍යාව	- කේ.එන්.එල්. කරුණාතිලක
5.	FMU4302	-හිෂග්ඥෙයය II	- ජී.ජී.එස්.යූ. ගැටමුරුත
6.	FMU4306	-ඖෂධ ක්ෂුද්‍රජීව විද්‍යාව II	- එච්.ඩී.ජී. සිල්වා
7.	FMU5205	-ඖෂධ විශ්ලේෂණය II	- ටී.රකුපරම්
8.	FMU5501	- ඖෂධවේදය III	- ජී.ජී.එස්.යූ. ගැටමුරුත
9.	FMU5504	-ඖෂධ තාක්ෂණ විද්‍යාව II	- ආර්.එෆ්. සිෆානා
10.	FMU6207	-ඖෂධ ප්‍රවර්ධනය	- ආර්.එම්.ටී සම්පත්
11.	FMU6304	- සායනික ඖෂධ විද්‍යාව II	- ආර්.පී.ඩී දිනුදා
12.	FMU6505	-ඖෂධීය රසායන විද්‍යාව	- එම්.එන්.ඒ විතානගේ
13.	FMU6806	-පර්යේෂණ ව්‍යාපෘති	- කේ.පී.කේ පෙරේරා - ආර්.එස්. කුමාර - ඩී.ඩී.එන්.ඩබ්ලිව්. සමරකෝන්

- **වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශය**

II වන අධ්‍යයන වාරයේ පාඨමාලා

1.	MDU4302	- රෝග විනිශ්චය පිළිබඳ ක්ෂුද්‍ර විද්‍යාව	- ඒ.එන්.එෆ්. රිෆ්නා මෙය
2.	MDU4303	- සායනික ජෛව රසායනය II	- එච්.ඒ.එස්.එන්. ජයසිංහ මෙය
3.	MDU5202	- රෝගවාහකයන් මගින් බෝවන රෝග	- ඒ.එම්. කෆීල් මහතා
4.	MDU5209	- වෛද්‍ය රසායනාගාර විද්‍යාවේ තාක්ෂණික ක්‍රම	- ඒ.එම්. කෆීල් මහතා
5.	MDU5210	- වෛද්‍ය රසායනාගාර විද්‍යාවේ විශේෂ මාතෘකා	- එච්.පී.අයි. අසංක මහතා
6.	MDU5211	- සෞඛ්‍ය සත්කාර පිළිබඳ තොරතුරු විද්‍යාව	- යූ.එම්.සී.කේ. අබේරත්න මෙය
7.	MDU5401	- උසස් රුධිරවේදය	- ඒ.එන්.එෆ්. රිෆ්නා මෙය

I සහ II වන අධ්‍යයන වාර පාඨමාලා

1.	MDU6800	- පර්යේෂණ ව්‍යාපෘති	- එච්.එම්.සී.කේ හේරත් මෙය - ඩී.කේ.එන්. වික්‍රමරත්න මෙය

- **මූලික විද්‍යා අධ්‍යනාංශය**

II වන අධ්‍යයන වාරයේ පාඨමාලා

1.	BSU3341	- ඖෂධ රසායන විද්‍යාව II	- ඩබ්ලිව්.වයි.සී. ප්‍රනාන්දු මෙය
2.	BSU4245	- මානව ව්‍යූහ විද්‍යාව	- එල්.බී.ආර්. ශ්‍රීමාල් මහතා - ජී.ආර්.එල්. ගුරුගේ මෙය
3.	BSU5230	-ව්‍යවහාරික සංඛ්‍යාලේඛන	- ඒ.එන්.එෆ්. රිෆ්නා මෙය

- **මනෝවිද්‍යාව හා උපදේශන අධ්‍යනාංශය**

II වන අධ්‍යයන වාරයේ පාඨමාලා

1.	PLU3204	- මනෝවිද්‍යාවේ ආචාර ධර්ම	- එන්.එස්. රාමනායක මෙය
2.	PLU3202	- පෞරුෂත්වය සහ පුද්ගල වෙනස්කම්	- ප්‍රදානය කර නැත
3.	PLU3308	- සමාජ මනෝවිද්‍යාව	- කේ.එම්.එස්. සිල්වා මෙය - යූ.එම්. මාහින්නාගොඩ මෙය
4.	PLU3309	- උපදේශන මනෝවිද්‍යාව හැඳින්වීම	- පී.එල්. ද සොයිසා මෙය
5.	PLU3310	- ජීවවිද්‍යාත්මක මනෝවිද්‍යාව	- එම්.එස්. චාතුර්යා මෙය
6.	PLU3311	- ඥානාත්මක මනෝවිද්‍යාව	- කේ.එම්.එස්. සිල්වා මෙය
7.	PLU4303	- මනෝවිද්‍යාවේ සංඛ්‍යාලේඛන හැඳින්වීම	- එස්.ඒ.එච්.ඩී. ජයතිලක මෙය
8.	PLU4305	- භාෂාව සහ සංජානනය	- එම්.ඩබ්ලිව්.ඩී වික්‍රමරත්න මහතා
9.	PLU4307	-සෞඛ්‍ය මනෝවිද්‍යාව	- ප්‍රදානය කර නැත
10.	PLU4308	-කාර්මික- ආයතනික මනෝවිද්‍යාව	- එම්.ඩබ්ලිව්.ඩී වික්‍රමරත්න මහතා
11.	PLU4309	-මනෝවිද්‍යාවේ පර්යේෂණ ක්‍රම	- ප්‍රදානය කර නැත

4 කොටස - පීඨ වාර්තා

4.0 පීඨ වාර්තා

4.1 අධ්‍යාපන පීඨය

4.1.1 විශ්ලේෂණය



ශ්‍රී ලංකාව තුළ සහ කලාපය තුළ විවෘත සහ දුරස්ථ ඉගෙනුම තුළින් මූලික මානව උත්සාහයක් වශයෙන් අධ්‍යාපනයේ දැනුම සහ වෘත්තීය ව්‍යවහාරයන් වැඩිදියුණු කිරීමේ නායකයා ලෙස කටයුතු කිරීම යන තම තේමාව අනුව යමින් අධ්‍යාපන පීඨය සහතිකපත්‍ර මට්ටමේ සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා පුළුල් පරාසයක වැඩසටහන් ලබා දෙයි. ශ්‍රී ලංකාව තුළ දුරස්ථ ආකාරයට පෙරපාසල් ප්‍රාථමික සහ ද්විතීයික සහ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සම්බන්ධ ගුරුවරුන්ට මූලික සහ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන් ලබා දෙන විශාලම ප්‍රතිපාදකයන් අතරින් එකක් ලෙස දැක්විය හැකියි මෙම විද්‍යා පීඨය තුළින් ලබා දෙන වැඩසටහන් සඳහා ශිෂ්‍යන්ගේ ලියාපදිංචිය එක් අධ්‍යයන වර්ෂයක් සඳහා 7000කට වැඩි වන අතර සමත් වන ප්‍රතිශතය 80% කට ඉහළ අගයකි. අධ්‍යාපන පීඨය තුළ පර්යේෂණ යනු අවශ්‍යම උපාංගයක් වන අතර කාර්ය මණ්ඩලය පර්යේෂණ ව්‍යාපෘති ගණනාවක සක්‍රීය ලෙස දායක වී සිටිති.

අධ්‍යාපන පීඨය වර්තමානයේ පහත සඳහන් අධ්‍යනාංශ 4න් සමන්විත වේ.

1. ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය.
2. මුල් ළමා විය සහ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යනාංශය.
3. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යනාංශය.
4. අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ අධ්‍යනාංශය.

සෑම අධ්‍යනාංශයක්ම ප්‍රධානියා යටතේ පවතින අතර පීඨයේ අධ්‍යයන කටයුතු සඳහා සියලුම දෙපාර්තමේන්තු සාමුහිකව වගකිව යුතු වේ.

4.1.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

වැඩසටහන	අදියර	මාධ්‍යය	නව බඳවාගැනීම්	සම්පූර්ණ කරන ලද
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යනාංශය				
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය B.Ed (SNE)	උපාධි	සිංහල, ඉංග්‍රීසි	109	86
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDSNE)	පශ්චාත් උපාධි	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	42	38
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය	පශ්චාත් උපාධි	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	59	-
ඔටිසම් පිළිබඳ වැඩමුළුව - සිංහල	සහතික පත්‍ර	සිංහල	-	27
පූර්ව ළමා විය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යනාංශය				
පෙරපාසල් අධ්‍යාපන උසස් සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	සිංහල, ඉංග්‍රීසි	21	31
පෙරපාසල් අධ්‍යාපන සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	සිංහල, ඉංග්‍රීසි		205
පූර්ව ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමාව	ඩිප්ලෝමා	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	-	66
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	උපාධි	සිංහල, ඉංග්‍රීසි	1239	-
ද්විතීය හා තෘතීය අධ්‍යාපන අධ්‍යනාංශය				
පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටි පාඨමාලාව - සිංහල	සහතික පත්‍ර	සිංහල	-	22
පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටි පාඨමාලාව - ඉංග්‍රීසි	සහතික පත්‍ර	ඉංග්‍රීසි	-	37
මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	-	-
ඉගෙනීමේ අපහසුතා සහිත දරුවන්ට ඉගැන්වීම පිළිබඳ කෙටි පාඨමාලාව - ඉංග්‍රීසි	සහතික පත්‍ර	ඉංග්‍රීසි	75	-
මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	200	86
අධ්‍යාපනවේදී උපාධිය (ස්වභාවික විද්‍යා)	උපාධි	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	8	17
නාට්‍ය හා රංගකලාව පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	උපාධි	සිංහල	54	45
අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	පශ්චාත් උපාධි	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	3318	-
අධ්‍යාපනපති උපාධිය (Course work)	පශ්චාත් උපාධි	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	351	338
ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	34	72
ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති (ජාත්‍යන්තර) උපාධිය	පශ්චාත් උපාධි		-	06
අධ්‍යාපනපති උපාධිය	පශ්චාත් උපාධි	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	-	19
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	4	-

6 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම - අධ්‍යාපන පීඨය

4.1.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

වැඩසටහන	ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
පෙර පාසල් අධ්‍යාපන සහතිකපත්‍ර පාඨමාලාව	-	38	22
පෙරපාසල් අධ්‍යාපන උසස් සහතිකපත්‍ර පාඨමාලාව	24		
පූර්ව ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමාව	189		
අධ්‍යාපනවේදී උපාධිය	5		
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	1239		
නාට්‍ය හා රංගකලාව පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය	130		
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	288		
අධ්‍යාපනවේදී උපාධිය (ස්වභාවික විද්‍යා)	21		
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	43		
අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	4327		
ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය (ජාත්‍යන්තර වැඩසටහන)	7		
අධ්‍යාපනපති උපාධිය	122		
අධ්‍යාපනපති උපාධිය (Coursework)	365		
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය	97		
ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය	115		
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	5		

7 වගුව: ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය - අධ්‍යාපන පීඨය

4.1.4 මාර්ගගත පාඨමාලා

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
	විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යානාංශය		
SNPA601	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ මනෝවිද්‍යාත්මක පදනම	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA602	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක හා දාර්ශනික පදනම්	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA903	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ විෂයමාලාව උපදෙස් සහ ඇගයීම	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA904	වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය කළමනාකරණය කිරීම	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA605	විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා මාරුවීම්	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA606	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ උපකාරක සහ අනුවර්තන තාක්ෂණයන්	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA608	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ සංඛ්‍යාත්මක පර්යේෂණ	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA609	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ ගුණාත්මක පර්යේෂණ	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5535	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝවිද්‍යාව	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5336	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5237	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5338	සුවිශේෂීතා සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5239	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය තුළ නැගී එන ප්‍රවණතා	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5540	සංසන්දනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනික ගැටළු	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5341	අධ්‍යාපනික මගපෙන්වීම සහ උපදේශනය	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5242	විශේෂ අධ්‍යාපනය (Inclusive Education)	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
SNU5343	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ මිනුම් සහ ඇගයීම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5244	විෂයමාලා න්‍යාය සහ පුහුණුව	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNE5546	විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා හොඳම අධ්‍යාපනික වටපිටාව නිර්මාණය කිරීම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNE5247	ඇතුළත් වූ පංති පන්ති කාමරය තුළ ළමුන්ගේ ගැටළු පිළිබඳ කටයුතු කිරීම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6620	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික තාක්ෂණය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6221	ප්‍රාථමික අධ්‍යාපනය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6822	ව්‍යාපෘතිය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6223	ළමා අයිතිවාසිකම්	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6224	අධ්‍යාපනික කළමනාකරණය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6225	පුනරුත්ථාපනය සහ ප්‍රජා පාදක පුනරුත්ථාපනය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6826	ගුරු පුහුණුව	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNE6546	ඇතුළත් වූ පන්ති කාමරය තුළ ළමුන් සඳහා විෂයමාලා සංවර්ධනය හා අනුවර්තනය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8530	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝවිද්‍යාව	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8531	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8532	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික තාක්ෂණය	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8333	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ මිනුම් සහ ඇගයීම	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8334	සුවිශේෂීතා සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8335	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8336	අධ්‍යාපනය තුළ නැඟී එන ප්‍රවණතා	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8237	පුනරුත්ථාපනය සහ ප්‍රජා පාදක පුනරුත්ථාපනය	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8338	අධ්‍යාපනික මගපෙන්වීම සහ උපදේශනය	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNE8839	ගුරු පුහුණුව	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය			
	අධ්‍යාපනපති උපාධිය	9	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
	ගුරු අධ්‍යාපනපති උපාධිය	9	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
	අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යනාංශය			
EPU3530	ළමා සංවර්ධනය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3331	මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනයේ යථාදර්ශනය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3532	විෂයමාලා අධ්‍යයන සහ ප්‍රායෝගික භාෂා අධ්‍යයන (සිංහල/ දෙමළ/ඉංග්‍රීසි)	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3533	විෂයමාලා අධ්‍යයන සහ ප්‍රායෝගික යෙදුම - ගණිතය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3234	විෂයමාලා අධ්‍යයන සහ ප්‍රායෝගික යෙදුම - සෞන්දර්යාත්මක සහ නිර්මාණාත්මක අධ්‍යයනය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3235	විෂයමාලා අධ්‍යයන සහ ප්‍රායෝගික යෙදුම - පාරිසරික අධ්‍යයනය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3236	විෂයමාලා අධ්‍යයන සහ ප්‍රායෝගික යෙදුම - සෞඛ්‍ය පෝෂණය සහ ආරක්ෂිත පියවර	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3337	පූර්ව ප්‍රාථමික සහ ප්‍රාථමික ඉගැන්වීමේ ඒකාබද්ධ ප්‍රවේශය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3338	මුල් ළමාවිය ආයතන සහ ප්‍රාථමික පාසල් නිර්මාණය කිරීම හා සැලසුම් කිරීම	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU4531	ඉගැන්වීමේ සහ ඉගෙනීමේ යථාදර්ශනය	4	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU4532	මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනයේ ක්ෂේත්‍ර පුහුණුව	4	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
EPU4533	මුල් ළමාවිය සහ ප්‍රාථමික වසර ගැලපීමේ ගැටළු	4	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU4334	ඉගෙනුම් (Reflective Learning)	4	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU4235	නිවස - පාසල - ප්‍රජා සම්බන්ධතාවය	4	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU4236	මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරුන්ගේ වෘත්තීය භූමිකාව	4	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU5550	ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික මනෝවිද්‍යාව	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU5551	ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපනයේ පදනම්	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU5552	ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික තාක්ෂණය	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU5353	ප්‍රාථමික ඉගැන්වීම සඳහා ගණිතය	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU5354	ප්‍රාථමික ඉගැන්වීම සඳහා සෞන්දර්ය	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU5255	ප්‍රාථමික ඉගැන්වීම සඳහා විද්‍යාව සහ පරිසරය	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU5256	ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ළමා අයිතිවාසිකම්	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU6230	ප්‍රාථමික පාසල් තුළ විශේෂ අධ්‍යාපනය (Inclusive Education)	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU6231	ප්‍රාථමික පාසල් තුළ මගපෙන්වීම සහ උපදේශනය	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU6332	ප්‍රාථමික අධ්‍යාපනයේ සමකාලීන ගැටළු	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU6533	ප්‍රාථමික අධ්‍යාපනය ඇගයීම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU6234	ප්‍රාථමික පන්ති කාමරය කළමනාකරණය	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
අධ්‍යාපනික නායකත්ව හා කළමනාකරණ අධ්‍යනාංශය			
	පාසල් කළමනාකරණය පිළිබඳ කෙටි පාඨමාලාව		සිංහල/ දෙමළ/ඉංග්‍රීසි

8 වගුව : මාර්ගගත පාඨමාලා - අධ්‍යාපන පීඨය

4.2 ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.1 විශ්ලේෂණය



ඉංජිනේරු තාක්ෂණ පීඨය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන පීඨ 6 අතුරින් එක් පීඨයක් වේ. පීඨයේ පරිපාලන හා අධ්‍යයන ප්‍රධානියා පීඨාධිපති වන අතර, වර්තමානයේ ආචාර්ය. එච්.ජී.පී.ඒ රත්නවීර මහතා 2021 ජූලි 07 වන දින සිට පීඨාධිපති ලෙස කටයුතු කරයි. කේ. විජිකුමාර් මහතා 2021 අප්‍රේල් 23 වන දින පීඨයේ සහකාර ලේඛකාධිකාරී ලෙස වැඩ භාර ගන්න ලදි.

පීඨය පහත සඳහන් අධ්‍යයනාංශ 6න් සමන්විත වේ.

1. කෘෂිකාර්මික හා වැවිලි ඉංජිනේරු විද්‍යාවෝ
   ආචාර්ය. ඒ.ජී.බී අරුගොඩ (අධ්‍යනාංශ ප්‍රධානී)

2. සිවිල් ඉංජිනේරුෝ
   මහාචාර්ය. ටී.එම්. පල්ලෙවත්ත (අධ්‍යනාංශ ප්‍රධානී)

3. විදුලි හා පරිගණක ඉංජිනේරුෝ
   2022/08/07 දක්වා ආචාර්ය.ඩී.ඩී.එම් රණසිංහ (අධ්‍යනාංශ ප්‍රධානී)
   2022/08/08 දින සිට එච්. පැස්කුවල් මහත්මිය පත් කර ඇත. (අධ්‍යනාංශ ප්‍රධානී)

4. ගණිත හා ඉංජිනේරු විද්‍යාවේ දර්ශණය
   ජී. නන්දසේන මහතා (අධ්‍යනාංශ ප්‍රධානී)

5. යාන්ත්‍රික ඉංජිනේරුෝ
   ආචාර්ය. අයි.යූ. අත්තනායක (අධ්‍යනාංශ ප්‍රධානී)

6. පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණයෝ
   ආචාර්ය. ඩී.එස්. විජේරත්න මහත්මිය (අධ්‍යනාංශ ප්‍රධානී)

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සනාතන සභාවේ අධීක්ෂණය යටතේ පීඨයේ සියලුම අධ්‍යයන ක්‍රියාකාරකම් ඉංජිනේරු තාක්ෂණ පීඨයයේ පීඨ මණ්ඩලය විසින් පාලනය කරනු ලබයි.

අධ්‍යයන වැඩසටහන්

තාක්ෂණවේදී (BTech Hons) උපාධි වැඩසටහන කෘෂිකාර්මික හා වැවිලි, සිවිල්, විදුලි, මෙකාට්‍රොන්ක්ස්, යාන්ත්‍රික, පරිගණක, ඉලෙක්ට්‍රොනික්ස් සහ විදුලි සංදේශනය සහ පේෂකර්ම සහ ඇඟළුම් ඉංජිනේරු විද්‍යාව යන විෂයන්හි විශේෂීකරණයන් සඳහා පිරිනමනු ලැබේ. කෘෂිකර්මය, රෙදිපිළි තාක්ෂණය සහ කළමනාකරණය, මෝස්තර නිර්මාණ සහ නිපැයුම් ප්‍රවර්ධනය සහ පේෂකර්ම නිෂ්පාදනය සඳහා කර්මාන්ත අධ්‍යයනවේදී අධ්‍යයන වැඩසටහන පිරිනමනු ලබයි. තොරතුරු තාක්ෂණ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය විසින් මෘදුකාංග ඉංජිනේරුවේදී උපාධි පාඨමාලාව පවත්වනු ලබයි.

ඉංජිනේරු තාක්ෂණවේදී සහ කර්මාන්ත අධ්‍යයනවේදී උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වී ඉගෙනුම ලබන ශිෂ්‍යයින්ට අදාල අවශ්‍යතා සම්පූර්ණ කර උසස් ඩිප්ලෝමාවක් ලබා ගැනීමට හැකි වේ. පීඨය විසින් පේෂකර්ම තාක්ෂණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාවක් පිරිනමනු ලබයි.පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් තොරව, අධ්‍යයන පාඨමාලාවකට ඇතුළත් වීමෙන් තොරව, කේවල පාඨමාලා ලෙස පාඨමාලා ඒකක අගය උපරිම 18ක් වන ලෙස තබා ගැනීමට ඉගෙනුම ලබන්නන්ට අවසර ලැබේ.

පීඨය මගින් පිරිනමනු ලබන වැඩසටහන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අතර ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශවල දක්වා ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කර ඇත. අපගේ උපාධිධාරීන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල මෙන්ම විදෙස් රටවල ද සාර්ථකව කටයුතු කරයි. ඇතැම් ශිෂ්‍යයින් දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි පාඨමාලා ද හදාරා ඇත. වර්තමානයේ, අපගේ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධි පාඨමාලාව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් එහි පිළිගැනීම සඳහා නැවත ඇගයීමට ලක් කෙරෙමින් පවතී. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය වරලත් ඉංජිනේරුවෙකු වීමට වෘත්තීය මගපෙන්වීම සිදු කරන අතර සාමාජිකත්වය (Associate membership) වෙත අයදුම් කිරීම සඳහා අ.පො.ස. උසස් පෙළ විභාගයේදී ගණිත අංශයෙන් අවම වශයෙන් C සාමාර්ථ 2ක් සහ S සාමාර්ථ 1ක් එක් වරක් පෙනී සිටීමෙන් ලබා තිබිය යුතු ය.

පීඨය විසින් වසරක බලශක්ති කළමනාකරණපති උපාධි පාඨමාලාවක් (යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යනාංශය විසින් පිරිනමනු ලබන) සහ කර්මාන්ත ඉංජිනේරු විද්‍යා සහ ව්‍යූහාත්මක ඉංජිනේරු විද්‍යාව (සිවිල් ඉංජිනේරු අධ්‍යනාංශය විසින් පිරිනමනු ලබන) යන වසර 2ක විද්‍යාපති උපාධි පාඨමාලා පිරිනමනු ලබයි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය දර්ශනපති උපාධි පාඨමාලා සහ දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධිය සඳහා ද ශිෂ්‍යයින් බඳවා ගනු ලැබේ.

පීඨය තම අධ්‍යයන පාඨමාලා විවෘත හා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදය හරහා පිරිනමනු ලබන අතර අධ්‍යයන කටයුතු සම්බන්ධීකරණය ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් ස්ථීර අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ බාහිර අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. සංශෝධිත විෂය මාලා ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයෙහි කොටසක් වශයෙන් පාඨමාලා ද්‍රව්‍ය සංශෝධනය කිරීමේදි සියලුම අධ්‍යනාංශ විශාල උනන්දුවක් දැක්වී ය. තවද, පාඨමාලා මාර්ගගත ක්‍රමවේදය හරහා පිරිනැමීම වෙනුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉතා උනන්දුවක් දක්වන ලදි.

පීඨය විසින් සියලුම පාඨමාලා සඳහා මාර්ගගත ප්‍රවේශය ලබා දීමට ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS) MOODLE භාවිත කරනු ලබයි. ස්වයං අධ්‍යයනය, කණ්ඩායම් වශයෙන් අධ්‍යයනය කිරීම (සාමූහික අධ්‍යයනය) සහ අධ්‍යයන ක්‍රියාකරකම් නියමිත කාලයේදී අවසන් කිරීම සිසුන්ගේ සාර්ථකත්වය සහතික කිරීම සඳහා වැදගත් වේ. පාඨමාලා පිරිනැමීමේ ප්‍රධාන ක්‍රමවේදය වන්නේ ස්වයං-අධ්‍යයන පාඨමාලා ද්‍රව්‍ය හරහා පිරිනැමීම වේ. ඉදිරි කටයුතු පවත්වාගෙන යාම සඳහා කාර්ය සාධනය පිළිබඳ ප්‍රතිචාර සහ අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් විසින් ලබා දෙනු ලබයි. අධ්‍යයන වර්ෂය තුළ වීඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමවේදය හරහා අන්තර් ක්‍රියාකාරී සැසි ලෙස පවත්වනු ලබන දින පාසල් වෙත ශිෂ්‍යයින් සහභාගී වීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මාර්ගගත විභාග පවත්වනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව පීඨය කටයුතු කරනු ලබයි.

4.2.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනිපුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

වැඩසටහන	අදියර	මාධ්‍යය	නව බඳවාගැනීම්	සම්පූර්ණ කළ
ඉංජිනේරු ඇඳීම් සඳහා AutoCAD ඵලදායී භාවිතය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	152	175
ව්‍යාත්තීය වෙබ් නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	60	-
ග්‍රැෆික් නිර්මාණ පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	105	34
Revit ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	44	24
ඇඟළුම් තාක්ෂණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි සිංහල දෙමළ	46	-
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කේවල පාඨමාලා	සහතික පත්‍ර	ඉංග්‍රීසි සිංහල දෙමළ	04	
තොරතුරු පද්ධති හා තාක්ෂණ ඩිප්ලෝමාව	ඩිප්ලෝමා	ඉංග්‍රීසි	-	02
කර්මාන්ත අධ්‍යයනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව	ඩිප්ලෝමා	ඉංග්‍රීසි	-	24
තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව	ඩිප්ලෝමා	ඉංග්‍රීසි	-	124
ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය	උපාධි	ඉංග්‍රීසි	720	244
කර්මාන්ත අධ්‍යයනවේදී (ගෞරව) උපාධිය	උපාධි	ඉංග්‍රීසි	341	84
මෘදුකාංග ඉංජිනේරුවේදී උපාධිය	උපාධි	ඉංග්‍රීසි	2342	13
තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	-	01
බලශක්ති කළමනාකරණපති උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	79	107
තාක්ෂණපති උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	-	01
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	02	03

09 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනිපුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම - ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

වැඩසටහන	ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
ඇඟළුම් තාක්ෂණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	57	88	71
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කේවල පාඨමාලා	5		
කර්මාන්ත අධ්‍යයනවේදී (ගෞරව) උපාධිය	1052		
මෘදුකාංග ඉංජිනේරුවේදී උපාධිය	2509		
තාක්ෂණවේදී උපාධිය (ඉංජිනේරු විද්‍යාව)	2782		
ඉදිකිරීම් කළමනාකරණ පශ්චාත් උපාධිය	01		
බලශක්ති කළමනාකරණපති උපාධිය	83		
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	14		

10 වගුව: ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය- ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.4 නව පාඨමාලා/ වැඩසටහන්

පාඨමාලාව/ වැඩසටහන	මාධ්‍යය	අදියර
චක්‍රීය ආර්ථිකය සඳහා බලශක්තිය පිළිබඳ විද්‍යාපති උපාධිය	ඉංග්‍රීසි	10
කර්මාන්ත ඉංජිනේරුවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය	ඉංග්‍රීසි	10
භූ තාක්ෂණික සැලසුම් නිර්මාණය	ඉංග්‍රීසි	07
පාරිසරික ඉංජිනේරු නිර්මාණය	ඉංග්‍රීසි	07
ඉංජිනේරු පර්යේෂණ ව්‍යාපෘතිය	ඉංග්‍රීසි	07
අධිවේගී මාර්ග ඉංජිනේරුවේදය සහ සැලසුම්	ඉංග්‍රීසි	07

11 වගුව : නව පාඨමාලා/ වැඩසටහන් - ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.5 මාර්ගගත පාඨමාලා

පාඨමාලා කේතය	නම	අදියර	මාධ්‍යය
පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණ අධ්‍යනාංශය			
TAX6367	උසස් වර්ණ ගැන්වීම	6	ඉංග්‍රීසි
TAY7880	ඉංජිනේරු විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය (පේෂකර්ම සහ ඇඟලුම් පිළිබඳ ඉංජිනේරු විද්‍යාව)	7	ඉංග්‍රීසි
TAM6457	මෝස්තර අලෙවිකරණය	6	ඉංග්‍රීසි
TAZ2587	පේෂකර්ම තාක්ෂණය සඳහා ගණිතය සහ විද්‍යාව	2	ඉංග්‍රීසි සහ සිංහල
TAX3458	තන්තු විද්‍යාව සහ තාක්ෂණය	3	ඉංග්‍රීසි
TAY2690	උසස් සහතික පත්‍ර ව්‍යාපෘතිය	2	ඉංග්‍රීසි සහ සිංහල
TAY6883	පර්යේෂණ ව්‍යපෘතිය (රෙදිපිළි නිෂ්පාදනය)	6	ඉංග්‍රීසි
TAY6882	පර්යේෂණ ව්‍යපෘතිය (ඇඟලුම් නිෂ්පාදනය)	6	ඉංග්‍රීසි
ZYU3500	සත්ව ජීව කාලය සහ විවිධත්වය (පරිපූරක මාර්ගගත)	3	ඉංග්‍රීසි
ZYU3301	ජීව භූගෝල විද්‍යාව (පරිපූරක මාර්ගගත)	3	ඉංග්‍රීසි
ZYU4301	සත්ව සංයුතිය සහ ක්‍රියාකාරිත්වය (පරිපූරක මාර්ගගත)	4	ඉංග්‍රීසි
ZYU4301	පරිසර විද්‍යාව (පරිපූරක මාර්ගගත)	4	ඉංග්‍රීසි
ZYU4302	සත්ව සංවර්ධනය (පරිපූරක මාර්ගගත)	4	ඉංග්‍රීසි
ZYU4303	සත්ව චර්යාව (පරිපූරක)	4	ඉංග්‍රීසි
ZYU5300	ජලජ ජීව විද්‍යාව (පරිපූරක මාර්ගගත)	5	ඉංග්‍රීසි
ZYU5302	ජෛව විවිධත්වය සංරක්ෂණය සහ කළමනාකරණය (පරිපූරක මාර්ගගත)	5	ඉංග්‍රීසි
ZYU5303	පාරිසරික විෂ විද්‍යාව (පරිපූරක මාර්ගගත)	5	ඉංග්‍රීසි
ZYU5304	පරපෝෂිත විද්‍යාව (පරිපූරක මාර්ගගත)	5	ඉංග්‍රීසි
ZYU5305	මානව ජීව විද්‍යාව (පරිපූරක මාර්ගගත)	5	ඉංග්‍රීසි

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
ZYU5306	කීට විද්‍යාව (පරිපූරක මාර්ගගත)	5	ඉංග්‍රීසි
ZYU5307	ක්ෂීරපායී ජීව විද්‍යාව (පරිපූරක මාර්ගගත)	5	ඉංග්‍රීසි
ZYU5308	සත්ව විද්‍යා ව්‍යාපෘතිය (පරිපූරක මාර්ගගත)	5	ඉංග්‍රීසි
ZYU5309	ප්‍රාග් ඓතිහාසික ජීව විද්‍යාව (පරිපූරක මාර්ගගත)	5	ඉංග්‍රීසි
ZYU53011	සත්ව විද්‍යාව පිළිබඳ ලිට් සමාලෝචනය	5	ඉංග්‍රීසි
ZYU5313	පර්යේෂණ ක්‍රමවේදය සහ සන්නිවේදන කුසලතා (මාර්ගගතව මිශ්‍ර කර ඇත)	5	ඉංග්‍රීසි
ZYU6303	අණුක ජීව විද්‍යාව (පරිපූරක මාර්ගගත)	6	ඉංග්‍රීසි
ZYU6306	උසස් පක්ෂි විද්‍යාව (පරිපූරක මාර්ගගත)	6	ඉංග්‍රීසි
ZYU6908	සත්ව විද්‍යාව පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය (පරිපූරක මාර්ගගත)	6	ඉංග්‍රීසි
ZYU6310	වනජීවී කළමනාකරණය සහ සංරක්ෂණය (පරිපූරක මාර්ගගත)	6	ඉංග්‍රීසි
ZYU6311	සත්ව විද්‍යාවේ විශේෂ මාතෘකා (පරිපූරක මාර්ගගත)	6	ඉංග්‍රීසි
ZYP8301	වෛද්‍ය සහ පශු වෛද්‍ය වැදගත්කමේ ආත්‍රපෝඩාවන් (ඔන්ලයින් මිශ්‍ර කර ඇත)	8	ඉංග්‍රීසි
ZYP8603	මානව පරපෝෂිතයන් (ඔන්ලයින් මිශ්‍ර)	8	ඉංග්‍රීසි
ZYP8603	ප්‍රතිශක්ති විද්‍යාව සහ අණුක ජීව විද්‍යාව පිළිබඳ හැඳින්වීම (සම්බන්ධිත ඔන්ලයින්)	9	ඉංග්‍රීසි
ZYP9304	ධාරක පරපෝෂිත අන්තර්ක්‍රියා (මාර්ගගතව මිශ්‍ර කර ඇත)	9	ඉංග්‍රීසි
ZYP9605	වසංගත රෝග විද්‍යාව සහ වාහක බෝවන රෝග පාලනය (පරිපූරක මාර්ගගත)	9	ඉංග්‍රීසි
	ගණිත විද්‍යා අධ්‍යනාංශය		
ADU3300	දෛශික වීජ ගණිතය	3	සිංහල, දෙමළ ඉංග්‍රීසි
ADU3201/ADU3218	මූලික සංඛ්‍යා ලේඛන	3	සිංහල, දෙමළ ඉංග්‍රීසි
ADU3302	අවකල සමීකරණ	3	සිංහල, දෙමළ ඉංග්‍රීසි
PEU3300	ගණිතමය තර්කය සහ ගණිතමය සාක්ෂි	3	සිංහල, දෙමළ ඉංග්‍රීසි
PEU3301	ගණිතයේ පදනම්	3	සිංහල, දෙමළ ඉංග්‍රීසි
PEU3202	දෛශික අවකාශයන්	3	සිංහල, දෙමළ ඉංග්‍රීසි
ADU4300	සංඛ්‍යානමය බෙදාහැරීමේ න්‍යාය	4	ඉංග්‍රීසි
ADU4301	නිව්ටෝනියානු යාන්ත්‍ර විද්‍යාව I	4	ඉංග්‍රීසි
ADU4302	දෛශික ගණනය	4	ඉංග්‍රීසි
ADU4303	ව්‍යවහාරික රේඛීය වීජ ගණිතය සහ අවකල සමීකරණ	4	ඉංග්‍රීසි
PEU4300	සැබෑ විශ්ලේෂණය I	4	ඉංග්‍රීසි
PEU4301	සැබෑ විශ්ලේෂණය II	4	ඉංග්‍රීසි
PEU4302	රේඛීය වීජ ගණිතය	4	ඉංග්‍රීසි
PEU4303	කණ්ඩායම් න්‍යාය I	4	ඉංග්‍රීසි
PEU4315	අඛණ්ඩ කාර්යයන්	4	ඉංග්‍රීසි
PEU4316	වෙනස් කළ හැකි කාර්යයන්	4	ඉංග්‍රීසි
ADU5318	ජෛව සංඛ්‍යා ලේඛන	5	ඉංග්‍රීසි
ADU5319	අත්හදා බැලීම් සැලසුම් කිරීම සහ විශ්ලේෂණය කිරීම	5	ඉංග්‍රීසි
ADU5320	MATLAB මෘදුකාංගය හැඳින්වීම	5	ඉංග්‍රීසි
ADU5300	රේඛීය වැඩසටහන්කරණය	5	ඉංග්‍රීසි
ADU5301	ප්‍රතිගාමී විශ්ලේෂණය I	5	ඉංග්‍රීසි
ADU5302	ගණිතමය ක්‍රම	5	ඉංග්‍රීසි
ADU5305	සංඛ්‍යාන අනුමානය	5	ඉංග්‍රීසි
ADU5307	සංඛ්‍යාත්මක ක්‍රම	5	ඉංග්‍රීසි
ADU5308	ප්‍රස්තාර න්‍යාය	5	ඉංග්‍රීසි
ADU5615	ගණිතය පිළිබඳ ව්‍යාපෘතිය	5	ඉංග්‍රීසි
PEU5300	රීමන් ඒකාබද්ධ කිරීම	5	ඉංග්‍රීසි
PEU5301	න්‍යාය (Ring Theory)	5	ඉංග්‍රීසි
PEU5302	සංයෝජන	5	ඉංග්‍රීසි
PEU5303	සංඛ්‍යා න්‍යාය	5	ඉංග්‍රීසි
PEU5304	සංකීර්ණ විශ්ලේෂණය සඳහා හැඳින්වීම	5	ඉංග්‍රීසි
PEU6304	ක්‍රියාකාරී විශ්ලේෂණය	6	ඉංග්‍රීසි

5 කොටස - පර්යේෂණ සහ ප්‍රකාශන

5.0 පර්යේෂණ හා ප්‍රකාශන

5.1 පර්යේෂණ ව්‍යාපෘති/ පත්‍රිකා

පීඨය/ මධ්‍යස්ථානය	අධ්‍යනාංශය	පර්යේෂණ ව්‍යාපෘති	ප්‍රකාශිත පත්‍රිකා	ඉදිරිපත් කළ පත්‍රිකා
අධ්‍යාපන	විශේෂ අවශ්‍යතා අධ්‍යාපන		01	
	පූර්ව ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන		02	03
	ද්විතීය සහ තෘතීය අධ්‍යාපන		18	01
	අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ		05	
ඉංජිනේරු තාක්ෂණ	කෘෂිකාර්මික හා වැවිලි ඉංජිනේරු	03		
	සිවිල් ඉංජිනේරු	90		
	විදුලි සහ පරිගණක ඉංජිනේරු		08	16
	ඉංජිනේරු විද්‍යා ගණිතය හා දර්ශනය		03	
	යාන්ත්‍රික ඉංජිනේරු		05	
	පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය	04		03
සෞඛ්‍ය විද්‍යා	මූලික විද්‍යා	02	09	06
	වෛද්‍ය රසායනාගාර විද්‍යා	01	05	04
	හෙද විද්‍යා	-	04	15
	ඖෂධ විද්‍යා	-	04	-
	මනෝවිද්‍යා හා උපදේශන	02	04	06
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	භාෂා අධ්‍යයන	01	06	03
	නීති අධ්‍යයන		18	10
	සමාජ අධ්‍යයන		01	02
	ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම්	09	04	
කළමනාකරණ අධ්‍යයන	මානව සම්පත් කළමනාකරණය		04	10
	අලෙවිකරණ කළමනාකරණ			05
	සංවිධාන අධ්‍යයන		06	01
	ගිණුම්කරණ හා මූල්‍ය		03	01
ස්වභාවික විද්‍යා	උද්භිද විද්‍යා		12	05
	රසායන විද්‍යා		36	
	පරිගණක විද්‍යා		05	
	ගණිතය		04	07
	භෞතික විද්‍යා	02	20	13
	සත්ව විද්‍යා	04	16	17
අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය			06	02
ප්‍රාදේශීය අධ්‍යාපන සේවා			05	04
පුස්තකාලය				

28 වගුව : පර්යේෂණ ව්‍යාපෘති / පත්‍රිකා

**ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඉංග්‍රීසි මාධ්‍යයෙන් සඳහන් කොටසෙහි ඇමුණුම්වල දක්වා ඇත

5.2 ග්‍රන්ථ/පේටන්ට්

පීඨය/ මධ්‍යස්ථානය	පොත්වල පරිච්ඡේද	සම්පූර්ණ පොත්
අධ්‍යාපන	1	
ඉංජිනේරු තාක්ෂණ	11	1
සෞඛ්‍ය විද්‍යා	-	-
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	4	3
කළමනාකරණ අධ්‍යයන	4	
ස්වභාවික විද්‍යා	7	1
පුස්තකාලය		

29 වගුව : ග්‍රන්ථ / පේටන්ට්

5.3 සම්මාන

පීඨය/ මධ්‍යස්ථානය	විශ්වවිද්‍යාල සම්මාන	ජාතික සම්මාන	ජාත්‍යන්තර
අධ්‍යාපන	5		
ඉංජිනේරු තාක්ෂණ	3		
සෞඛ්‍ය විද්‍යා	1	-	1
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	1		1
කළමනාකරණ අධ්‍යයන	1		
ස්වභාවික විද්‍යා	5	2	
අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය			
ප්‍රාදේශීය අධ්‍යාපන සේවා			

30 වගුව : සම්මාන

6 කොටස – මධ්‍යස්ථාන හා ඒකක

6.0 මධ්‍යස්ථාන හා ඒකක

6.1 ප්‍රාදේශීය අධ්‍යාපන සේවා



රූපසටහන 1: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශිය සහ අධ්‍යයන මධ්‍යස්ථාන

ප්‍රාදේශීය අධ්‍යාපන සේවා යනු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ඒකකයක් ලෙස සැලකේ.

අනෙකුත් බොහෝ රාජ්‍ය විශ්වවිද්‍යාල ක්‍රමානුකූලව ක්‍රියාත්මක වන අතර විවෘත විශ්වවිද්‍යාලය පුරෝගාමී විවෘත දූරස්ථ ඉගෙනුම් විශ්වවිද්‍යාලයක් ලෙස සියළුම පුරවැසියන් සඳහා උසස් අධ්‍යාපන පහසුකම් පිරිනැමීම සඳහා දිවයින පුරා විහිදී ඇති ජාලයක් සමඟින් ක්‍රියාත්මක වේ.

අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම සහ යාව-ජීව අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අපේක්ෂා කරන්නන් සඳහා විශ්වවිද්‍යාලයීය පීඨ 6 සඳහා අවශ්‍ය පුළුල් සහයෝගය ලබා දීම ප්‍රාදේශීය අධ්‍යාපන සේවා විසින් සිදු කරනු ලබයි.

කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය නාවල මධ්‍යම මණ්ඩපයෙහි පිහිටා ඇති අතර අනෙකුත් මධ්‍යස්ථාන 8 අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, යාපනය, මහනුවර, කුරුණෑගල, මාතර සහ රත්නපුර නගරවල පිහිටා ඇත. මීට අමතරව, විශ්වවිද්‍යාලය දිවයින පුරා අධ්‍යයන මධ්‍යස්ථාන 19කින් සමන්විත වේ. මෙම මධ්‍යස්ථාන ජාලය ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම පාහේ විහිදී පවතී. සෑම පළාතක්ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය මධ්‍යස්ථාන 9ක් පිහිටුවා ඇත. (රූපසටහන 1) වැඩිම ශිෂ්‍යයින් සංඛ්‍යාවක් කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙහි සිටින අතර දෙවන වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාව මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය සතු වේ.

ප්‍රාදේශීය අධ්‍යාපන සේවාවෙහි කාර්යභාරය

අධ්‍යයන වැඩසටහන් පිරිනැමීම සඳහා ප්‍රාදේශීය අධ්‍යාපන සේවා අංශය විසින් සහාය උපකාරක සේවා ගණනාවක් සපයනු ලබයි.තොරතුරු සැපයීම, අයදුම්පත් එක් රැස් කර ඉදිරිපත් කිරීම, සිසුන්ගේ ලියාපදිංචිකිරීම් හා නැවත ලියාපදිංචි කිරීම් කටයුතු සිදු කිරීම, සිසුන් සඳහා උපදේශන කටයුතු, පාඨමාලා ද්‍රව්‍ය බෙදා හැරීම, දින පන්ති/ ප්‍රායෝගික පන්ති සම්බන්ධීකරණය කිරීම හා අඛණ්ඩ ඇගයීම් මෙන්ම අවසන් විභාග පැවැත්වීම එම සේවාවන්වලින් කිහිපයක් වේ. මෙම දෛනික කාර්යයන්ට අමතරව, වර්තමාන වසංගත තත්ත්වය හමුවේ ප්‍රාදේශීය අධ්‍යාපන සේවය විසින් වෙනත් රාජ්‍ය විශ්වවිද්‍යාල වැනි බාහිර ආයතන සඳහා තම අධ්‍යයන ක්‍රියාකාරකම් සිදු කිරීම වෙනුවන් තම සේවාවන් පුළුල් කර ඇත.

2022 වර්ෂයේ වැදගත් සිදුවීම්

පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය, මහජන විරෝධතාවලට හේතු වන මතුව ඇති ආර්ථික හා දේශපාලන අර්බුධ සහ සැපයුම් දාම කළමනාකරණයෙහි ඇති වූ බාධාවන් සමඟ රට තුළ උද්ගත වූ තත්ත්වය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ක්‍රියාකාරකම් සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා දැඩි බලපෑම් එල්ල කරන ලදි. කෙසේ වෙතත්, සියළුම බාධාවන් මධ්‍යයෙහි 2022 වර්ෂය තුළ සිදු වූ විශේෂ අවස්ථා කිහිපයක් දක්නට ලැබුණි.

- යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා වන නව පස් මහල් ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කිරීම හා විවෘත කිරීම.
- රජය විසින් ලබා දෙන ලද ගොඩනැගිලි සමඟ අත්පත් කරගත් නව ඉඩමේ කිලිනොච්චි අධ්‍යයන මධ්‍යස්ථානය පුළුල් කිරීම.
- ශිෂ්‍යයින් විශාල සංඛ්‍යාවක් සහ ඔවුන්ගේ දෙමව්පියන්ගේ සහභාගීත්වයෙන් “The open day” ප්‍රවර්ධන වැඩසටහන සාර්ථකව ප්‍රදේශීය අධ්‍යාපන සේවාවේ ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථානවල සාර්ථකව පවත්වන ලදි.
- ප්‍රාදේශීය අධ්‍යාපන සේවා විසින් පවත්වන ලද ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යා ප්‍රජාව සහ ශිෂ්‍යයින් අතර දැනුවත් කිරීමේ අරමුණ ඇතිව RES e-magazine – “OURESTalk” ප්‍රථම වරට ආරම්භ කරන ලදි.

6.2 පුස්තකාලය





ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය පුස්තකාල 09කින් සමන්විත වේ. ප්‍රධාන පුස්තකාලය නාවල ප්‍රධාන විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පිහිටා ඇති අතර ප්‍රාදේශීය පුස්තකාල 08ක්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය මධ්‍යස්ථාන වන අනුරාධපුරය, බදුල්ල, මඩකළපුව, යාපනය, මහනුවර, කුරුණෑගල, මාතර සහ රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානවල පිහිටා ඇත.

ප්‍රධාන පුස්තකාලයට අයත් ග්‍රන්ථ එකතුව 106,308ක් වන අතර 2022 වර්ෂය තුළ ප්‍රධාන පුස්තකාලයට මුද්‍රිත හා විද්‍යුත් ආකෘතියෙන් ග්‍රන්ථ 1325ක් එක් කරන ලදි. මුළු වාර සඟරා- මුද්‍රිත සහ විද්‍යුත් යන දෙකෙන්ම 26ක් සහ ශ්‍රව්‍ය- දෘශ්‍ය සම්පත් 2396ක් වේ.

නවතම පනත්, ඒකාබද්ධ ව්‍යවස්ථාදායක පනත්, සංශෝධන පනත්, නව නීති වාර්තා (NLR), ශ්‍රී ලංකා නීති වාර්තාවල (SLLR) සම්පූර්ණ අන්තර්ගතයන් සමන්විත 2022 නීති ලංකා දත්ත ගබඩාවට දායක වීම අඛණ්ඩව සිදු කරගෙන යාමට පුස්තකාලයට හැකි විය. UGC consortia හරහා Emerald සහ Oxford Academic දත්ත ගබඩා 02 වෙත ප්‍රවේශය ලබා දීම. මීට අමතරව, විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ ඉගැන්වීම්, ඉගෙනුම් සහ පර්යේෂණ ක්‍රියාකාරකම්වලට සහාය දක්වන නොමිලේ ප්‍රවේශ විය හැකි අන්තර්ජාලය පාදක කරගත් දත්ත ගොනු කිහිපයක් තිබේ. පසුගිය ප්‍රශ්න පත්‍රවල ඩිජිටල් එකතුවක්, පර්යේෂණ ලිපි සමූහයක්, නිබන්ධන එකතුවක්, විශ්වවිද්‍යාලයීය ප්‍රකාශන සහ විවෘත අධ්‍යාපන සම්පත් ආදීයෙන් මෙම දත්ත ගොනු සමන්විත වේ. මෙම සියළුම මාර්ගගත සම්පත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය Web Portal (http://lib.ou.ac.lk/) හරහා ප්‍රවේශ විය හැකි ය.

පරිශීලකයින් සඳහා උසස් පුස්තකාල සේවාවක් ලබා දීමේ අපේක්ෂාව ඇතිව යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පුස්තකාලයනව ගොඩනැගිල්ලක් වෙත මාරු කෙරිණ.

6.3 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය




ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යයන සහ පරිපාලන වැඩකටයුතු සඳහා සහාය ලබා දීම අරමුණු කරගෙන පිහිටුවන ලදි. විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සේවකයින් ලෙස රාජකාරී කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය වන කුසලතා සහ නිපුණත්වය වැඩි දියුණු කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පහසුකම් සපයනු ලබයි. අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන ඇතුළු සියලුම කාණ්ඩවල කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා වෘත්තීය සංවර්ධන ක්‍රියාකාරකම් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබයි. මෙහිදී පවත්වන වැඩසටහන් හා වැඩමුළු මගින් රාජකාරී හා සම්බන්ධ හැකියාවන් මෙන්ම පුද්ගලික සංවර්ධනය ද ආවරණය කිරීම සිදු වේ.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධානතම වැඩසටහන වන්නේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පරිවාස කථිකාචාර්යවරුන් සඳහා පවත්වනු ලබන උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් වැඩසටහනක් වන උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සියලුම පරිවාස කථිකාචාර්යවරුන් විසින් තම පත්වීම ස්ථිර කිරීම සඳහා සාර්ථකව සම්පූර්ණ කළ යුතු වේ. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන් 7ක් සම්පූර්ණ කර තිබේ. අලුතින් බඳවාගත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨ ප්‍රේරණ වැඩසටහන ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාල මගින් ද පිළිගත් තවත් ප්‍රධාන වැඩසටහනක් වේ. කළමනාකාර සහකාර, වැඩ සහායක, තාක්ෂණික නිලධාරී සහ වෙනත් තනතුරු සඳහා අවශ්‍ය පරිදි අභිප්‍රේරණ වැඩසටහන් ද කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබයි. මීට අමතරව, විශ්වවිද්‍යාලයේ සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ වෘත්තීය සංවර්ධනය වැඩි දියුණු කිරීම බොහෝ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩමුළු සහ නවක පාඨමාලා ද පවත්වනු ලැබේ.

2022 වර්ෂයේදී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් භාෂා අධ්‍යයන අධ්‍යනාංශය එක්ව ඉංග්‍රීසි භාෂාව සඳහා සන්නිවේදන කුසලතා වැඩසටහන, මධ්‍යම මණ්ඩපයේ උපකාරක සේවා (help desk) සහ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලය සඳහා Netiquette and Etiquette පිළිබඳ වැඩමුළුව, අලුතින් බඳවාගත් තාක්ෂණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන, පේටන්ට් සහ බුද්ධිමය දේපළ අයිතීන් පිළිබඳ සම්මන්ත්‍රණය, පුස්තකාල තොරතුරු සේවා පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියෙහි ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා ව්‍යූහය සම්පූර්ණ කිරීම පිළිබඳ උපදේශාත්මක වැඩමුළුව පවත්වන ලදි.තවද, මාර්ගගත පාඨමාලා සැලසුම්කරණය සහ සංවර්ධනය පිළිබඳ වැඩමුළුව, පාඨමාලා සාරාංශ සංවර්ධනය පිළිබඳ වැඩමුළුව, මාර්ගගත ඇගයීම් උපායමාර්ග පිළිබඳ වැඩමුළුව සහ වෘත්තීය ප්‍රගමනය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා උපදේශනය වෙබ් සම්මන්ත්‍රණය ද කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් 2022 වර්ෂයේදී පවත්වන ලදි. තවද, NVIVO - ගුණාත්මක දත්ත විශ්ලේෂණ පැකේජය පිළිබඳ වැඩමුළුව, විවිධත්වය සමඟ ජීවත් වීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණුකිරීම, පරිපාලන නිලධාරීන් සඳහා උපායමාර්ගික කළමනාකරණ සැලැස්මේ ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කිරීම පිළිබඳ වැඩමුළුව, OUSL House Style templates භාවිත කරන ආකාරය පිළිබඳ වැඩමුළුව, ප්‍රශ්න පත්‍රයක් සකස් කරන ආකාරය පිළිබඳ වැඩමුළුව, ජාල කළමනාකරුවන් සහ තාක්ෂණ නිලධාරීන් සඳහා OMIS වැඩමුළුව, ප්‍රාදේශීය අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලය සඳහා තත්ත්ව පරිපාලනය පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය ද 2022 වර්ෂයේ දී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද ක්‍රියාකාරකම් කිහිපයක් වේ. 'How ODL can provide lifelong learning opportunities for skilling, upskilling and reskilling the workforce' පිළිබඳ වැඩමුළුව ද 2022 වර්ෂයේදී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සම්පත් දායකයෙකු ලෙස පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම්හි සභාපති මහාචාර්ය. ආශා කන්වර්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද තවත් වැදගත් වැඩමුළුවක් වේ.

මීට අමතරව, මානසික යහ පැවැත්ම ප්‍රවර්ධනය වන ක්‍රියාකාරකම්, අභිප්‍රේරණ වැඩසටහන් සහ උපදේශන වැඩමුළු ද වාර්ෂිකව පවත්වනු ලැබේ. ඉහත සඳහන් ක්‍රියාකාරකම් සාර්ථකව පැවැත්වීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පුස්තකාලය, ස්ත්‍රී පුරුෂ සමතාවය සහ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය, අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය, භාෂා අධ්‍යයන අධ්‍යනාංශය වැනි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය විවිධ ඒකක හා සහයෝගීතාවයෙන් කටයුතු කරන ලදි. මෙම සියළුම වැඩමුළු සහ වැඩසටහන් සමඟින්, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සියළුම පාර්ශවකරුවන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරන අතර 2022 වර්ෂය තුළ සියළුම කාණ්ඩවල කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා වැඩමුළු සහ වැඩසටහන් 24ක් පවත්වන ලදි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් බහුතරයක් මෙම ක්‍රියාකාරකම් සඳහා සහභාගි වී ඇති අතර ඇතැම් ක්‍රියාකාරකම් Zoom තාක්ෂණය හරහා මාර්ගගතව මෙන්ම භෞතිකව සෞඛ්‍ය මාර්ගොපදේශ අනුගමනය කරමින් ක්‍රමවේදයන් දෙකෙහිම සංකලනයක් ලෙස පවත්වන ලදි.

6.4 වෘත්තීය උපදේශන ඒකකය

වෘත්තීය උපදේශන ඒකකයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ විවෘත විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයින්ට අනාගත ශ්‍රම බලකාය තුළ සමාජීය වශයෙන් ප්‍රතිචාර දක්වන කාර්යක්ෂම සාමාජිකයෙකු වීමට පහසුකම් සැලසීමයි.

රැකියාවල නිරත විය හැකි පරිදි විද්‍යාර්ථීන් ලෙස පුහුණු කිරීමට ශිෂ්‍යයින් සූදානම් කිරීම සහ රැකියාවල නියුතු විද්‍යාර්ථීන් ලෙස වෘත්තීය ප්‍රගතිය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරනු ලබයි.

නාවල, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථාන නව ගොඩනැගිල්ලෙහි මෙම ඒකකය පිහිටා තිබේ. රැකියා ක්ෂේත්‍රයේ අවශ්‍යතා සමඟ කටයුතු කිරීම සඳහා අවශ්‍ය කුසලතා සහ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාර්ථීන්ට සහාය වීමට වැඩමුළු සහ සම්මන්ත්‍රණ පීඨවල සහයෝගීතාවය සහිතව වෘත්තීය උපදේශන ඒකකය විසින් සංවිධානය කිරීම කරනු ලබයි.

OUSL Young Inventors Club වෘත්තීය උපදේශන ඒකකය විසින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හා සහයෝගීතාවයෙන් ආරම්භ කරන ලදි.

මෙය අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සහභාගීත්වයෙන් 2022 නොවැම්බර් 25 වන දින කොළඹ, ලේක් හවුස් හීදී නිල වශයෙන් ස්ථාපිත කරන ලදි.



ශිෂ්‍යයින් සඳහා Young Inventors Clubහි ප්‍රථම වැඩමුළුව සහ රසායනාගාර චාරිකාව නොවැම්බර් 26 වන දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේදී අධ්‍යක්ෂ/ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ කළමනාකරු/ CITES සහ අධ්‍යක්ෂ/ වෘත්තීය උපදේශන ඒකකය යන සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණ.



වෘත්තීය උපදේශන ඒකකය විසින් කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය හා එක්ව විශ්වවිද්‍යාලයීය වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින ශිෂ්‍යයින් සඳහා 2022 සැප්තැම්බර් 15 වන දින පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයේදී පවත්වන ලද රැකියා පොළ (Career fair) සඳහා සහභාගි විය.



ශිෂ්‍යයින් සඳහා Young Inventors Clubහි ප්‍රථම වැඩමුළුව සහ රසායනාගාර චාරිකාව නොවැම්බර් 26 වන දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේදී අධ්‍යක්ෂ/ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ කළමනාකරු/ CITES සහ අධ්‍යක්ෂ/ වෘත්තීය උපදේශන ඒකකය යන සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණ.

වෘත්තීය උපදේශන ඒකකය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය භාෂා අධ්‍යයන අධ්‍යනාංශය හා සහයෝගීතාවයෙන් උපදේශන හා බාහිර සම්පත් මධ්‍යස්ථාන ව්‍යාපෘතියක් ලෙස අ.පො.ස උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින ශිෂ්‍යයින් සඳහා උසස් පෙළ ඉංග්‍රීසි සාහිත්‍ය සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදි. එම සම්මන්ත්‍රණය 2022 ඔක්තෝබර් 19 සහ 20 දිනවල සාර්ථකව පවත්වන ලදි.



එක්සත් රාජධානි ශිෂ්‍යත්ව වැඩසටහන, පිළිගත් සුදුසුකම් සහිතව ජර්මනියේ වෘත්තිය ආරම්භ කිරීම පිළිබඳ ආකර්ෂණීය වැඩමුළු බොහෝමයක් වෘත්තීය උපදේශන ඒකකය විසින් පවත්වන ලදි.

6.5 මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය

මුද්‍රණාලය



හැඳින්වීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ ව්‍යාපෘතියක් ලෙස 1982 වර්ෂයේදී පිහිටුවන ලදි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ලියපදිංචි ශිෂ්‍යයින් වෙත අවශ්‍ය පාඨ ග්‍රන්ථ සැපයීම සඳහා මෙය පිහිටුවන ලදි. අවම උපකරණ සහිතව තම කාර්යයන් ආරම්භ කරමින්, දුරස්ථ ඉගැන්වීම අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ අරමුණින් ව්‍යාපෘතිය ADB – DEMP යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් වරින් වර සපයන ලද නවතම යන්ත්‍රෝපකරණවලින් සමන්විත අංගසම්පූර්ණ මුද්‍රණාලයක් බවට විශ්වවිද්‍යාලයීය ක්‍රමයෙන් සංවර්ධනය වී ඇත.
වර්තමාන රාජකාරී සහ ක්‍රියාකාරකම්: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය විසින් විශ්වවිද්‍යාලයීය පීඨ 6ම විවිධ අධ්‍යයන වැඩසටහන් හදාරනු ලබන 40,000කට අධික ශිෂ්‍යයින් සංඛ්‍යාවක් සඳහා පාඨ ග්‍රන්ථ සපයනු ලබයි. ලියාපදිංචි ශිෂ්‍යයින්ට මුද්‍රිත පාඨ ග්‍රන්ථ සැපයීමට අමතරව මුද්‍රණාලය විසින් පහත සඳහන් සේවාවන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රජාවට සපයනු ලබයි.

1. ශිෂ්‍ය මාර්ගෝපදේශ පොත් මුද්‍රණය කිරීම.
2. විවිධ අධ්‍යයන වැඩසටහන්වලට අදාළ විවරණිකා මුද්‍රණය කිරීම.
3. අත් පොත් මුද්‍රණය කිරීම.
4. අත් පත්‍රිකා සහ පෝස්ටර් මුද්‍රණය කිරීම.
5. ක්‍රියාකාරකම් කාල සටහන් මුද්‍රණය කිරීම.

අධ්‍යයන ක්‍රියාකාරකම් ලෙස සැලකිය හැකි ඉහත සඳහන් මුද්‍රණ ක්‍රියාවලියට අමතරව විවිධ පරිපාලන අංශවලට අවශ්‍ය ද්‍රව්‍ය ද විශ්වවිද්‍යාල මුද්‍රණාලයේ මුද්‍රණය කරනු ලබයි.

මුද්‍රණාලය මඟින් මුද්‍රණය කරන ලද පාඨමාලා ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය – 2022

	පාඨමාලා ද්‍රව්‍ය පිටපත් සංඛ්‍යාව	පාඨමාලා අත්පොත් පිටපත් සංඛ්‍යාව	වෙනත් ද්‍රව්‍ය පිටපත් සංඛ්‍යාව
ජනවාරි	49,090	100	238,369
පෙබරවාරි	35,250	2,600	25,881
මාර්තු	56,675	-	2,407
අප්‍රේල්	27,670	850	230
මැයි	31,181	5,500	33,815
ජූනි	53,682	-	9,161
ජූලි	17,830	-	4,934
අගෝස්තු	60,611	790	184,132
සැප්තැම්බර්	43,428	6,000	46,048
ඔක්තෝබර්	65,448	15,000	82,794
නොවැම්බර්	45,756	-	392,213
දෙසැම්බර්	34,778	250	9,950
එකතුව	**521,399**	**31,090**	**1,029,934**

මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය

මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය මඟින් නියමිත කාලයේදී ප්‍රදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල ලියාපදිංචිකිරීම් පැවැත්වීමේදී පාඨමාලා ද්‍රව්‍ය ගබඩා කිරීම හා බෙදා හැරීම මෙන්ම පාඨමාලා ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම හරහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරයි. ලියාපදිංචි වූ සිසුන් වෙනුවෙන් පාඨමාලා ද්‍රව්‍ය ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා සියලුම පීඨ වෙත සේවා සපයන්නා ලෙස මෙම ඒකකය කටයුතු කරයි. මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකය රාක්ක 576කින් සමන්විත වන අතර එක් රාක්කයක් 1.5 m^3 වේ. සෑම රාක්කයක් තුළම පාඨ ග්‍රන්ථ විධිමත්ව ගබඩා කළ හැකිය.

අරමුණු :

- මුද්‍රණ කටයුතු සම්පූර්ණ වූ වහාම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලයෙන් සියලුම පාඨමාලා ග්‍රන්ථ එක් රැස් කර ගැනීම.
- ප්‍රාදේශීය මධ්‍යස්ථාන 9 හා අධ්‍යයන මධ්‍යස්ථාන 18 වෙත පාඨමාලා ග්‍රන්ථ බෙදා හැරීම.
- කාර්යභාරය: මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකය පහත කාර්යයන් සිදු කරනු ලැබේ.
  - සියලුම මුද්‍රිත පාඨමාලා ග්‍රන්ථ ගබඩා කිරීම.
  - කොන්ත්‍රාත් පදනම මත කුරියර් සේවා හරහා ලියාපදිංචි වූ ශිෂ්‍යයින් වෙත පාඨමාලා ද්‍රව්‍ය යැවීම.
  - අවශ්‍ය අවස්ථාවල ශිෂ්‍යයින්ට පාඨමාලා ද්‍රව්‍ය නිකුත් කිරීම
  - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ලොරි රථ සහ කොන්ත්‍රාත් පදනම මත කුරියර් සේවා හරහා දිවයින පුරා පිහිටා ඇති ප්‍රදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන වෙත පාඨමාලා ග්‍රන්ථ බෙදා හැරීම.
  - ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවලින් ආපසු එවන ඕනෑම පාඨමාලා ග්‍රන්ථයක් බාර ගැනීම.
  - නව පාඨමාලා ග්‍රන්ථවල සෑම පිටපතක්ම ප්‍රධාන පුස්තකාලය වෙත සැපයීම.

පහසුකම්/ යටිතල පහසුකම්/ සම්පත්

- යහපත් වාතාවරණයක් සහිතව පාඨමාලා ග්‍රන්ථ ගබඩා කිරීම සඳහා 45x20 m^2 ක ඉඩ ප්‍රමාණයෙන් යුත් ගොඩනැගිල්ලක්
- ඉහත සඳහන් අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකයට අනුයුක්තව 12 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවය කරයි.
- මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකය තුළ රාක්ක 576ක් ඇති අතර රාක්කයක ප්‍රමාණය 1.5 m^3 ක් වේ.
- මෙම ඒකකය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය වෙත සම්බන්ධ කර ඇත.
- ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 3 දෙනෙකුගෙන් සමන්විත වේ. (කළමනාකරණ සහකාර - 03)
- කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 09 දෙනෙකුගෙන් සමන්විත වේ. (ව්‍යාපෘති සහකාර 03දෙනෙක් හා මෙහෙයුම් සහකාර 06දෙනෙක්)

6.6 ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ 2013 දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය පිහිටුවන ලදි. මෙය 2015 මාර්තු මස විශ්වවිද්‍යාලයට පවරන ලදි. අපගේ දැක්ම වන්නේ ශ්‍රී ලංකාවේ දුරස්ථ අධ්‍යාපනයේ සහ දිවයිනෙන් පිටත ප්‍රමුඛපෙලේ පහසුකම් සපයන්නා බවට පත් වීමයි.

එම දැක්ම සමඟ, මාර්ගගත අධ්‍යාපනයට සහය දැක්වීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය පහත සඳහන් පහසුකම්වලින් සමන්විත වේ.

- අපගේ සම්පත් සමඟින් ඔවුන්ගේ අවශ්‍යතා අනුව භෞතිකව/ මාර්ගගත ක්‍රමවේදය හරහා වැඩමුළු/ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- භෞතිකව/ මාර්ගගත ක්‍රමවේදය හරහා භෞතික විභාග පැවැත්වීම සඳහා පහසුකම් සැපයීම හා සංවිධානය කිරීම.
- ඉගෙනුම ලබන්නන් ඇගයීමේ ක්‍රම සහ ඇගයීම හා මාර්ගගත විභාග පැවැත්වීමේ ක්‍රම පිළිබඳ පුහුණුව ලබා දීම.
- අපගේ servers හරහා මාර්ගගත පාඨ ග්‍රන්ථ සංවර්ධනය/ පාඨ ග්‍රන්ථ මාර්ගගත ක්‍රමවේදයට පරිවර්තනය කිරීම මෙන්ම සත්කාරකත්වය දැරීම.
- බාහිර ආයතන සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය දේශන ශාලා සහ විභාග ශාලා සැපයීම.
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් ලබා දිය හැකි, බාහිර ආයතන සඳහා අවශ්‍ය වෙනත් ඕනෑම සේවා අවශ්‍යතාවයක් ලබා දීම

2022 වර්ෂය තුළ ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය විසින් බාහිර ආයතන වෙත සේවා සැපයීම සඳහා ව්‍යාපෘති ගණනාවක් සිදු කරන ලදි. එසේම, විද්‍යුත් මාධ්‍යා භාවිතයෙන් ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානයේ සේවා සඳහා වැඩි ප්‍රචාරයක් ලබා දීමට පියවර ගන්නා ලදි.

6.7 ජාත්‍යන්තර සබඳතා ඒකකය

ජාත්‍යන්තර සබඳතා ඒකකය 2013 ඔක්තෝබර් මස ස්ථාපිත කරන ලදී. එය සංශෝධිත 1990 අංක 01 දරන විවෘත විශ්වවිද්‍යාල ආඥාපනතේ 19 වන කොටස සමඟ කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 කොටස යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල සභාව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2016 අංක 9 දරන අතුරු ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වේ.

ජාත්‍යන්තර සබඳතා අංශය උපකුලපතිගේ සෘජු අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂවරයෙකුගේ මෙහෙයවීම මත ක්‍රියාත්මක වේ. එහි පරිපාලන සහ මූල්‍ය කටයුතු කළමනාකරණ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ජාත්‍යන්තර සබඳතා අංශයේ අධ්‍යක්ෂ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වන අතර උපකුලපතිගේ නිර්දේශය මත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය මත පත් කරනු ලබයි.

ජාත්‍යන්තර සබඳතා උපායමාර්ග සකස් කර ගැනීමේ දී සහ ලෝකයේ ඇති වෙනත් විශ්වවිද්‍යාල හෝ අනෙකුත් ආයතන සමඟ විධිමත් සබඳතා පාර්ශ්වකාරිත්වයන් ඇතිකර ගැනීමේදී ජාත්‍යන්තර සබඳතා අංශය විශිෂ්ට උපදෙස් සැපයීම සහ මගපෙන්වීම සිදු කරයි.

ජාත්‍යන්තර සබඳතා අංශයේ අරමුණු පහත සඳහන් වේ.

(අ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ආයතන, පීඨ, සනාථන සභාව හා පාලක සභාව සඳහා උපාය මාර්ග හා විශේෂිත නිර්දේශ සකස් කිරීම.

(ආ) විදේශීය ආයතන සමඟ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ඇතිකරගත් විධිමත් ද්වීපාර්ශ්වික හා බහුපාර්ශ්වික ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් වැඩි දියුණු කිරීම හා සමාලෝචනය කිරීමට පහසුකම් සැලසීම.

(ඇ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් සඳහා ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණ සහ අධ්‍යයන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

(ඈ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය සඳහා ජාත්‍යන්තරව පිළිගත් පර්යේෂකයින් හා ගුරුවරුන් ලෙස තම හැකියාවන් වැඩි දියුණු කර ගැනීම සඳහා අවස්ථා සැලසීම.

(ඉ) ජාත්‍යන්තර ව්‍යාපෘති හා වෙනත් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙමින් ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා දායක වීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයට සහාය වීම.

(ඊ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට, තොරතුරු බෙදා හැරීම හා ගෝලීයව දායකත්වයක් සැපයීම සඳහා අවස්ථාවන් ලබා දීම.

(උ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් වෙත විදේශීය වෘත්තීය අවස්ථාවන් ගවේෂණය කිරීම සඳහා පහසුකම් සැලසීම.

(ඌ) විදේශීය ශිෂ්‍යයින්, ගුරුවරුන් හා වෙනත් අමුත්තන් වෙත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ රැඳී සිටින කාල සීමාව අතරතුර අවශ්‍ය සහයෝගය ලබා දීම.

(එ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වැඩසටහන් විදේශවල ප්‍රවර්ධනය කිරීම සහ සබඳතා ගොඩනගා ගැනීම.

(ඒ) ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රධාන රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිතායතන සහ රාජ්‍ය තාන්ත්‍රික දූත කණ්ඩායම් සහ විදේශ වල සිටින ලාංකීය දූත කණ්ඩායම් සමඟ සබඳතා සම්බන්ධීකරණය කිරීම

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ජාත්‍යන්තර සබඳතා අංශය 2013 සිට 2022 දක්වා පසුගිය වසර නවයක කාල සීමාව තුළ ක්‍රියාකාරකම් බොහෝමයක් සඳහා සක්‍රීය ලෙස දායක විය. පහත සඳහන් වන්නේ එම ක්‍රියාකාරකම්වල කෙටි සාරාංශයකි.

1. ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සබඳතා සඳහා පහසුකම් සැලසීම
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්

අනු අංක	ආයතනයේ නම	රට	අත්සන් කරන ලද වර්ෂය
01	විවෘත අධ්‍යාපන සම්පත් පදනම (OERu)	නවසීලන්තය	2022
02	ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය	පිලිපීනය	2022
03	INTI ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය	මැලේසියාව	2022
04	Travel to Farm (T2F)	ඩෙන්මාර්කය	2022
05	විද්‍යාව සඳහා ජාත්‍යන්තර පදනම	ස්වීඩනය	2022
06	සංවර්ධනය වෙමින් පවතින ලෝකය සඳහා විද්‍යාව පිළිබඳ කාන්තාවන් සඳහා වූ සංවිධානයේ (OWSD) UNESCO යටතේ මුල් කාලීන වෘත්තීය කාන්තා විද්‍යාඥයින්ගේ වැඩසටහන	ඉතාලිය	2022
07	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	ශ්‍රී ලංකාව	2022

අනුමැතිය අපේක්ෂිත අවබෝධතා ගිවිසුම්

අනු අංක	ආයතනයේ නම	රට	වලංගු කාල සීමාව
01	භාරතීදාසන් විශ්වවිද්‍යාලය, තිරුචිරප්පල්ලි	ඉන්දියාව	වසර 5
02	ක්වන්ට්ලෙන් පොලිටෙක්නික් විශ්වවිද්‍යාලය	කැනඩාව	වසර 3
03	ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලය	චීනය	වසර 5
04	ප්‍රගති ගිවිසුම- එසෙක්ස් විශ්වවිද්‍යාලය	එක්සත් රාජධානිය	වසර 5
05	හෙද අධ්‍යාපන එකමුතුව - End-of-Life Nursing Education Consortium (ELNEC)	ඉන්දියාව	වසර 3
06	CNNC ලන්ඩන් පුද්ගලික සමාගම	එක්සත් රාජධානිය	වසර 3
07	යුරෝපා ශ්‍රම බලකාය (WeCare Nursing School)	ජර්මනිය	වසර 5

වර්තමාන අවබෝධතා ගිවිසුම් හා සම්මුති අළුත් කිරීම

- ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල, බෙල්ජියම - පාලක සභාව වෙත ඉදිරිපත් කිරීමේ අදියරෙහි පවතී.

ඕස්ට්‍රේලියාවේ RMIT විශ්වවිද්‍යාලය:

2022 තුළ සහයෝගීතාවය වර්ධනය කිරීම පිළිබඳ රැස්වීම් කිහිපයක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ RMIT විශ්වවිද්‍යාලය අතර පැවැත්විණ. RMIT නියෝජ්‍ය උපකුලපති (ගෝලීය සබඳතා) සහ RMIT උප සභාපති සහ වියට්නාමයේ RMIT සභාපති වන මහාචාර්ය. පීටර් ජේ. කොලෝයි විසින් වැඩසටහන් දෙකක් හෝ තුනක් සඳහා ගිවිසුම්ගත ඇතුළත්වීමේ ක්‍රමවේද වැඩි දියුණු කිරීමට ඇති උනන්දුව සඳහන් කරමින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපකුලපතිවරයා වෙත ලිපියක් එවා ඇත. ඊට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන්, විශ්වවිද්‍යාලයීය පීඨවල සහයෝගය ඇතිව සවිස්තරාත්මක යෝජනාවක් ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් වැඩි දියුණු කර දෙසැම්බර් මස RMIT විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කරන ලදි. “Proposal for academic collaboration to link degree programmes in The Open University of Sri Lanka (OUSL) with the RMIT University Australia through articulation pathway” යන මාතෘකාව යටතේ ඉදිරිපත් කළ යෝජනාව පහත සඳහන් ප්‍රධාන අංශවලින් සමන්විත වේ.

- විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය අතර ආචාර්ය උපාධි වැඩසටහන් (Split-site PhD programme)
- RMIT උපාධි වැඩසටහන් සඳහා ඇතුළත්වීමේ සුදුසුකමක් ලෙස විද්‍යාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව පිළිගැනීම
- උපාධි පාඨමාලා සඳහා ගිවිසුම්ගත ඇතුළත්වීමේ මාර්ග; විද්‍යාපති උපාධිය (BSc), කළමනාකරණ අධ්‍යයනවේදී උපාධිය (BMS), වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී උපාධිය (BMLS), තාක්ෂණවේදී ගෞරව (ඉංජිනේරු) උපාධිය BTechHons (Eng). අදාළත්වය, වර්තමාන/ අනාගත ඉල්ලුම, ව්‍යාත්තීය අපේක්ෂා සහ දේශීයව මේ හා සමාන වැඩසටහන් සඳහා ප්‍රවේශය යන සාධක මත උපාධි පාඨමාලා තොරා ගැනීම සිදු විය.
  RMIT විශ්වවිද්‍යාලය විසින් යෝජනාව සමාලෝචනය කළ බවත් වැඩි දුර කටයුතු සඳහා කමිටුවක් පත් කළ බවත් දන්වන ලදි.

- **රුසියානු ඉනෝපොලිස් විශ්වවිද්‍යාලය:** ශ්‍රී ලංකාවේ රුසියානු තානාපති විසින් 2022, ඔක්තෝබර් 20 වන දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සමඟ මූලික රැස්වීම පවත්වමින් රුසියානු ඉනෝපොලිස් විශ්වවිද්‍යාලය හඳුන්වා දෙන ලදි. මෙම විශ්වවිද්‍යාලය රුසියාවේ තොරතුරු තාක්ෂණය සඳහා ඉහළ පිළිගැනීමක් ඇති විශ්වවිද්‍යාලවලින් එකක් වේ. ඉනොපොලිස් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය අතර පසුව රැස්වීම් කිහිපයක් පවත්වන ලද අතර අනාගත සහයෝගීතාවය සඳහා උපායමාර්ගික සැලස්මක් සකස් කරනු ලැබේ. තවද, ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අදාළ අධ්‍යනාංශ සමඟ ඉනොපොලිස් විශ්වවිද්‍යාලය හා එක්ව සිදු කරනු ලබන සහයෝගී අධ්‍යයන වැඩසටහන් පිළිබඳව රැස්වීම් කිහිපයක් පවත්වන ලදි. ඉනොපොලිස් විශ්වවිද්‍යාලය සමඟ අනුවර්තන පර්යේෂණ සිදු කිරීම පිළිබඳ ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් L3F ව්‍යාපෘති හවුල්කරුවෙකු වන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ ද රැස්වීමක් පවත්වන ලදි.

2. සහයෝගි පර්යේෂණ හා අධ්‍යයන වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය වෙත අවස්ථා ලබා දීම.

ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම

‘Overseas ready’ වැඩසටහන වැඩි දියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ
ආසියානු විවෘත විශ්වවිද්‍යාල සංගමයේ අන්තර් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල හුවමාරු සහයෝගීතාව (යාවත්කාලීන කළ)

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට, තොරතුරු බෙදා හැරීම හා ගෝලීයව දායකත්වයක් සැපයීම සඳහා අවස්ථාවන් ලබා දීම.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා e-newsletters: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත පැමිණෙන විදෙස් අමුත්තන් හා සම්බන්ධ උත්සව මෙන්ම විදෙස් රටවල අධ්‍යයන අවස්ථා සම්බන්ධ තොරතුරු බෙදා හැරීම සඳහා e-newsletters දෙකක් ආරම්භ කරන ලදි. ඒවා "*Opportunities and Prospects*" සහ '*Events and Visitors*" ලෙස නම් කරන ලද අතර දෙසතියකට වරක් බෙදා හරින ලදි.

සියලුම පීඨ මණ්ඩලවල න්‍යාය පත්‍ර විෂයක් ලෙස ජාත්‍යන්තර සබඳතා ඒකකයේ ක්‍රියාකාරකම්: 2020 දී 26 වන කළමනාකරණ මණ්ඩලයේදී ලබා ගන්නා ලද තීරණයකට අනුව න්‍යාය පත්‍ර විෂයක් ලෙස ජාත්‍යන්තර සබඳතා ඒකකයේ ක්‍රියාකාරකම් සියලුම පීඨවල වාර්තා වී ඇත. කාර්ය මණ්ඩලය අතර අවස්ථාවන් හා වැදගත් සිදුවීම් පිළිබඳ දැනුවත් කිරීම මෙන්ම ජාත්‍යන්තර සබඳතා ඒකකයේ වැඩි දියුණුව සඳහා ප්‍රතිචාර ලබා ගැනීම මෙමගින් සිදු කෙරේ.

විශේෂ යෝජනා ක්‍රමයක් හරහා 2022 ආසියානු විවෘත විශ්වවිද්‍යාල සංගමයේ වාර්ෂික සම්මේලනය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහභාගී වීමට පහසුකම් සැලසීම

රටේ පවතින අයහපත් ආර්ථික තත්ත්වය සහ විදේශ ගමන් සඳහා සීමා පැනවීම හේතුවෙන් ආසියානු විවෘත විශ්වවිද්‍යාල සංගමයේ 2022 සමුළුවට නිබන්ධන ඉදිරිපත් කළ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සම්මන්ත්‍රණ ලියාපදිංචි ගාස්තුව ගෙවා ඒ සඳහා සහභාගී වීමට ක්‍රමවේදයක් යොදා ගත හැකි ය. ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් වෙතින් විශේෂ ඉල්ලීමක් සිදු කර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා ප්‍රදාන යෝජනා ක්‍රමයක් ලබා ගෙන මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සහභාගි වීමට අවස්ථාව ලබා දෙන ලදි. 2022 ආසියානු විවෘත විශ්වවිද්‍යාල සම්මන්ත්‍රණයේ දී ලියාපදිංචි ගාස්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයට ශිෂ්‍යත්ව 6ක් පිරිනමමින් නිබන්ධන ඉදිරිපත් කිරීම සඳහා විශේෂ අවස්ථාවක් ලබා දුන් බව කෘතවේදීව සඳහන් කරන්නෙමු.

වෙබ් සම්මන්ත්‍රණ මාලාව

වෙබ් සම්මන්ත්‍රණ මාතෘකාව	ඉදිරිපත් කරන්නා	අනුබද්ධිත ආයතනය
එක්සත් රාජධානි ශිෂ්‍යත්ව වැඩසටහන දිනය: 2021/10/06	අයුනි මුණසිංහ මෙය දීප්ති විජේසිංහ මෙය	බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය බ්‍රිටිශ් කවුන්සිල්

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි පැවැත්වුණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා පහසුකම් සැපයීම

වැඩමුළුව/ සම්මේලනයේ නම	නියෝජිතයා	අනුබද්ධිත ආයතනය	ජාත්‍යන්තර සබඳතා ඒකකයෙහි කාර්යභාරය
කළමනාකරණය සහ ව්‍යවසායකත්වය පිළිබඳ ප්‍රථම ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICOME) 2022	දේශීය සහ විදේශීය	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (මාර්ගගත ක්‍රමවේදය හරහා)	රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සහ හවුල්කරුවන්ගේ ස්ථාපිත නාලිකා හරහා විදෙස් රටවල් තුළ ප්‍රවර්ධනය කිරීම
ජාත්‍යන්තර විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසි 2022 (iOURS 2022)	දේශීය සහ විදේශීය	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (මාර්ගගත ක්‍රමවේදය හරහා)	

2. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වැඩසටහන් විදෙස් රටවල ප්‍රවර්ධනය කිරීම හා සබඳතා ගොඩනගා ගැනීම

විදේශීය ශිෂ්‍යයින් සඳහා තොරතුරු යාවත්කාලීන කිරීම:

'Overseas Ready" වැඩසටහන්: ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් තෝරාගත් අධ්‍යයන වැඩසටහන් විදෙස් ඉගෙනුම ලබන්නන් වෙත පිරිනැමීමේ මට්ටමට යොදා ගැනීම සඳහා මාර්ගෝපදේශ සපයනු ලබයි. 2023 වර්ෂයේ සිට සත්ත්ව විද්‍යා අධ්‍යනාංශය විසින් නිවර්තන ජෛව විවිධත්වය සහ පරිසර සංචාරක ක්ෂේත්‍ර පාඨමාලා පිරිනමනු ලබයි.

3. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් වෙත විදේශීය වෘත්තීය අවස්ථාවන් ගවේෂණය කිරීම සඳහා පහසුකම් සැලසීම.

විදේශීය අධ්‍යයන ආයතනවල ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් පිළිබඳ වැඩසටහන: උපාධිධාරීන් සහ ආයතනය අතර සබඳතාවය පවත්වාගැනීම සඳහා ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් මෙම වැඩසටහන වැඩි දියුණු කරන ලදි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන්ගෙන් ඔවුන්ගේ තොරතුරු එක් රැස් කිරීම හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය පිළිබඳ ඔවුන්ගේ අදහස් සටහන් කරගැනීම සඳහා google-form මඟින් සමීක්ෂණ ප්‍රශ්නාවලියක් පවත්වන ලදි.

4. ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රධාන රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිතායතන සහ රාජ්‍ය තාන්ත්‍රික දූත කණ්ඩායම් සහ විදේශ වල සිටින ලාංකීය දූත කණ්ඩායම් සමඟ සබඳතා සම්බන්ධීකරණය කිරීම.

- ***Commonwealth of Learning (COL-L3F)*** ව්‍යාපෘතිය සමඟ ගොවීන් සඳහා යාවජ්ව ඉගෙනුම: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් (COL) අතර අත්සන් කරන ලද ගිවිසුම යටතේ ආරම්භ කරන ලද COL-L3F ව්‍යාපෘතියේ පළමු පියවර සාර්ථකව සම්පූර්ණ කරන ලදි. මෙය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අතර සහයෝගී ව්‍යාපෘතියක් වේ. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම ආරම්භයේදීම සිදු කෙරිණ. මෙහි අරමුණ වූයේ අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් වෙනුවෙන් ජංගම දුරකථන යෙදුමක් (mobile app) එකක් සඳහා අන්තර්ගතය සහ ව්‍යූහය වැඩි දියුණු කිරීම වේ. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් දෙපාර්ශවය විසින් අත්සන් කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය මඟින් ජංගම දුරකථන යෙදුමට ගැළපෙන පරිදි පහත සඳහන් මාතෘකා සඳහා සිංහල හා දෙමළ භාෂාවලින් අන්තර්ගතය සකස් කරන ලදි. මෙම සෑම අන්තර්ගතයක්ම එක් සැසියකට අවම වශයෙන් වීඩියෝ පට 3කින් සමන්විත වේ. ගම්මිරිස්, කුරුඳු, කොකෝවා, කෝපි, කරාබු නැටි, සාදික්කා, ඉඟුරු, කහ, වැනිලා සහ බුලත් වැනි අපනයන කෘෂිකාර්මික බෝග 10ක වගාවේ සිට නිෂ්පාදන සංවර්ධනය දක්වා සියලුම අංග ව්‍යාපෘතියට ඇතුළත් කර ඇත. මෙම අන්තර්ගතය සිංහල සහ දෙමළ මාධ්‍යවලින් භාවිත කළ හැකි ය. මීට අමතරව, ගොවීන් සහ නිෂ්පාදකයින් සඳහා වැදගත් විශේෂ මාතෘකාවලින් අන්තර්ගතය සමන්විත වේ.

විශේෂ මාතෘකා:

1) පාංශු සංරක්ෂණය
2) පෝෂක කළමනාකරණය
3) වාරිමාර්ග සහ පොහොර යෙදීම
4) කාබනික පොහොර නිෂ්පාදනය
5) කුළුබඩු සහිත ගෙවත්ත
6) රෝග
7) පලිබෝධ
8) පසු අස්වනු තාක්ෂණය
    i. ප්‍රාථමික නිෂ්පාදන
    ii. අගය එකතු කළ නිශ්පාදන
    iii. ගබඩා කිරීම
    iv. ඇසුරුම්කරණය
9) සැකසුම් යන්ත්‍රෝපකරණ
10)අපනයන ක්‍රියාපටිපාටිය
11) සහතික කිරීම සහ ප්‍රමිතිකරණය
12)අලෙවිකරණය
13) අපනයන වෙළඳපොල

ලංසු ලේඛන සකස් කිරීම සහ ජංගම දුරකථන යෙදුමේ සංවර්ධකයා තෝරා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරන ලදි. මෘදුකාංග අවශ්‍යතා විශේෂීකරණය (software requirement specification) සකස් කරන ලදි. යෙදුමෙහි simulator ද සංවර්ධනය කරන ලදි.

5. විදේශීය විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ හවුල්කාරීත්වය වර්ධනය කිරීම.

ජාත්‍යන්තර සබඳතා ඒකකය මඟින් පහසුකම් සපයන ලද විදේශීය පර්යේෂණ ශිෂ්‍යයින් - 2022

අනු අංකය	රට	ශිෂ්‍යයාගේ නම	පර්යේෂණ මාතෘකාව	අනුබද්ධිත ආයතනය
01	බෙල්ජියම	ෆෙසා සනින්කා මෙය	සමාජ සංවිධානයක අවශ්‍යතාවලට යෝග්‍ය පරිදි ශක්තිමත් මානව සම්පත් ව්‍යූහයක් වැඩි දියුණු කිරීම	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
02	බෙල්ජියම	හෑන් මරීස් මාර්ක් මීස්මන් මෙය	මීගමුව ප්‍රදේශයේ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහනක තිරසාර බව වැඩි දියුණු කිරීම සහ පරීක්ෂා කිරීම	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
03	බෙල්ජියම	රොබින් වෑන් ගෙනෙච්ටන් මෙය	House of Lightහි ළමුන් සඳහා දරිද්‍රතාවය වර්තමාන සමාජ සන්දර්භයක් ලෙස	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
04	බෙල්ජියම	සියෙන් වුල්ෆ් ද බ්‍රෝ එක් මෙය	මොරවක සහ ඒ අවට අදාළ සෞඛ්‍ය ගැටළුවේ සමාජ සන්දර්භය	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
05	බෙල්ජියම	සෝයි ක්ලෝවැර්ත් මෙය	ප්‍රජා සංවර්ධන කටයුතුවල කාන්තා සහභාගීත්වය	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)

ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහලේ පර්යේෂණ ශිෂ්‍යයින්ගේ 6 වන කණ්ඩායම ලියාපදිංචි කිරීම සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධීක්ෂකවරුන් හමුවීම.

ඩෙන්මාකයේ *'Travel to Farm'* වැඩසටහන: 2023 වර්ෂයේ මුල් භාගයේ සිට *'Travel to Farm'* වැඩසටහන සඳහා සහභාගි වීමට ඇති අවස්ථාව පිළිබඳ 2022 දෙසැම්බර් මස මුල් භාගයේදී ජාත්‍යන්තර සබඳතා ඒකකය දැනුවත් කරන ලදි. ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් වැඩසටහන විවෘත විශ්වවිද්‍යාලය තුළ ප්‍රචාරණය කළ අතර එමඟින් එය මෙම වසරේ නියමු පරිමාණයේ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කෙරේ. මේ සඳහා ශිෂ්‍යයින් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්විණ.
වැඩසටහනේ තොරතුරු https://ou.ac.lk/activities/#1647581037626-2fa30b6d-20cd හරහා ලබා ගත හැකි ය.

විවෘත අධ්‍යාපන සම්පත් පදනම (OERu): විවෘත අධ්‍යාපන සම්පත්හි යුනෙස්කෝ සභාපති ආචාර්ය. වේන් මැකින්ටොෂ් සහ විවෘත අධ්‍යාපන සම්පත් පුද්ගලික සමාගමෙහි කළමනාකාර අධ්‍යක්ෂ, උපකුලපති/ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, මහාචාර්ය. ශිරෝනිකා කරුණානායක, මහාචාර්ය. බී.ජී ජයතිලක සහ අධ්‍යක්ෂ/ ජාත්‍යන්තර සබඳතා ඒකකය යන සමාජිකයින්ගේ සහභාගීත්වයෙන් ආයතන 2 අතර රැස්වීමක් 2022 නොවැම්බර් 02 වන දින පැවැත්විණ. අවබෝධතා ගිවිසුමෙන් පසු මූලික රැස්වීම මඟින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වැඩසටහන් සංවර්ධනය සඳහා විවෘත අධ්‍යාපන සම්පත් භාවිත කිරීමේ මාර්ග පිළිබඳ සොයා බැලීම සිදු කෙරිණ.



ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහලේ බාහිර පර්යේෂණ ශිෂ්‍යයින්ගේ 6 වන කණ්ඩායම ලියාපදිංචි කිරීම සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධීක්ෂකවරුන් හමුවීම.



එසෙක්ස් විශ්වවිද්‍යාලයේ කණ්ඩායමක් විසින් සිදු කළ සංචාරය

6.8 ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය

(1) බුද්ධිමය දේපළ ආරක්ෂණය

2022 වර්ෂයේදී, ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් පහත සඳහන් පේටන්ට් අයදුම්පත්‍ර ගොනු කිරීම සහ සංශෝධනය කිරීම සඳහා සහාය දක්වා ඇත.

වගුව - 1 බුද්ධිමය දේපළ ආරක්ෂණය පිළිබඳ සාරාංශය

අං.	මාතෘකාව	ගොනු කළ		
		ගොනු කළ	සංශෝධනය කළ	ප්‍රදානය කළ
ජාතික පේටන්ට්				
1	An electro stimulation method for producing Agarwood by *Gyrinops walla* cell culture	✓	✓	
2	A method of producing Agarwood by *Gyrinops walla* tissue culture	✓	✓	
3	An electro stimulation method for producing Agarwood by *Gyrinops walla* tissue culture	✓	✓	
4	A method of producing Agarwood by *Gyrinops walla* cell culture	✓	✓	
5	Rechargeable bio-battery made using pith of plants as electrolytic media	✓		✓
6	A system for quick assessment of soil Nitrogen,	✓	✓	

	Phosphorus, Potassium and Organic Matter for facilitating recommendation of right amount of fertilizer for agricultural lands			
7	Computer Numerical Controlled wood carving machine for vertical and horizontal operations.	✓		
8	Fully automated, Self-Controlled Ornamental Orchid Pot with Modular Units of assembly	✓	✓	
9	Method for processing of green pepper - based sauce as a spicy food supplement free of discoloration off flavor and preservatives	✓		

(2) වාණිජකරණ ක්‍රියාකාරකම්

2022 වර්ෂයේ කර්මාන්ත සමඟ පහත සඳහන් වාණිජකරණ ක්‍රියාකරකම් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ආරම්භ කරන ලදි.

වගුව -1 වාණිජකරණ ක්‍රියාකාරකම්

නිමැවුම	නිමැවුම්කරු	වාණිජකරණ හවුල්කරු	වර්තමාන තත්ත්වය
පළතුරු සම් (Fruit Leather)	ආචාර්ය. නිම්ෂා වීරක්කොඩි	දිනූ නිෂ්පාදන	NDA අත්සන් කළ
පළතුරු සම් (Fruit Leather)	ආචාර්ය. නිම්ෂා වීරක්කොඩි	ග්‍රෝතෙක්ස් මාකටින්	පාලක සභා අනුමැතිය අපේක්ෂා කෙරේ
Gameshow Buzzer system	Neo-Space lab, රසායන විද්‍යා අධ්‍යනාංශය	ටෙලිමැක්ස් (පුද්) සමාගම	පාලක සභා අනුමැතිය අපේක්ෂා කෙරේ
ස්ටිකර් ලේබල් කිරීමේ යන්ත්‍රය	Neo-Space lab, රසායන විද්‍යා අධ්‍යනාංශය	ටෙලිමැක්ස් (පුද්) සමාගම	පාලක සභා අනුමැතිය අපේක්ෂා කෙරේ

(3) පර්යේෂණ සහ සංවර්ධනය

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් සමාජය සඳහා ඵලදායී නිෂ්පාදන සහ සේවා බවට පත් කළ හැකි නවෝත්පාදන පර්යේෂණ ප්‍රතිඵල නිර්මාණය කිරීමටත්, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරමින් රටේ ආර්ථිකයට ප්‍රතිලාභ සැලසීමට උත්සහ දරයි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයින්ට startups නිර්මාණය කිරීමට හැකි නවෝත්පාදන ආහාර නිෂ්පාදන සහ යන්ත්‍ර වැඩි දියුණු කිරීමට හෝ මෙම නිෂ්පාදන වෙළඳපොල වෙත ගෙන යාමට සමාගම් හවුල්කරුවෙකුට වාණිජකරණය කිරීමට ලබා දීමට ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් පියවර ගෙන ඇත

2022 වර්ෂයේදී කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ශිෂ්‍යයින් විසින් සිදු කරන ලද පර්යේෂණ සහ නවෝත්පාදන පහත සඳහන් පරිදි වේ.

3.1 පළතුරු සම් සහ පළතුරු පෙති

පළතුරු සම් සාදනු ලබන්නේ ස්වභාවික පළතුරු යුෂ සාන්ද්‍රණය සමඟ පිසින ලද, නො ඇලෙන මතුපිටක් මත වියළා රෝල් කරන ලද අනෙකුත් අමුද්‍රව්‍ය වලින් වේ. ප්‍රථම පළතුරු සම් නිෂ්පාදනය 'Fruit Flaps' ලෙස සනාථන සභාවට හඳුන්වා දෙන ලදි. ප්‍රථම පළතුරු සම් නිෂ්පාදනය ලෙස සනාථන සභාවට හඳුන්වා දෙන ලදි. පළතුරු සම් නිෂ්පාදන 100%ක් ස්වභාවික අවන අතර කල් තබා ගන්නා ද්‍රව්‍ය අඩංගු නොවේ. එය පෝෂණ අතිරේකයක් වේ. මෙම ක්‍රමය සියඹලා, උගුරැස්ස, කාමරංකා, බිලිං, ලොවි වැනි පළතුරු ආරක්ෂා කිරීමේ ඵලදායී ක්‍රමයක් වේ. මෙය වෙළඳපොළේ ඇති කෘතිම පැණිරස ආහාර වෙනුවට ආදේශකයක් ලෙස භාවිත කළ හැකි ය.



රූපසටහන - 1 Fruit Flaps



රූපසටහන - 2 පළතුරු පෙති

3.2 CEJLON Green Pepper සහ සුදුළූණු සෝස්

'King of Spices' ලෙස ගම්මිරිස් හැඳින්වෙන අතර ලොව ඉතා වැදගත් කුළුබඩුවලින් එකක් වේ. Ceylon Pepperහි ඉහළ පයිපරින් අන්තර්ගතයක් ඇති අතර එය උසස් තත්ත්වයේ සුවඳකින් සහ රසයකින් සමන්විත වේ. මෙම නිෂ්පාදනය පිරිසිදු සහ නැවුම් ශ්‍රී ලාංකික ග්‍රීන් පෙපර් සහ සුදුළූණුවලින් සාදා ඇත. පාරිසරික අධ්‍යයන හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානයේ ආචාර්ය. චමිලා ඩයස් විසින් මෙම ව්‍යාපෘතිය යෝජනා කර වැඩි දියුණු කරන ලදි.







රූපසටහන - 4 Green pepper ketchup

Figure 0-1 Cereal bar

3.3 උදෑසන ආහාරය සඳහා Cereal bar

උදෑසන ආහාරය සඳහා ධාන්‍ය පෙට්ටියක් වෙනුවට ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් Cereal bar වැඩි දියුණු කරන ලදි. මෙම cereal bar 100%ක් ස්වභාවික වන අතර කල් තබා ගන්නා ද්‍රව්‍ය අඩංගු නොවේ. සෞඛ්‍ය සම්පන්න බවින් අඩු කෙටි ආහාරවලට විකල්පයක් ලෙස, ව්‍යායාම කිරීමට පෙර ක්ෂණිකව ශක්තිය ලබා ගැනීමේ ආහාරයක් ලෙස හෝ ආහාර වේලකට ආදේශකයක් වශයෙන් උදෑසන ආහාරය සඳහා Cereal bar භාවිත කළ හැකි ය.

3.4 ලාවුළු අයිස් ක්‍රීම්

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් පාරිසරික අධ්‍යයන හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානයේ ආචාර්ය. චමිලා ඩයස්ගේ අධීක්ෂණය යටතේ ලාවුළු අයිස් ක්‍රීම් නිෂ්පාදනය වැඩි දියුණු කරන ලදි.





රූපසටහන 0-2 ලාවුළු අයිස් ක්‍රීම්

3.5 බිම්මල් වැවීමේ කුටිය

මේ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශව හා එක්ව බිම්මල් වැවීමේ කුටි වාණිජකරණය කිරීම සිදු කරන ලදි. උසස් තත්ත්වයේ බිම්මල් සඳහා වෙළඳපොළේ ඇති ඉල්ලුම පිරවීමට හැකි උසස් ගුණාත්මකභාවයේ බිම්මල් සඳහා වැවීමේ කුටියක් නිෂ්පාදනය කිරීම පිළිබඳව රැස්වීම් අතරතුර සාක්ච්ඡා කෙරිණ.

3.6 Gameshow Buzzer System

වර්තමාන වෙළඳපොළේ වඩාත් නම්‍යශීලි සහ විශ්වාසවන්තම game show buzzer system මෙය වේ. පරිශීලකයා විසින් බොත්තම තද කිරීමේදී මෙම පද්ධතියෙන් එළියක් නිකුත් වේ.



රූපසටහන 6-7 Gameshow buzzer

3.7 ස්ටිකර් සහ ලේබල ඇල්වීමේ යන්ත්‍රය

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් සිලින්ඩරාකාර වීදුරු සහ PET බෝතල්වලට ස්ටිකර් සහ ලේබල ඇලවීමේ යන්ත්‍රයක් වැඩි දියුණු කර ඇත. මෙම යන්ත්‍රය සාමාන්‍යයෙන් ක්‍රියා කරනු ලබන්නේ පළමුව බෝතලය රැන්දවුම් උපාංගයක රඳවා පසුව ලේබල් යෙදුම් යාන්ත්‍රණයක් භාවිතයෙන් බෝතලය මත ලේබලය ඇලවීමෙන් වේ. ඉල්ලුම මත ලේබල් මුද්‍රණය කිරීමට සහ කැපීමට ඇති හැකියාව මෙන්ම එක් බෝතලයක ලේබල් දෙකක් ඇලවීමට ඇති හැකියාව වැනි අතිරේක විශේෂ ලක්ෂණවලින් මෙය සමන්විත වේ. විකිණීම සඳහා නිෂ්පාදන ලේබල් කිරීම සහ හඳුනා ගැනීම සඳහා බෝතල් සහ ඇසුරුම් කර්මාන්තය තුළ මෙම යන්ත්‍රය බහුලව භාවිත වේ.



රූපසටහන 6-8 ස්ටිකර් සහ ලේබල ඇල්වීමේ යන්ත්‍රය

ව්‍යාපෘතිවල විවිධ අදියරයන්හි සාරාංශ පහත වගුවෙන් දැක්වේ

වගුව 6-3 - වැඩි දියුණු කෙරෙමින් පවතින ව්‍යාපෘති

පර්යේෂණ ප්‍රතිඵලය	පීඨය	තත්ත්වය		
		මූලාකෘතිය	වැඩි දියුණු කළ	වාණිජකරණය කළ
පළතුරු සම් නිෂ්පාදනය	ඉංජිනේරු තාක්ෂණ	✓	✓	
CEJLON Green Pepper සහ සුවඳඑකුණු සෝස්	පාරිසරික හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය	✓	✓	
උදෑසන ආහාරය සඳහා Cereal bar	ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය	✓	✓	
ලාවුළු අයිස් ක්‍රීම්	පාරිසරික හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය	✓	✓	
බිම්මල් වැවීමේ කුටිය	ස්වභාවික විද්‍යා	✓		
Gameshow Buzzer System	ස්වභාවික විද්‍යා	✓	✓	
Agarwood	ස්වභාවික විද්‍යා	✓	✓	
ස්ටිකර් සහ ලේබල ඇල්වීමේ යන්ත්‍රය	ස්වභාවික විද්‍යා	✓	✓	✓

වගුව 6- 4 ආරම්භක අදියරේ ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය	පීඨය
කෙසෙල් කෙඳිවලින් නිමවූ සනීපාරක්ෂක තුවා	පාරිසරික හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය
කෙසෙල් කෙඳිවලින් නිමවූ තේ බෑග්	පාරිසරික හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය

4. සහයෝගීතාවය

වෙනත් ආයතන සමඟ ඇති කරගත් සහයෝගීතාව සහ සබඳතා පහත සඳහන් වගුවෙහි දැක් වේ.

4.1 අභ්‍යන්තර පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාව

	ව්‍යාපෘතිය	**විස්තරය**
1.	Agarwood ව්‍යාපෘතිය	Agarwood resin වාණිජකරණය කිරීමට අවශ්‍ය නීත්‍යානුකූලතාව සාකච්ඡා කිරීමට Agarwood ව්‍යාපෘතිය සඳහා පාර්ශවකරුවන් සමඟ පර්යේෂණ සහ සංවර්ධන රැස්වීමක් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් පවත්වන ලදි. ගණුදෙනුකරුවන් කිහිප දෙනෙකු සමඟ සාකච්ඡා සිදු වෙමින් පවතී.
2.	කෙසෙල් කෙඳි ව්‍යාපෘතිය	කෙසෙල් කෙඳි ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති කණ්ඩායම් සාමාජිකයින් සමඟ පර්යේෂණ සහ සංවර්ධන රැස්වීමක් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් පවත්වන ලදි. ආචාර්ය. අජිත් මදුරප්පෙරුම, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. අන්බහන් අරියදුරෙයි, පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණ අධ්‍යනාංශය, ආචාර්ය.එරික් පෙරේරා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණ අධ්‍යනාංශය, ආචාර්ය. දිලිනි විජේරත්න, අධ්‍යනාංශ ප්‍රධානී, පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණ අධ්‍යනාංශය, ආචාර්ය. චමිලා ඩයස්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාරිසරික හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය, සුභාෂිනී බාලචන්ද්‍රන්, සහකාර තාක්ෂණවේදී - SLITA, පියාලි ඩයස් මෙය, කළමනාකරු/ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය, ධනුෂ්ක බාලගුරු මෙය, ව්‍යාපෘති සංවර්ධන කළමනාකරු/ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය යන සාමාජිකයින් සමඟ රැස්වීම් කිහිපයක් සංවිධානය කරන ලදි.

4.2 බාහිර පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාව

	ව්‍යාපෘතිය	**විස්තරය**
1	සිලෝනා ග්‍රීන් නැවුරල් ෆුඩ් (පුද්) සමාගම	ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය පර්යේෂණ සහ සංවර්ධනය හරහා ව්‍යාපාර වෙත සහාය දක්වයි. සිලෝනා ග්‍රීන් නැවුරල් ෆුඩ් (පුද්) සමාගම විසින් ඔවුන් මුහුණ දෙනු ලබන කර්මාන්ත ගැටළු සඳහා සහාය ලබා දෙන මෙන් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයෙන් ඉල්ලීම් කර ඇත.
2	ආපිකෝ සුපර් සෙන්ටර්	ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් වෙළඳපොළ වෙත රැගෙන යාමට හැකියාව ඇති නිෂ්පාදන සඳහා ආපිකෝ සුපර් සෙන්ටර් සම්බන්ධ කරගන්නා ලදි. ආපිකෝ සුපර් සෙන්ටර් සමඟ රැස්වීමක් ආපිකෝ සුපර් සෙන්ටර්හි මාධව මහතා, ආචාර්ය. චමිලා ඩයස්, ආචාර්ය. ගයාන් ඉලේපෙරුම, පියාලි මෙය සහ ධනුෂ්ක මහතා සමඟ පැවැත්විණ. සහයෝගීතාවය ඇති කරගැනීමට හැකි ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡා කරන ලදි.
3	සන් ඒ (පුද්) සමාගම	බිම්මල් වැවීමේ කුටි වාණිජකරණය කිරීම සඳහා රැස්වීම් කිහිපයක් විසින් සන් ඒ (පුද්) සමාගමේ අධ්‍යක්ෂ සමඟ පවත්වන ලදි. රැස්වීම අතරතුර, වෙළඳපොළ ඉල්ලුම අඩු කළ හැකි පරිදි උසස් තත්ත්වයේ බිම්මල් වගා කිරීමේ කුටියක් නිර්මාණය කිරීම පිළිබඳ සාකච්ඡා කෙරිණ.
4 , 5	දිනූ නිෂ්පාදන, ග්‍රෝතෙක්ස් මාකටින්	පළතුරු සම් සම්බන්ධයෙන් දේශීය සහ අපනයන සමාගම් ඇතුළුව සමාගම් හවුල්කරුවන් කිහිපයක් සමඟ රැස්වීම් කිහිපයක් පැවැත්විණ. අවබෝධතා ගිවිසුම් පාලක සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

5. කර්මාන්ත චාරිකා

කර්මාන්ත සහ විශ්වවිද්‍යාල අතර සහයෝගීතාව සහ හවුල්කාරිත්වය සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය පහසුකම් සලසයි. පර්යේෂණ ව්‍යාපෘතිවලට අරමුදල් සැපයීම හා සහයෝගය දැක්වීමට මෙන්ම සමාජයට සේවයක් වශයෙන් පර්යේෂකයින්ගේ පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණය කිරීම සඳහා සහාය ලබා දීමට උනන්දුවක් දක්වන කර්මාන්ත හවුල්කරුවන් සමඟ පර්යේෂකයින් සම්බන්ධ කිරීමට හැකි ක්‍රමවේදයන් පිළිබඳ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සොයා බැලීම සිදු කරයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට ඇති අවස්ථා හඳුනා ගැනීමට් වෙනුවෙන් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ආයතන සහ පුද්ගලයින් සම්බන්ධ කර ගැනීම සිදු කරනු ලබයි.

5.1 ශ්‍රී ලංකා ටෙලිකොම් ක්ෂේත්‍ර චාරිකාව

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීමට සහාය ලබා ගැනීම සඳහා බොහෝ ආයතන සහ පුද්ගලයන් සම්බන්ධ කරගැනීම සිදු කරයි. පන්ති කාමරයට වඩා ගැඹුරින් විෂය පිළිබඳ ඉගෙන ගැනීම සඳහා අවස්ථාවක් ලබා ගැනීමට ඉංජිනේරු තාක්ෂණ පීඨය හා එක්ව ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් හා සම්බන්ධ වී ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන ලදි. මෙම ක්ෂේත්‍ර චාරිකාව මඟින් ඉංජිනේරු තාක්ෂණ පීඨයේ, විදුලි හා පරිගණක ඉංජිනේරු අධ්‍යනාංශයේ පාඨමාලාව හදාරන ශිෂ්‍යයින්ගේ අනිවාර්ය ක්‍රියාකාරකම් ආවරණය කෙරිණ.



රූපසටහන 1 - ශිෂ්‍යයින් පිළිගනිමින්



රූපසටහන 2 - ප්‍රායෝගික ලක්ෂණ විස්තර කරමින්

5.2 සිලෝනා ග්‍රීන් නැවුරල් ෆුඩ්ස් (පුද්) සමාගම වෙත කර්මාන්ත චාරිකාව



රූපසටහන 3: නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ සොයා බැලීම



රූපසටහන 4: නිලධාරීන් සමඟ පැවැත් වූ රැස්වීමක්

ඉංජිනේරු තාක්ෂණ පීඨයේ ආචාර්ය. රුමින්ද, ආචාර්ය. දුමින්ද, ආචාර්ය. විශාරා යන කථිකාචාර්යවරුන් හා එක්ව ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සිලෝනා ග්‍රීන් නැවුරල් ෆුඩ් (පුද්) සමාගමේ ඉල්ලිම පරිදි සාකච්ඡා කර ඔවුන්ගේ ව්‍යාපාර ගැටළු සඳහා විසඳුම් ලබා දීම සඳහා එහි චාරිකාවක නිරත විය. නවෝත්පාදකයින්ට රාමුවෙන් පරිබාහිරව සිතීමට සහ පාරිභෝගිකයාගේ අවශ්‍යතා සඳහා නවෝත්පාදන වෙනස් කිරීමට සහාය දැක්වීම සඳහා ව්‍යාපාරයේ අවශ්‍යතා හඳුනා ගැනීමට මෙය ඉතා වැදගත් අවස්ථාවක් විය.



රූපසටහන 5 - නැව් මාර්ගයෙන් රැගෙන යාමට සූදානම් කර ඇති නිෂ්පාදන



රූපසටහන 6 - පහසුකම් නිරීක්ෂණය කරමින්

5. සිලෝනා පේපර් පොටරි ෆුඩ්ස් (පුද්) සමාගම වෙත කර්මාන්ත චාරිකාව

CITES, ඉංජිනේරු තාක්ෂණ පීඨය සහ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථාන කළමනාකරු, සුජීව මහතා විසින් කඩදාසි කර්මාන්තයේ ස්වයං- තිරසාරත්වය සහ නිරමාණාත්මකභාවය පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා සිලෝන් පේපර් පොටරි (පුද්) සමාගම වෙත චාරිකාවක් සංවිධානය කරන ලදි. ආනයනය කරන ලද ද්‍රව්‍ය භාවිත කිරීමෙන් තොරව ස්වයං-තිරසාර වීමේ වැදගත්කම සිලෝන් පේපර් පොටරි (පුද්) සමාගමේ වැදගත් ලක්ෂණයක් වේ. පර්යේෂණ ක්ෂේත්‍රය තවදුරටත් පුළුල් කිරීමට ඇති අවස්ථා අප විසින් හඳුනා ගන්නා ලදි. නිෂ්පාදනය පුළුල් කොටසකට අලෙවි කිරීම සඳහා තොරතුරු සොයා ගැනීමට අපට අවස්ථාවක් ලැබුණු අතර එය පර්යේෂකයින් සඳහා අභිප්‍රේරණ සැසියක් විය.

6. දැනුම හුවමාරු කිරීම සහ ප්‍රචාරය

6.1 Pro-food Propack & Agbiz 2022

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය Profood Propack & Agbiz 2022 සඳහා සහභාගි විය. ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් මහජන සම්බන්ධතා අංශය සහ කෘෂිකර්ම හා වැවිලි ඉංජිනේරු අංශය හා එක්ව වෙළඳ කුටි සංවිධානය කරන ලදි. Profood Propack & Agbiz වඩාත් සවිස්තරාත්මක, ආහාර පාන සහ, ඇසුරුම් ප්‍රදර්ශනයක් විය. මෙම අවස්ථාවේ දී ආහාර ඇසුරුම් යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍ය, ඖෂධ ඇසුරුම් යන්ත්‍ර සහ ද්‍රව්‍ය, පිරවුම් සහ මුද්‍රා තැබීමේ උපකරණ, මුද්‍රණය, ලේබල් කිරීම, තීරු කේතීකරණ යන්ත්‍ර යනාදී නිෂ්පාදන ප්‍රදර්ශනය කෙරුන අතර එය 2022 නොවැම්බර් 18 සිට 20 දක්වා බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණ. අපගේ නවෝත්පාදන ආහාර නිෂ්පාදන සමඟින් අපගේ ඉලක්කගත



රූපසටහන 1- ප්‍රදර්ශන භාණ්ඩවලින් කිහිපයක්



රූපසටහන 2- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වෙළඳ කුටි වෙත පැමිණි සාමාජිකයින් කණ්ඩායම්

පාරිභෝගිකයින් වෙත යාමට මෙය ඉතා අගනා අවස්ථාවක් විය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල "Open Day"

විශ්වවිද්‍යාල සහ ශිෂ්‍යයින්ට පර්යේෂණ ක්‍රියාකාරකම් සහ ව්‍යාපාර හවුල්කරුවන් හා සම්බන්ධ වීමට හැකි ක්‍රමවේදයන් පිළිබඳ අවධානය යොමු කරන ප්‍රදර්ශන සංවිධානය කරමින් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය 2022 විශ්වවිද්‍යාල "Open Day"සඳහා සහභාගී විය. සීමාවාසික පුහුණුව සහ රැකියා අවස්ථා මෙන්ම ශිෂ්‍යයින් වෙත රැකියා පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දෙමින් සේවායෝජකයින් සමඟ සම්බන්ධතා ගොඩ නගා ගැනීමට ඔවුන්ට සහාය ලබාගත හැකි වෙනත් අවස්ථා පිළිබඳ තොරතුරු සැසිවලින් මෙය සමන්විත වේ.



රූපසටහන 3 - නිෂ්පාදනවලින් කිහිපයක්

6.3 වෙබ් සම්මන්ත්‍රණය

“Enhancing the Academia-Industry collaboration through the ILC and opportunities for commercialization” පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය 2022 දෙසැම්බර් 08 වන දින පැවැත්විණ.




රූපසටහන 5 - වෙබ් සම්මන්ත්‍රණය

6.9 අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය

අධ්‍යාපනික තාක්ෂණික අංශය (2011 සිට අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉතා වැදගත් අංශයක් වන අතර විශ්වවිද්‍යාලයට විවෘත හා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදය හරහා අධ්‍යයන වැඩසටහන් පිරිනැමීමට පහසුකම් සපයනු ලබයි. සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට පැමිණ සහභාගි වන සාම්ප්‍රදායික දේශන මෙන් නොව ස්වයං අධ්‍යයන ද්‍රව්‍ය මෙහි ප්‍රධාන ඉගෙනුම් ක්‍රමවේදයක් වේ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සියළුම අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක ප්‍රමිතීන් පවත්වාගෙන යමින් ඉගෙනුම ලබන්නන් වෙත අධ්‍යයන ද්‍රව්‍ය/ ඉගෙනුම් සම්පත් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම/ නිෂ්පාදනය කිරීම හරහා මධ්‍යස්ථානය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන ද්‍රව්‍ය/ ඉගෙනුම් සම්පත් (මුද්‍රණය කිරීම, ශ්‍රව්‍ය- දෘෂ්‍ය සහ මාර්ගගත) සඳහා තත්ත්ව පාලන මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් නිර්මාණය කිරීම සහ මාර්ගගත පඨමාලා ඇතුළුව සියළුම අධ්‍යයන වැඩසටහන් අධීක්ෂණය කිරීම සඳහා මධ්‍යස්ථානය වගකීම දරනු ලබයි. තවද, දිවයින පුරා විසිරී සිටින විවිධ ඉගෙනුම ලබන්නන් සඳහා උසස් තත්ත්වයේ ඉගෙනුම් සම්පත් සංවර්ධනය කරමින් විශේෂයෙන් දුරස්ථව ඉගෙනුම ලබන්නන්ට ගැළපෙන පරිදි ඉගෙනුම් සම්පත් රචනය/ නිර්මාණය කිරීම/ නිෂ්පාදනය කිරීමට අදාළව විවෘත හා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදය භාවිතයෙන් අධ්‍යයන වැඩසටහන් පිරිනැමීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හැකියාවන් වැඩි දියුණු කිරීම වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා ද වගකීමෙන් කටයුතු කරයි. අධ්‍යයන ද්‍රව්‍ය/ ඉගෙනුම් සම්පත සහ මාර්ගගත පාඨමාලා සංවර්ධනය කිරීම හරහා පීඨ 6 සඳහාම සේවාවන් සපයනු ලබයි.

1980 දී ශ්‍රව්‍ය දෘශ්‍ය කුටියක් ලෙස ආරම්භ කර 2011 දී අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය දක්වා පුළුල් කිරීම රූපසටහන 1 මඟින් දැක්වේ.



රූපසටහන 1 - 1980 දී ශ්‍රව්‍ය දෘශ්‍ය කුටියක සිට 2011 දී මධ්‍යස්ථානයක් දක්වා ශක්තිමත් කිරීම

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ අභියෝග සමඟින් 2022 වර්ෂය තුළ අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් සිදු කළ මුල පිරීම්, ජයග්‍රහණ සහ ක්‍රියාකාරකම් පිළිබඳ මීළඟ පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ.

2. 2022 වර්ෂය තුළ ආරම්භ කළ කටයුතු

- මානව සම්පත්, යටිතල පහසුකම් සහ භෞතිකවල ඇති පරතරය විශ්ලේෂණය කිරීමෙන් පසු මධ්‍යස්ථානය ශක්තිමත් කිරීමට පියවර ගත් අතර යෝජිත මැදිහත්වීම් සඳහා සනාතන සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදි.
- මධ්‍යස්ථානය මඟින් කේවල පාඨමාලා පිරිනැමීම ආරම්භ කළ අතර පහත සඳහන් කේවල පාඨමාලා 2 ක්‍රියාත්මක කිරීම සඳහා සනාතන සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදි.
- ඩිජිටල් ඉගෙනුම් පිළිබඳ කේවල පාඨමාලාව (CMS235)- 2023 ජනවාරි 21 ආරම්භ කරනු ලැබේ.
- බහු කැමරා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ කේවල පාඨමාලාව (CMSA34)
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සන්නාමය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සන්නාමය එහි සියළුම ආයතන හරහා ස්ථාවර බව සහතික කිරීම සඳහා සන්නාම ප්‍රමිතීන් සැලසුම් කිරීම
- අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයෙහි ලාංඡනය නැවත සන්නාම කිරීම.
- මධ්‍යස්ථානයේ ක්‍රියාවලිවල ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා ලේඛනගත කිරීම සහ පහසුවෙන් ලබා ගැනීම සඳහා ඩිජිටල්කරණය, සුචිගත කිරීම සහ ඩිජිටලකරණය කළ ගබඩා ස්ථාපිත කිරීම.
    - ලුහුඬු සහ අනෙකුත් ලේඛන වැනි නිල text-based ලේඛන සංරක්ෂණය කිරීම සඳහා text-based ගබඩාව.
    - දැනට ඇල්බම්වල ගබඩා කර ඇති වසර හතළිස් දෙකක කාලයක් තුළ එක් රැස් කරන ලද ඩිජිටල් ඡායාරූප සඳහා ගබඩාව (image repository)
    - ඩිජිටල් කළ වීඩියෝ දර්ශන/ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වීඩියෝ සංරක්ෂණය සඳහා වීඩියෝ ගබඩාව
    - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි ඩිජිටල් කළ ශ්‍රව්‍ය නිෂ්පාදන කිරීම සඳහා ශ්‍රව්‍ය ගබඩාව
- සමාජ මාධ්‍ය; විශේෂයෙන් Youtube හරහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය දෘශ්‍යතාව වර්ධනය කිරීම සඳහා පියවර ගන්නා ලදි.
    - "OpenUtube" නිල යූටුබ් නාලිකාවේ මුල් නම "The Open University of Sri Lanka – OUSL" (search කිරීම සඳහා බොහෝ දෙනා පොදුවේ භාවිත කරන යෙදුම එය බැවින්) වෙනස් කරන ලදි
    - ආකර්ෂණීය බැනරයක්, පිරිසැලසුම, thumbnails සැලසුම් කිරීම, සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය නිල නිල Youtube නාලිකාව සඳහා යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.
    - ප්‍රවර්ධන වීඩියෝ වැඩසටහන් හරහා මහජනතාව ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය Youtube නාලිකාවේ දෘශ්‍යතාව ඉහළ නැංවීමට පියවර ගැනීම.
    - උත්සව/ අධ්‍යයන ක්‍රියාකාරකම් සජීවීව විකාශය කිරීම සඳහා අතිරේක Youtube නාලිකාවක් නිර්මාණය කිරීම.
    - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය නාලිකාව කාර්යක්ෂම කිරීමට පියවර ගැනීම.
    - වැනි සමාජ මාධ්‍ය ජාල එකට එකතු කිරීම.
    - සංගීතය, කලාව, සාහිත්‍ය අගය කරමින් ඒ සඳහා අවධානය යොමු කරවීම සඳහා ඉගෙනුම් සංසදයක් නිර්මාණය කරමින් වර්තමාන ගැටළුවලට අදාළ පුළුල් පරාසයක විෂයන් ආවරණය වන පරිදි විවිධ පැතිකඩ පිළිබඳ දැනුම බෙදා හැරීම සඳහා (නැණ පුබුදුව, වනික් පුබුදුව, මන පුබුදුව සහ රස පුබුදුව) යන කොටස් 4න් යුත් ''පුබුදුව'' ශ්‍රව්‍ය සඟරාව හරහා දැනුම හුවමාරු කර ගැනීම වෙනුවෙන් ශ්‍රව්‍ය මාධ්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලදි.

3. තිළිණ

2022 වර්ෂය සඳහා අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සාමාජිකයින් විසින් ලබා ගන්නා ලද තිළිණ පිළිබඳ මෙම පරිච්ඡේදයෙන් ආවරණය කෙරේ.

3.1 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය තිළිණ

ටී.කේ. ද සේරම්; අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ ශ්‍රව්‍ය- දෘශ්‍ය තාක්ෂණ නිලධාරී විසින් මහාචාර්ය. එන්.එන්. පුංචිහේවා (සත්ත්ව විද්‍යා අධ්‍යනාංශය)සමඟ සම- අධ්‍යක්ෂණය කළ ''Aquatic Ecosystems'' වීඩියෝ වැඩසටහන සඳහා 2021 හොඳම අධ්‍යාපනික විඩියෝව නිෂ්පාදනය වෙනුවෙන් වන තිළිණය ලබා ගන්නා ලදි.

3.2 ජාතික තිළිණ

මෙම වර්ෂයේදී ද, අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ නිරූපණකරු සමිත් දළදාවත්ත මහතා විසින් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ඡායාරූපකරණය කාණ්ඩය යටතේ "Inter Public Employee Creative Skills Competition" 2022 හි පළමු ස්ථානය හා කුසලතා තිළිණය දිනා ගත්තා ලදි.: රූපසටහන 2(අ) සහ 2(ආ)



රූපසටහන 2(අ) සමිත් දළදාවත්ත මහතා තිළිණ ලබා ගනිමින්



රූපසටහන 2(ආ) සම්මානලාභී ඡායාරූපය

4. 2022 වර්ෂය තුළ ජයග්‍රහණ

පසු ගිය වර්ෂ 7 තුළ අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයට කාර්ය මණ්ඩල සමාජිකයින් හිඟ වූ අතර පසුගිය වර්ෂයේදී නිරූපණකරුවන් දෙදෙනෙක් සහ තාක්ෂණික නිලධාරීන් 8 දෙනෙක් බඳවා ගන්නා ලදි. ඇතැම් පුරප්පාඩු පිරවීමට නියමිත වේ. එහි සේවාවන්වල කාර්ය සාධනය වර්ධනය කිරීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සහ වෙනත් අදාළ උපකරණ මිළදී ගන්නා ලදි. එසේම, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා නිර්මාණාත්මක දෘශ්‍ය කලා සැලසුම් නිර්මාණය කරමින් එහි ශ්‍රව්‍ය දෘශ්‍ය නිෂ්පාදනවල ප්‍රධානත්වය ගැනීමට මධ්‍යස්ථානයට හැකි විය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට සැලකිය යුතු මුදලක් ඉතුරු කරමින් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ නඩත්තු කිරීමේ කටයුතු මධ්‍යස්ථානය විසින් නැවත ආරම්භ කරන ලදි. (රූපසටහන 3)



රූපසටහන 3 - ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික නිලධාරී; ඩබ්ලිව්.ඒ.ඩී ලක්ෂාන් විසින් ශ්‍රව්‍ය දෘශ්‍ය අළුත්වැඩියා කිරීම් නැවත ආරම්භ කිරීම

මධ්‍යස්ථානයේ නිෂ්පාදන ඒකකය විසින් පහත සඳහන් කටයුතු සිදු කරන ලදි:

- අධ්‍යාපනික වීඩියෝ 6ක් වැඩමුළු නිෂ්පාදන 3ක් සහ අධ්‍යනාංශ නිෂ්පාදන 3ක් සම්පූර්ණ කරන ලදි.

- පීඨ 4ක් (සෞඛ්‍ය විද්‍යා පීඨය, කළමනාකරණ පීඨය, සමාජ විද්‍යා පීඨය සහ ඉංජිනේරු තාක්ෂණ පීඨය) සඳහා ප්‍රවර්ධන වීඩියෝ නිර්මාණය කර නිෂ්පාදනය කරන ලද අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය Youtube නාලිකාවට ඇතුළත් කරන ලදි. අධ්‍යාපන සහ ස්වභාවික විද්‍යා පීඨවල ප්‍රවර්ධන වීඩියෝවල ප්‍රථම පිටපත 2022 ඔක්තෝබර් 10 වන දින Open Day හීදී ප්‍රදර්ශනය කරන ලදි.
- අධ්‍යනාංශ සඳහා ප්‍රවර්ධන වීඩියෝ 3ක් සහ අධ්‍යයන වැඩසටහන් 4ක් නිර්මාණය කර නිෂ්පාදනය කරන ලදි.
- 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සත්කාරකත්වය දරන ලද ප්‍රධාන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 2ක් සහ දේශීය උත්සවයක සජීවී වීඩියෝ ආවරණය කිරීම සිදු කරන ලදි.

    - 2022 මාර්තු 31 දින සිට අප්‍රේල් 1 වන දින දක්වා අලෙවිකරණය පිළිබඳ ප්‍රථම ජාත්‍යන්තර සම්මන්ත්‍රණය පැවැත්වුණු අතර සමාරම්භක උත්සවයේ වීඩියෝ ආවරණය ZOOM තාක්ෂණය ඔස්සේ උචිත වීඩියෝ සජීවීකරණය සහිතව විකාශනය කරන ලදි.

    - 2022 විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසි පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2022 නොවැම්බර් 10 සහ 11 දිනවල ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේදී පැවැත්විණ. බැනර, අත් පත්‍රිකා, ආරාධනා පත්‍ර, සම්මන්ත්‍රණ ක්‍රියාවලියට අවශ්‍ය පිටකවර, සජීවීකරණ, වීඩියෝ ආවරණය ආදිය සඳහා අදාළ

සියළුම ඉල්ලීම් සම්පූර්ණයෙන්ම සපයමින් මෙම සැසි සඳහා අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය සහාය දක්වන ලදි. රූපසටහන් 4(අ) - (ඈ) මඟින් නිදසුන් කිහිපයක් දක්වා ඇත.

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය බකීබෝල් සමාජය සහ Sri Lanka Association for the Advancement of Science (SLAAS) සංගමයේ Section E2 විසින් සංවිධානය කරන ලද 2022 - පිළිබඳ අන්තර් විශ්වවිද්‍යාල සහ අන්තර්- පාසල් තරඟාවලියේ තිළිණ ප්‍රදානෝත්සවය 2022 සැප්තැම්බර් 10 වන දින පැවැත්විණ.



රූපසටහන 4(අ): අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ නිරූපණකරු එස්. දළදාවත්ත මහතා විසින් නිර්මාණය කළ 2022 විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසියෙහි අත්පත්‍රිකා



රූපසටහන 4(ආ): අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ නිරූපණකරු එස්. දළදාවත්ත මහතා විසින් නිර්මාණය කළ ආරාධනා පත්‍රය

5. අධ්‍යයන සහ පර්යේෂණ ඒකකය විසින් පවත්වන ලද ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඵලදායී විවෘත හා දුරස්ථ ඉගෙනුම් වෘත්තිකයින් බවට පරිවර්තනය වෙමින් ඵලදායී ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන වැඩසටහන් ලබා දීමට ඇති හැකියාව වර්ධනය කිරීම සඳහා ශක්‍යතා ගොඩ නැංවීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වගකීමක් වේ. මෙම පුහුණු වැඩසටහන් වන්නේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් පිළිබඳ හැඳින්වීම, ස්වයං- අධ්‍යයන ද්‍රව්‍ය රචනා කිරීම, ශ්‍රව්‍ය- දෘශ්‍ය ඉගෙනුම් සම්පත් නිෂ්පාදනය කිරීම, මාර්ගගත ඉගෙනුම් ආදිය වේ.

5.1 පාඨමාලා සැලසුම්කරණය සහ සංවර්ධනය (මුද්‍රණය කිරීම, මාර්ගගත ශ්‍රව්‍ය දෘශ්‍ය පිළිබඳ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන් වැඩසටහන් පැවැත්වීම



රූපසටහන 5: CITES කාර්ය මණ්ඩලය සඳහා ආචාර්ය. සමීර තිලකවර්ධන විසින් පවත්වන ලද වීඩියෝ නිෂ්පාදන වැඩමුළුව

වගුව 1; 2022 දී අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් පවත්වන ලද අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ලැයිස්තුව

දිනය	පීඨය
2022.01.11 – 9.30 – 3.30 ප.ව (දින 6)	ස්වභාවික විද්‍යා පීඨයේ සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වීඩියෝ නිෂ්පාදන වැඩමුළුව - සහභාගිවන්නන් 10
29.03.2022 – 9.30 – 3.30 ප.ව (දින 1)	මූඩ්ල් භාවිතයෙන් මාර්ගගත පාඨමාලා සැලසුම්කරණය සහ සංවර්ධනය. ස්වභාවික විද්‍යා සහ සෞඛ්‍ය විද්‍යා පීඨ සඳහා පවත්වන ලදි.
30.03.2022 –9.30–3.30 ප.ව. (දින 2)	මූඩ්ල් භාවිතයෙන් මාර්ගගත පාඨමාලා සැලසුම්කරණය සහ සංවර්ධනය. ස්වභාවික විද්‍යා සහ සෞඛ්‍ය විද්‍යා පීඨ සඳහා පවත්වන ලදි.
2022.04.01 – 9.30–3.30 ප.ව (දින 3)	මූඩ්ල් භාවිතයෙන් මාර්ගගත පාඨමාලා සැලසුම්කරණය සහ සංවර්ධනය. ස්වභාවික විද්‍යා සහ සෞඛ්‍ය විද්‍යා පීඨ සඳහා පවත්වන ලදි.

30.05.2022 –1.00 –3.00 ප.ව (onsite)	විවෘත හා දුරස්ථ ඉගෙනුම් සඳහා පාඨමාලා අන්තර්ගත සංවර්ධන ආකෘති - කළමනාකරණ අධ්‍යයන පීඨය
2022.08.09	මූඩ්ල් භාවිතයෙන් මාර්ගගත පාඨමාලා සැලසුම්කරණය සහ සංවර්ධනය නවක වැඩමුළු. Zoom තාක්ෂණය ඔස්සේ සමාජ විද්‍යා අධ්‍යනාංශය සඳහා පවත්වන ලදි.
2022.08.30 10.00 පෙ.ව – 1.00 ප.ව	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය විවෘත අධ්‍යාපන සම්පත් (OER) ලෙස විශ්වවිද්‍යාලයීය පාඨමාලා ද්‍රව්‍ය ප්‍රකාශයට පත් කිරීම සඳහා OUSL OER Policy and Standard Operating Procedures (SOPs)පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු සැසි. විදුලි හා පරිගණක ඉංජිනේරු අධ්‍යනාංශය සඳහා පවත්වන ලදි. (onsite)
2022.10.07 10.00 පෙ.ව - 1.00 ප.ව	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය House Style පිළිබඳ ප්‍රායෝගික සැසිය (කණ්ඩායම A)
2022.10.12 1.00 ප.ව - 3.30 ප.ව	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය House Style පිළිබඳ ප්‍රායෝගික සැසිය (කණ්ඩායම B)
2022.11.03 9.30 පෙ.ව – 3.30 ප.ව	CITES කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද වීඩියෝ නිෂ්පාදන වැඩමුළුව (රූපසටහන 5)

මීට අමතරව, 2022 වර්ෂය සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද පහත සඳහන් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සම්පත් දායකයන් වශයෙන් තම සේවාවන් ලබා දෙන ලදි. (2 වගුව)

- විවෘත හා දුරස්ථ ඉගෙනුම් පිළිබඳ නම්නීකරණය - නව බඳවා ගැනීම් (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන/ අනධ්‍යයන කාර්ය මණ්ඩලය) සඳහා පවත්වන ලදි.

- උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - විවෘත හා දුරස්ථ අධ්‍යාපනය, පාඨමාලා රචනය, මාර්ගගත පාඨමලා සංවර්ධනය ආදිය පිළිබඳ දැනුවත් කිරීම. අධ්‍යාපනික තාක්ෂණ හා පාඨමාලා සැලසුම්කරණ හා සංවර්ධනය පිළිබඳ මොඩියුල සඳහා මොඩියුල සම්බන්ධීකාරකවරුන් ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සේවය කරන ලදි.

- ජ්‍යෙෂ්ඨ නම්නීකරණ වැඩසටහන - විවෘත හා දුරස්ථ ඉගෙනුම්, පාඨමාලා රචනය, මාර්ගගත පාඨමාලා සංවර්ධනය ආදිය පිළිබඳ දැනුවත් කිරීම.

- සන්නිවේදන කුසලතා වැඩසටහන - ඉංග්‍රීසි (උසස් පෙළ)

වගුව 2; 2022 දී CPD වැඩසටහන් පැවැත්වීම සඳහා SDC වෙත සපයනු ලබන සේවාවන්

දිනය සහ වේලාව	පුහුණු සැසිය
2022 ජූනි 16 - 2.00 - පිව. 4.15 (onsite)	පාඨමාලා සැලසුම් කිරීම සහ සංවර්ධනය පිළිබඳ දළ විශ්ලේෂණයක් CTHE වැඩසටහන 2022 - SDC විසින් පවත්වනු ලබන පාඨමාලා සැලසුම් සහ සංවර්ධන (V) - දින 1
2022 ජූනි 23- 2.00 - ප.ව.4.15 (ZOOM)	පාඨමාලා සැලසුම් සහ සංවර්ධන ක්‍රියාවලිය CTHE වැඩසටහන 2022 - SDC විසින් පවත්වනු ලබන පාඨමාලා සැලසුම් සහ සංවර්ධන (V) - දිනය 2
2022 ජූන30 - 1.00 - ප.ව.4.15 (ZOOM)	පාඨමාලා සැලසුම් සහ සංවර්ධන ක්‍රියාවලිය (අඛණ්ඩව) CTHE වැඩසටහන 2022 - SDC විසින් පවත්වනු ලබන පාඨමාලා සැලසුම් සහ සංවර්ධන (V) - දින 3
2022 ජූලි 7 - 1.00 - ප.ව.4.15 (ZOOM)	වැඩසටහන්, පාඨමාලා සහ සැසි සඳහා ඉගෙනුම් ප්‍රතිඵල ලිවීම CTHE වැඩසටහන 2022 - SDC විසින් පවත්වනු ලබන පාඨමාලා සැලසුම් සහ සංවර්ධන (V) - දින 4
2022 ජූලි 14 - . 10.30 - ප.ව 2.00(ZOOM)	ස්වයං-උපදෙස් ද ද්‍රව්‍යයවල තත්ත්ව සහතිකය අධ්‍යාපනයේ තාක්ෂණය භාවිතය - MOODLE Learning Management System' CTHE වැඩසටහන 2022 - SDC විසින් පවත්වනු ලබන පාඨමාලා සැලසුම් සහ සංවර්ධන (V), Moodle (VI) - දින 5
2022 මාර්තු 23 සිට 2022 ඔක්තෝබර් 12 දක්වා (දින 12)	සන්නිවේදන කුසලතා වැඩසටහන ඉංග්‍රීසි, උසස් පෙළ 23.3.2022, 30.3.2022, 6.4.2022, 27.4.2022, 25.5.2022, 1.6.2022, 8.6.2022, 17.8.2022, 24.8.2022, 24.8.2022, 23.8.2022, 23.2.72 0.2022

5.2 භාෂාව සහ පිටපත් සංස්කරණය

වර්තමානයේ, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථ සහ ප්‍රකාශනවල භාෂාව සහ පිටපත් සංස්කරණය සඳහා අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු විසින් වගකීම් දරනු ලබයි. (රූපසටහන 6අ සහ 6 ආ). 3 සහ 4 වගුව මගින් OUSL පාඨමාලා ද්‍රව්‍යවල පිටපත් සංස්කරණය කරන ලද සැසි සංඛ්‍යාව පිළිවෙලින් ඉංග්‍රීසි සහ සිංහල භාෂාවෙන් දැක්වේ.



රූපසටහන 6අ - මයන්ති කුලතුංග ජයකොඩි මෙය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ඉංග්‍රීසි පාඨ ග්‍රන්ථවල භාෂාව සහ පිටපත් සංස්කරණය කිරීම.



රූපසටහන 6ආ - දිනෙති රණසිංහ මෙය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සිංහල පාඨ ග්‍රන්ථවල භාෂාව සහ පිටපත් සංස්කරණය කිරීම.

වගුව 3 : 2022 වර්ෂයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථවල පිටපත් සංස්කරණය කරන ලද සැසි සංඛ්‍යාව

මාසය	පීඨය	පාඨමාලා කේතය	සැසි	මුළු සැසි සංඛ්‍යාව
ජනවාරි	සෞඛ්‍ය විද්‍යා පීඨය	Pharmacognosy	සැසි 18	
	සෞඛ්‍ය විද්‍යා පීඨය	BSU4340	සැසි 14, අතිරේක – 5	19
පෙබරවාරි	සෞඛ්‍ය විද්‍යා පීඨය	BSU5335 (Block I)	සැසි 9, අතිරේක – 1	10
	සෞඛ්‍ය විද්‍යා පීඨය	BSU5335 (Block II)	සැසි 8, අතිරේක – 1	9
මාර්තු	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය (සමාජ අධ්‍යයන)	DSU4267 (Block I)	සැසි 8, අතිරේක - 2	10
	අධ්‍යාපන (ද්විතීයික හා තෘතීයික)	STP8302	සැසි 11	11
අප්‍රේල්	ස්වභාවික විද්‍යා	FND3606 (Block I)	සැසි 10, අතිරේක - 1	11
මැයි	ස්වභාවික විද්‍යා	FND3606 (Block II)	සැසි 7, අතිරේක - 1	8
	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය (නීති)	LLU3502	සැසි 10	10
	සෞඛ්‍ය විද්‍යා පීඨය (හෙද විද්‍යා)	NGU6305	සැසි 12, අතිරේක – 5	17
ජූනි	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය (සමාජ අධ්‍යයන)	DSU4561 (Block I)	සැසි 10, අතිරේක 2	12
	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය (සමාජ අධ්‍යයන)	DSU4561 (Block II)	සැසි 10, අතිරේක l 2	12
ජූලි	සෞඛ්‍ය විද්‍යා පීඨය (හෙද විද්‍යා)	NGU5207	සැසි 14	14
අගෝස්තු	සෞඛ්‍ය විද්‍යා පීඨය (හෙද විද්‍යා)	NGU5302	සැසි 10	10
	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය (සමාජ අධ්‍යයන)	DSU4562 (Block II)	සැසි 10, අතිරේක 2	12
	ඉංජිනේරු තාක්ෂණ (විදුලි)	EFX3336	සැසි 3	3
සැප්තැම්බර්	සෞඛ්‍ය විද්‍යා පීඨය (වෛද්‍ය රසායනගාර විද්‍යා)	MDU6302	සැසි 14, අතිරේක 1	15
	ඉංජිනේරු තාක්ෂණ (පේෂකර්ම සහ ඇඟළුම්)	TAK3237	සැසි 6, අතිරේක 2	8
ඔක්තෝබර්	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය (සමාජ අධ්‍යයන)	DSU4564	සැසි 13, අතිරේක 4	17

	සෞඛ්‍ය විද්‍යා පීඨය (වෛද්‍ය රසායනගාර විද්‍යා)	MDU4303	සැසි 13	13
	සෞඛ්‍ය විද්‍යා පීඨය (වෛද්‍ය රසායනගාර විද්‍යා)	MDU6503 (Block I)	සැසි 11	11
නොවැම්බර්	සෞඛ්‍ය විද්‍යා පීඨය (වෛද්‍ය රසායනගාර විද්‍යා)	MDU4302	සැසි 15	15
	සෞඛ්‍ය විද්‍යා පීඨය (වෛද්‍ය රසායනගාර විද්‍යා)	MDU6503	සැසි 13	13
දෙසැම්බර්	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය (සමාජ අධ්‍යයන)	DSU4365	සැසි 10, අතිරේක 1	11
	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය (සමාජ අධ්‍යයන)	DSU4368 (Block I)	සැසි 12, අතිරේක 1	13
මුළු සංඛ්‍යාව				**302**

වගුව 4 මගින් සිංහලෙන් පිටපත් සංස්කරණය කරන ලද සැසි සංඛ්‍යාව දැක්වේ.

වගුව 4: 2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථවල (සිංහල) පිටපත් සංස්කරණය කරන ලද සැසි සංඛ්‍යාව

මාසය	පීඨය	පාඨමාලා කේතය	සැසි	මුළු සැසි සංඛ්‍යාව
ජනවාරි	අධ්‍යාපන (ද්විතීයික සහ තෘතීයික)	STP8404	සැසි 2, Articles 8 (Adeekshaa Magazine)	10
පෙබරවාරි	-			-
මාර්තු	අධ්‍යාපන (ද්විතීයික සහ තෘතීයික)	STU5817	සැසි 5	5
අප්‍රේල්/ මැයි/ ජූනි	-			-
ජූලි	අධ්‍යාපන (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)	SNP8340	සැසි 3	8
	අධ්‍යාපන (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)	SNP8442	සැසි 4	
	අධ්‍යාපන (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)	SNP8441	සැසි 1	
අගෝස්තු	අධ්‍යාපන (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)	SNP8340	සැසි 2	2
සැප්තැම්බර්	අධ්‍යාපන (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)	SNP8341 SNP8443	සැසි 1 සැසි 2	3
ඔක්තෝබර්	අධ්‍යාපන (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)	SNP8443	සැසි 4	5
	අධ්‍යාපන (ද්විතීයික සහ තෘතීයික)	STP8211	සැසි 1	
නොවැම්බර්	අධ්‍යාපන (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)	SNP8443	සැසි 2	2
දෙසැම්බර්	අධ්‍යාපන (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)	SNP8443	සැසි 1	1
මුළු සංඛ්‍යාව				**36**

වගුව 5: 2022 වර්ෂය සඳහා ලබා ගෙන ඇති ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථ ලැයිස්තුව

දිනය	පීඨය	අධ්‍යනාංශය	ඒකකයේ නම	ISBN
2022.03.23	සෞඛ්‍ය විද්‍යා	හෙද විද්‍යා	මහජන සෞඛ්‍ය හෙද විද්‍යා (Block 1)	01
2022.04.21		හෙද විද්‍යා	මනෝ චිකිත්සාව සහ මහජන සෞඛ්‍ය හෙද විද්‍යා (Block 1)	01
2022.05.25	ඉංජිනේරු තාක්ෂණ	විදුලි හා පරිගණක ඉංජිනේරු	උපකරණ සැකසීම (Unit III)	01
2022.08.02	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	සමාජ අධ්‍යයන	ව්‍යාපෘති සැලසුම් කිරීම අධීක්ෂණය සහ ඇගයීම (Block 1)	01
2022.08.23		සමාජ අධ්‍යයන	තරුණ හා සංවර්ධන කටයුතු: පුද්ගලික හා වෘත්තීය සංවර්ධනය -(Block 1)	01
2022.08.02	ස්වභාවික විද්‍යා	උද්භිද විද්‍යා	ශාක විද්‍යාවේ මූලික මූලධර්ම (Unit I) ශාක විද්‍යාවේ ප්‍රායෝගික යෙදුම් (Unit II)	02
2022.08.02		සත්ත්ව විද්‍යා	සතුන් සහ ඔවුන්ගේ නිදර්ශක (Block 1)	01
2022.08.23		සත්ත්ව විද්‍යා	රසායනාගාර සංවිධානය, කළමනාකරණය සහ සුරක්ෂිතභාවය (Unit I)	01
		මුළු සංඛ්‍යාව		09

5.3 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථවල තත්ත්ව සහතික කිරීම

ISBN ලබා ගැනීමට පෙර පහත සඳහන් පාඨ ග්‍රන්ථ සමාලෝචනය කරන ලද අතර පාඨ ග්‍රන්ථ 5 වගුවේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරන ලදි.ඃ

5.4 මාර්ගගත පාඨමාලා සැලසුම්කරණය, සංවර්ධනය, තත්ත්ව සහතික කිරීම සහ නිල මාර්ගගත වේදිකාව වන "LearnOUSL" වෙත ඇතුළත් කිරීම.

2007 වර්ෂයේ සිට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සියළුම මාර්ගගත පාඨමාලාවල වැඩසටහන් සම්බන්ධීකරණය, මාර්ගගත පාඨමාලා සැලසුම්කරණය, සංවර්ධනය, තත්ත්ව සහතික කිරීම සහ නිල මාර්ගගත වේදිකාව වන "LearnOUSL" වෙත ඇතුළත් කිරීම වැනි මාර්ගගත පාඨමාලා සංවර්ධනයට අදාළ සියළුම කටයුතු අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය වෙත පැවරී ඇත. අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයට අනුයුක්ත ප්‍රදර්ශකවරුන් 10 දෙනෙකුගේ සහාය ඇතිව තම මාර්ගගත පාඨමාලා සංවර්ධනය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත සහාය දැක්වීම අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි.





රූපසටහන 7අ සහ 7ආ: 2022 වර්ෂයේ අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ පරිගණක රසායනාගාරයේ දී මාර්ගගත පාඨමාලා සැලසුම්කරණය සහ සංවර්ධනය

2022 වර්ෂය සඳහා සැලසුම්කරණය, සංවර්ධනය සහ තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලියට ලක් කිරීමෙන් පසු "LearnOUSL" වෙත ඇතුළත් කළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මාර්ගගත පාඨමාලාවල ප්‍රගතිය 6 වගුවෙන් දැක්වේ.

අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සමාලෝචනය කිරීමෙන් පසු මාර්ගගත පාඨමාලාවල ප්‍රගති වාර්තාව “LearnOUSL” වෙත ඇතුළත් කරන ලදි.

මාසය	2022/2023 අධ්‍යයන වර්ෂය	2021/2022 අධ්‍යයන වර්ෂය	2020/2021 අධ්‍යයන වර්ෂය	2019/2020 අධ්‍යයන වර්ෂය	මුළු සංඛ්‍යාව
ජනවාරි	5	79	627	572	1283
පෙබරවාරි	5	91	638	572	1306
මාර්තු	5	98	639	572	1314
අප්‍රේල්	5	111	684	572	1372
මැයි	7	279	692	572	1550
ජූනි	14	458	696	577	1745
ජූලි	23	510	697	579	1809
අගෝස්තු	36	593	700	584	1913
සැප්තැම්බර්	38	615	705	584	1942
ඔක්තෝබර්	61	624	707	584	1976
නොවැම්බර්	144	674	707	584	2109
දෙසැම්බර්	166	678	707	584	2135

6. නිෂ්පාදන ඒකකය විසින් පවත්වන ලද ක්‍රියාකාරකම්

උපාධි ප්‍රදානෝත්සවය සහ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය ඇතුළුව විශ්වවිද්‍යාලයේ සියළුම වැදගත් අවස්ථාවල ශ්‍රව්‍ය දෘෂ්‍ය ආවරණ කිරීම, ශ්‍රව්‍ය දෘෂ්‍ය අධ්‍යයන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම පීඨ/ අධ්‍යනාංශ/ අධ්‍යයන වැඩසටහන් සඳහා ප්‍රවර්ධන වීඩියෝ, පීඨ 6 සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යයන ද්‍රව්‍ය/ ඉගෙනුම් සම්පත් නිෂ්පාදනය කිරීම සඳහා අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය කටයුතු කරයි. (රූපසටහන 8අ - 8 ආ)



රූපසටහන 8අ: මැදිරි සංකීර්ණය තුළ පටිගත කිරීම



රූපසටහන 8ආ: පාලන මැදිරිය තුළ පටිගත කිරීම




රූපසටහන 8ඇ: වීඩියෝ ආවරණය



රූපසටහන් 8 ඇ: "පුබුදුව" 2022 වර්ෂයේ දී බුද්ධි ගලප්පත්ති මහතා සමඟ ශ්‍රව්‍ය මැදිරියේ දී ශ්‍රව්‍ය සඟරාව පටිගත කිරීම

මීට අමතරව, අධ්‍යාපන හා තාක්ෂණික මධ්‍යස්ථානයේ දෘෂ්‍ය කලා අංශය මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය සඳහා ග්‍රැෆික් නිර්මාණය කිරීම සහ සජීවිකරණ සැලසුම් කිරීම යන කටයුතු සිදු කරයි. වීඩියෝ නිෂ්පාදන සඳහා ආධාරක (props) ඔවුන් සැලසුම් කරනු ලබයි. අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ දෘශ්‍ය කලා අංශය විසින් කළ නිර්මාණ කිහිපයක් රූපසටහන් 9අ-9ඈ මගින් දැක්වේ.



රූපසටහන 9අ: එස්. ජයලත් මහතා විසින නිර්මාණය කරන ලද පොත් කවරය



රූපසටහන 9ආ: එන්.කේ. අලහේන්ද්‍ර විසින් නිර්මාණය කරන ලද පොත් කවරය



රූපසටහන 9ඇ: එස්. දළදාවත්ත මහතා විසින් නිර්මාණය කරන ලද පුවත්පත් වෙළඳ දැන්වීම



රූපසටහන 9ඈ: එස්. දළදාවත්ත මහතා විසින් නිර්මාණය කරන ලද අත් පත්‍රිකාව

නිෂ්පාදන ඒකකයේ කාර්යයන් ලැයිස්තුව 7 සහ 8 වගුවලින් දැක්වේ.

වගුව 7: දෘශ්‍ය කලා අංශය විසින් සිදු කරන ලද කාර්යයන්

කාර්යයන්	ජ	පෙ	මා	අ	මැ	ජූ	ජූ	අ	සැ	ඔ	නො	දෙ	මුළු සංඛ්‍යාව
අත් පත්‍රිකා/ බැනර්/ පෝස්ටර්/ ආරාධනා පත්‍ර/ ලිපි ශීර්ෂ නිර්මාණය කිරීම	1	10	6	1	3	3	2	5	2	3	6	5	47
පුවරු නිර්මාණය කිරීම						2			1				3
2022 විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසි සඳහා සහතිකපත්‍ර නිර්මාණය කිරීම								1			1	1	3
2022 විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසි සඳහා ජෝගු මුද්‍රණය කිරීම										1			1

ලාංඡන නිර්මාණය කිරීම						1		1		1	1		4
පොත් කවර නිර්මාණය කිරීම		1		1				2	1			1	6
අත් පත්‍රිකා/ මාර්ගෝපදේශ ග්‍රන්ථ/ විවරණිකා නිර්මාණය කිරීම		1	1					1	2				5
පුවත්පත් වෙළඳ දැන්වීම් නිර්මාණය කිරීම		1		1									2
විවෘත තෛමාසික සඟරාව නිර්මාණය කිරීම හා පිරිසැලසුම (පිටු 42)									1				1
ග්‍රන්ථ නිර්මාණය කිරීම සහ පිරිසැලසුම											1		1
රූපරාමු සංස්කරණය		1		16									17
සමූහ ඡායාරූප සංස්කරණය		1	1								2		4
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය හැඳුනුම්පත්/ කාර්ය මණ්ඩල ඡායාරූප සංස්කරණය		2	8	8	5	21	15	14	3	22		22	120
උපාධි ප්‍රදානෝත්සව ඡායාරූප සංස්කරණය	8	63	138	140	62			41	58			16	526
Year Planner නිර්මාණය කිරීම												1	1

වගුව 8: නිෂ්පාදන අංශය විසින් සිදු කරන ලද කාර්යයන් ලැයිස්තුව

කාර්යය	ජ	පෙ	මා	අ	මැ	ජූ	ජූ	අ	සැ	ඔ	නො	දෙ	එකතුව සංඛ්‍යාව
තවමත් ඡායාරූපකරණය	7	4	4	1	2	5	1	6	7	8	7	8	60
ස්ටුඩියෝ පටිගත කිරීම	1	2	1	1	-	-	-	-	-	-	-	-	5
පිටත සජීවී ප්‍රවාහය	1		1								1		3
ENG	3	2	13	2	1	7	1		3	3	2	-	37
ශ්‍රව්‍ය පටිගත කිරීම	1	2	-	-	6	1	-	3	1	-	1	-	15
වීඩියෝ සංස්කරණය	2	-	1	-	2	1	3	-	3	3	14	1	30
සජීවීකරණය	-	2	-	-	2	-	-	-	-	-	2	-	6

7. ආදායම් උත්පාදන ව්‍යාපෘති

7.1 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා ආදායම් උත්පාදනය

2022 වර්ෂයේ ජනවාරි 5,6 සහ 25 දිනවල පැවත් වූ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය 2021 උපාධි ප්‍රදානෝත්සවයේ ඡායාරූපකරණය ආවරණය කිරීම අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස සිදු කරන ලදි.

7.2 බාහිර පාර්ශවකරුවන් සඳහා අනුග්‍රහය දක්වන වැඩසටහන්

උපදේශන හා බාහිර සම්පත් මධ්‍යස්ථානයේ ව්‍යාපෘති යටතේ අනුග්‍රහය දක්වන වැඩසටහන් 4ක් අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදි.

- 2022.03.19 දින " Anlen Milk Tea" වෙළඳ දැන්වීම, SGM Films, නාරාහේන්පිට.
- 2022.03.22 දින තාක්ෂණික විද්‍යාලයේ අවසන් විභාගය සඳහා හඬ පටිගත කිරීම.
- 2022.06.23 දින මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් (පුද්) සමාගම සඳහා හඬ පටිගත කිරීම.
- 2022.09.02 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව සඳහා වීඩියෝ ආවරණය, වීඩියෝ සංස්කරණය සහ ඡායාරූපකරණය.

8. අනාගත දිශාව

අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් තම සේවාවන්වල සමස්ත එදායිතාව ඉහළ නැංවීම සඳහා ගෙන ඇති වර්තමාන මූලපිරීම්වල ධනාත්මක බලපෑම පැහැදිලිව ඉස්මතු වීමට යම් කාල සීමාවක් ගතවනු ඇත. කෙසේ වෙතත්, තම ශක්තිමත් පදනම සහ අතීත ජයග්‍රහණ මෙන්ම වර්තමානයේ ගෙන ඇති නව මූලපිරීම් මත පදනම්ව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථ/ ඉගෙනුම් සම්පත් හරහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සන්නාමය ඉහළ නැංවීම සඳහා මාර්ගොපදේශ සහ පහසුකම් ලබා දීම අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි. ''යාව-ජීව ඉගෙනුම් හරහා සෑම දෙනාටම අධ්‍යාපනය'' යන එහි දැක්මට අනුකූලව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සියළුම පාර්ශවකරුවන්ගේ සහයෝගීතාව හරහා මෙම මෙහෙවර සාක්ශාත් කරගනු ඇත.

6.10 උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය

උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලාංකික සමාජය අතර සහයෝගීතාව වර්ධනය කරගැනීමට පහසුකම් සැළසීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිහිටුවන ලදී. එසේම මෙම උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය හරහා විශ්වවිද්‍යාලයට හැකි අවස්ථාවල රටේ යහපත සඳහා තම මානව සහ භෞතික සම්පත් යෙදවිය හැකිය. උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය මෙහෙයවනු ලබන්නේ උපකුලපති තුමා සභාපතිත්වය දරන අධ්‍යක්ෂ සහ අධ්‍යයන, අනධ්‍යයන යන කාර්ය මණ්ඩල දෙකේම නම්කරන ලද සාමාජිකයන්ගෙන් සමන්විත වන කළමනාකරණ මණ්ඩලයක් විසිනි.

උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය පර්යේෂණ වැඩසටහන්, කෙටි පාඨමාලා, උපදේශන සේවා, දිගු පාඨමාලා, පුහුණු සහ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන පාඨමාලා පවත්වයි. අදාළ අධ්‍යයන දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩලයට එවන් පැවරුම් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කලින් යොදාගත් වැඩකටයුතුවලට බාධාවක් නොවන ආකාරයට මේ කටයුතුවලට සම්බන්ධ විය හැකිය. උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානයේ පැවරුම් සකස් කර තිබෙන්නේ අධ්‍යයන කාර්ය මණ්ඩල විසින් වන අතර ඒවා වර්තමාන ප්‍රවණතාවන් සහ සමාජ අවශ්‍යතා පිළිබඳ විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව සකස් කර තිබේ. යම් කිසි බාහිර ආයතනයක් වන සේවාලාභියෙකුට ගැළපෙන ආකාරයට විශේෂයෙන් සැකසූ වැඩසටහන්ද තිබේ. උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානයේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සනාතන සභාවේ අනුමැතිය ලද පසු සිදු කළ හැකි ය. මෙම පැවරුම් සාර්ථකව සම්පූර්ණ කිරීමට අවශ්‍ය භෞතික සහ මානව සම්පත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ලබා දෙයි.

උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය නිරන්තරයෙන්ම ශ්‍රී ලාංකික ප්‍රජාව , විශේෂයෙන්ම රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය, රජයේ බලධාරීන්, සමාන අධ්‍යයන ආයතන ආදිය සමඟ තම අරමුණු ඉටු කර ගැනීම සඳහා තම විස්තීරණ මානව සහ භෞතික සම්පත් භාවිත කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන අතර උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානයේ පැවරුම්වලට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සම්බන්ධ කර ගැනීම සහ ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම සඳහා තම උපරිම සහාය ලබා දෙයි.

2022 වර්ෂයේදී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් රජයේ හා පෞද්ගලික ආයතන සඳහා උපදේශන සේවා සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පිරිනමන ලද අතර සියළුම පීඨ විසින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා ආරම්භ කරනු ලැබේ. තවදුරටත්, උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය විසින් ඉංජිනේරු, ස්වභාවික විද්‍යා, කළමනාකරණ, භාෂා අධ්‍යයන, සමාජ අධ්‍යයන, සෞඛ්‍ය විද්‍යා හා අධ්‍යාපන ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාව පුරා විහිදී සිටින ශිෂ්‍යයින් දහස් ගණනක් වෙත දැනට පිරිනමනු ලබන කෙටි පාඨමාලා සංඛ්‍යාව 40 කට අධික වේ.

6.11 පර්යේෂණ අංශය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තම පර්යේෂණ කටයුතු මෙහෙයවීම සඳහා 2014 පෙබරවාරි මස පර්යේෂණ අංශය පිහිටුවන ලදි. මෙම අංශය මෙහෙයවනු ලබන්නේ පර්යේෂණ අධ්‍යක්ෂක විසිනි.

විශිෂ්ට සේවාවක්, විනිවිදභාවයක්, සහයෝගීතවයක් මෙන්ම නවෝත්පාදන ප්‍රවර්ධනය කරමින් පර්යේෂණ අංශය විසින් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා පර්යේෂණ මෙහෙවර ඉදිරියට පවත්වාගෙන යනු ලැබේ.

පර්යේෂණ අංශය විසින් සාමූහික සහ නවෝත්පාදන පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමෙන් පීඨ, කාර්ය මණ්ඩල සහ ශිෂ්‍යයින්ගේ සාර්ථකත්වය අනුග්‍රහය දක්වනු ලබයි. පර්යේෂණය හා ජාතික සංවර්ධනය පුළුල් කිරීම, උපදේශනය, රාජ්‍ය සේවය හා විනය, සහයෝගීතාවය වර්ධනය කරමින් පර්යේෂණ ඒකාබද්ධ කිරීමට මෙම අංශය කටයුතු කරනු ලබයි.

පහත සඳහන් ක්‍රියාකරකම්/ කාර්යයන් 2022 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදි.

1. 2022 නොවැම්බර් 10 සිට 11 වන දින දක්වා 2022 ජාත්‍යන්තර විවෘත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසි සම්පූර්ණයෙන්ම මාර්ගගත සම්මන්ත්‍රණ ලෙස සංවිධානය කිරීම.

තාක්ෂණික සැසි හා සමගාමීව ජාත්‍යන්තර විවෘත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසි 2022හී දී විශේෂ විෂය මාතෘකාවක් ලෙස මණ්ඩල සාකච්ඡා 06ක් සංවිධානය කෙරිණ.

මණ්ඩල සාකච්ඡා 1- සෞඛ්‍ය විද්‍යා පීඨය: මහාචාර්ය. වජිර.එච්.ඩබ්ලිව් දිසානායක, මහාචාර්ය. අතුල සුමතිපාල සහ මහාචාර්ය. චූලානන්ද ගුණසේකර විසින් සිදු කරන ලද *Public Health in Crisis: Strategies to Overcome* පිළිබඳ සාකච්ඡාව

මණ්ඩල සාකච්ඡා 2 - ස්වභාවික විද්‍යා පීඨය: ආචාර්ය. යූ.කේ.ජී.කේ. පද්මලාල් සහ ආචාර්ය. ලක්ෂ්මන් පීරිස් විසින් සිදු කරන ලද *Protected areas as Natural Solution for Climate Change* පිළිබඳ සාකච්ඡාව

මණ්ඩල සාකච්ඡා 3- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය: සම්මානිත මහාචාර්ය. මාගරට් ඇලන්, මහාචාර්ය. සසංක පෙරේරා සහ ආචාර්ය. ඩැනියෙල් ඩිලන් විසින් සිදු කරන ලද *Masculinities Through Multidisciplinary Perspectives* පිළිබඳ සාකච්ඡාව

මණ්ඩල සාකච්ඡා 4- අධ්‍යාපන පීඨය: මහාචාර්ය. සොම් නයිදු, ආචාර්ය. සංජය මිෂ්රා, සුකයිනා වල්ජි මෙය සහ රෙනාටා ස්ගුආරියෝ විසින් සිදු කරන ලද *Digital Citizenship and the Changing Nature of Graduate Attributes* පිළිබඳ සාකච්ඡාව

මණ්ඩල සාකච්ඡා 5- ඉංජිනේරු තාක්ෂණ පීඨය: මහාචාර්ය. රංජිත් දිසානායක, ආචාර්ය. නරේන්ද්‍ර ද සිල්වා සහ ඉංජිනේරු එම්.ජී. හේමචන්ද්‍ර විසින් සිදු කරන ලද *Smart Cities: Challenges for the Engineering Sector in the New Normal* පිළිබඳ සාකච්ඡාව

මණ්ඩල සාකච්ඡා 6- කළමනාකරණ අධ්‍යයන පීඨය: ආචාර්ය. සරත් බුද්ධදාස, ජස්මින් නානායක්කාර මෙය සහ ප්‍රසන්න ලියනගේ මහතා විසින් සිදු කරන ලද *Creative Economy, Entrepreneurship and New Normal Sri Lanka* පිළිබඳ සාකච්ඡාව

2. 2022 ජාත්‍යන්තර විවෘත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසිවල සම්මන්ත්‍රණ කටයුතු ප්‍රකාශයට පත් කරන ලදි. (නිබන්ධන සහ විස්තෘත නිබන්ධන)

3. පීඨ 06ම නියෝජනය කරමින් 2022 නොවැම්බර් 08 සහ 09 දිනවල පූර්ව සම්මන්ත්‍රණ දේශන (05) සහ වැඩමුළු (01) සංවිධානය කරන ලදි.

2022 නොවැම්බර් 08 වන දින

දේශනය 1- ඉංජිනේරු තාක්ෂණ පීඨය: රජීව් වේරගම මහතා විසින් පවත්වන ලද *Basics of IOT, how it is being used in 4G (pre 5G) networks, the developments and the factors which will govern its future in the 5G environment, etc.* පිළිබඳ දේශනය

දේශනය 2- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය: මහාචාර්ය. නිහාල් පෙරේරා විසින් පවත්වන ලද *Rescuing Sri Lanka from the Past: Continuing Coloniality* පිළිබඳ දේශනය

2022 නොවැම්බර් 09 වන දින

දේශනය 1 - ස්වභාවික විද්‍යා පීඨය: මහාචාර්ය. සියාම් සුබයිර් විසින් පවත්වන ලද *Bridging the gap between university and industry: examples of innovation from biotechnology* පිළිබඳ දේශනය

දේශනය 2 - සෞඛ්‍ය විද්‍යා පීඨය: වෛද්‍ය. ආනන්ද විජේවික්‍රම විසින් පවත්වන ලද *Life After Covid 19: Unforeseen Consequences* පිළිබඳ දේශනය

දේශනය 3 - අධ්‍යාපන පීඨය: මහාචාර්ය. තෝමස් කොහ්ලර් විසින් පවත්වන ලද *Virtual mobility and social entrepreneurship, Future skills of educators and the meaning of online technologies developing active citizenship* පිළිබඳ දේශනය

වැඩමුළුව 1 - කළමනාකරණ අධ්‍යයන පීඨය: මහාචාර්ය. දිනේශ් සමරසිංහ විසින් පවත්වන ලද SAMRTPLS based SEM (Structural Equation Modelling) approach for theory testing in management research: Introductory approach පිළිබඳ වැඩමුළුව

4. 2021 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල දත්ත සමුදාය සඳහා පර්යේෂණ ප්‍රකාශන සම්පාදනය කිරීම.
5. 2021 දක්වා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල දත්ත සමුදාය සඳහා පර්යේෂණ ප්‍රතිපාදන සම්පාදනය කිරීම.
6. පහත සඳහන් කරුණු සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභා අනුමැතිය ලබා ගන්නා ලදි.
   - අචාර්ය උපාධිය සඳහා අධ්‍යයන වැඩසටහනක් හදාරන ශිෂ්‍යයින් සඳහා සංශෝධිත මාර්ගෝපදේශ
   - පර්යේෂණ උපාධි සඳහා සංශෝධිත අතුරු නීති
   - දර්ශනපති සහ ආචාර්ය උපාධිවල වාර්ෂික ප්‍රගති සමාලෝචන පෝරමය
   - දර්ශනපති සහ ආචාර්ය උපාධිවල වාර්ෂික ප්‍රගති සමාලෝචනය සඳහා මාර්ගෝපදේශ
7. අයදුම්කරුවන්ගේ තෝරාගත් පර්යේෂණ යෝජනා අතර පීඨ පර්යේෂණ ප්‍රදාන 2022හි වෙන් කළ අරමුදල් (රු. මිලියන 10)ක් අනුමත කර බෙදා හැරීම.

8. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගේ තෝරාගත් පර්යේෂණ යෝජනා අතර තරඟකාරී පර්යේෂණ ප්‍රදාන 3ක් සඳහා වෙන් කළ අරමුදල් (රු. මිලියන 2.7)ක් අනුමත කර බෙදා හැරීම.

9. ආචාර ධර්ම නිෂ්කාශනය සඳහා ආචාර ධර්ම සමාලෝචන කමිටුවට ලැබුණු දර්ශනපති/ ආචාර්ය උපාධි අයදුම්පත් 13ක් ඇගයීම සිදු කරන ලදි.
නිර්දේශිත ආචාර ධර්ම සමාලෝචන කමිටු අයදුම්පත් 14ක් ආචාර ධර්ම සමාලෝචන කමිටුව විසින් ඇගයීම සිදු කරන ලදි. - සෞඛ්‍ය විද්‍යා පීඨය

10. පාරිසරික අධ්‍යයනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය, අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය, ප්‍රදේශීය අධ්‍යාපන සේවා, පුස්තකාලය සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විවිධ අංශවල අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් ලැබුණු 2022- පර්යේෂණ දීමනා අයදුම්පත් 28ක් ඇගයීමට ලක් කර මූල්‍ය කමිටුව වෙත නිර්දේශ කරන ලදි.
11. ජාතික විගණන කාර්යාලයේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පර්යේෂණ ප්‍රදාන සහ පර්යේෂණ දීමනා පිළිබඳ විස්තරාත්මක විගණන වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලදි.
12. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධි අධ්‍යයන පීඨය ස්ථාපිත කිරීම සඳහා වන සංකල්ප පත්‍රිකාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදි.

13. පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටි පාඨමාලාව සහ දර්ශනපති සහ ආචාර්ය උපාධි අපේක්ෂකයින් සඳහා විද්‍යාත්මක/ ශාස්ත්‍රීය රචනා පිරිනැමීම සඳහා උසස් උපාධි සහ පර්යේෂණ කමිටු අනුමැතිය ලබා ගන්නා ලදි.

14. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉල්ලුම් කර ඇති පරිදි පර්යේෂණ ඒකකය/ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට අදාළ ලේඛන සකස් කරන ලදි.
උදා: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේඛන - ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ශ්‍රේණිවලට අදාළ තොරතුරු

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ලේඛන - පර්යේෂණ ප්‍රදාන - මූල්‍ය තක්සේරුව 2022

2022 ජාත්‍යන්තර විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසි
2022 විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසියෙහි වැදගත් සිදුවීම්





අධ්‍යක්ෂ/ පර්යේෂණ විසින් පවත්වන ලද පිළිගැනීමේ කතාව



ප්‍රධාන ආරාධිත අමුත්තා - මහාචාර්ය. එබා ඔස්සියානිල්සන්

මාතෘකාව – 'A New Social Contract for Education for Well-Being, Inclusion, Equity, and a Smart Future for Individuals and the Planet'

උපකුලපතිගේ කථාව



ප්‍රධාන ආරාධිත අමුත්තා - මහාචාර්ය. අර්ජුන පරාක්‍රම

මාතෘකාව – 'Resisting the After-Shock Dogma: Rejecting Neoliberal Economic Policy as the Engine of Change in Educational Principles and Practice'



ප්‍රධාන ආරාධිත අමුත්තා - මහාචාර්ය. චාලට් නිර්මලනි ගුණවර්ධන

මාතෘකාව – 'Transforming Learning Environments in a Post-Pandemic Era: Connectedness, Collaboration, and Co-Construction'









6.12 පාරිසරික අධ්‍යයනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය (CESSD) ශ්‍රී ලංකාව තුළ පාරිසරික දැනුවත්භාවය, පර්යේෂණ සහ තිරසාර සංවර්ධන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කැපවී සිටී. හරිත හා වඩා තිරසාර අනාගතයක් නිර්මාණය කිරීමේ දැක්මක් ඇතිව පිහිටුවන ලද CESSD පාරිසරික අධ්‍යාපනයේ සහ පර්යේෂණවල විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරයි. CESSD හි මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ පාරිසරික ගැටලු විසඳීම සඳහා තාක්ෂණ සංවර්ධනය සහ ධාරිතා සංවර්ධනය සඳහා මඟ පෙන්වන ඉගැන්වීම්, පර්යේෂණ සහ ශිෂ්‍යත්ව පිළිබඳ පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි. එසේම, CESSD හි මූලික පරමාර්ථය වන්නේ පාරිසරික ගැටළු පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති කිරීම සහ පාරිසරික අභියෝග විසඳීමට සහ අවම කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා වලින් පුද්ගලයින් සන්නද්ධ කිරීමයි.

තවද, CESSD විශ්ව විද්‍යාල ප්‍රජාව අතර පරිසර සංරක්ෂණය සහ තිරසාර භාවිතයන් පිළිබඳව දැනුවත් කිරීම අරමුණු කරගනිමින් ප්‍රජා සත්කාර වැඩසටහන් වල නිරත වේ. මෙම මූලපිරීම් හරහා, CESSD පාරිසරික භාරකාරත්වය ප්‍රවර්ධනය කිරීමට, තිරසාර ජීවන රටාවන් දිරිමත් කිරීමට සහ ඔවුන්ගේ වටපිටාව කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීමට පුද්ගලයින් බල ගැන්වීමට උත්සාහ කරයි.

2022 ජුනි 29 වන දින පෙ.ව. 9.00 සිට උපකුලපති මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් නාවල ප්‍රධාන මණ්ඩපයේ සනාතන මන්දිරය අසල හරිත ප්‍රදේශයේ දී පවැත්වුන හරිත දිනය CESSD හි ප්‍රධාන කාර්යභාරයක ප්‍රධාන මුලපිරීමක් විය. හරිත දිනයේ අරමුණ වන්නේ දැනුවත් කිරීම සහ පරිසර සංරක්ෂණය, තිරසාරභාවය සහ පරිසර හිතකාමී භාවිතයන් සඳහා ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීමයි. හරිත දිනය පාරිසරික භාරකාරත්වයේ වැදගත්කම අවධාරණය කිරීම සහ පෘථිවිය වෙනුවෙන් ධනාත්මක ක්‍රියාමාර්ග ගැනීමට පුද්ගලයින්, ප්‍රජාවන් සහ සංවිධාන දිරිමත් කිරීම සඳහා කැප වූ දිනයක් ලෙස ක්‍රියා කරයි. හරිත දිනයට සමගාමීව ආහාර සුරක්ෂිතතාව සඳහා තිරසාර වගා ක්‍රම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන්වලට ආහාර සුරක්ෂිතතාව, ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථානවල තිරසාර බෝග වගාව, OUSL කාර්ය මණ්ඩල සාමාජිකයින්ට කෘෂිකාර්මික පැල බෙදාදීම, ශ්‍රමදාන ව්‍යාපාරයක් සහ ඉදිරි ආහාර හිඟය සඳහා විසඳුමක් ලෙස කාබනික ගොවිතැන ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ සැසිවාර සඳහා රුක් රෝපණ ද උත්සවය දී ඇතුළත් විය.





තවද, විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පාපැදිකරුවන්ට ආරක්ෂිත සහ පහසු ප්‍රවාහනය සැපයීම සඳහා විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පාපැදි මාර්ග ද හඳුන්වා දෙන ලදී. පාපැදිකරුවන්ට විශ්වවිද්‍යාලය පුරා කාර්යක්ෂමව සහ ආරක්ෂිතව ගමන් කිරීමට ඉඩ සලසමින් මෙම මංතීරු පදික වේදිකා සහ වාහන ගමනාගමනයෙන් වෙන්ව වෙන් කර තිබුණි. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පාපැදි මාර්ග හඳුන්වාදීමේ අරමුණ වූයේ තිරසාර ගමනාගමනය දිරිමත් කිරීම, සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම සහ වඩාත් පරිසර හිතකාමී මණ්ඩපයකට දායක වීම, ඔවුන් පාපැදිකරුවන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සඳහා ප්‍රමුඛත්වය දෙමින් එහා මෙහා යාමට පහසු සහ කාර්යක්ෂම ක්‍රමයක් සපයන බැවිනි.





2022 දී CESSD ලබා ගත් තවත් විශිෂ්ට ජයග්‍රහණයක් වූයේ විශ්වවිද්‍යාල හරිත සමාජය පිහිටුවීමයි. පිහිටුවීම 2022 ජුනි 29 වන දින පවත්වන ලද අතර, උපකුලපති මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න සංගමයේ ලියාපදිංචි වූ පළමු සාමාජිකයා විය.





එසේම, UI Green Metric World University ශ්‍රේණිගත කිරීම් සඳහා අයදුම් කිරීමට CESSD පුරෝගාමී වූ අතර ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල 2022 දී විශ්වවිද්‍යාල 1050 කින් 566 වන ස්ථානය ලබා දී ඇත.

අයිතමය	2022	2021
ලෝක ශ්‍රේණිගත කිරීම	566	725
දිවයින ශ්‍රේණිගත කිරීම	6	7
මුළු ලකුණු	5600	4200
සැකසීම සහ යටිතල පහසුකම්	950	875
බලශක්ති සහ දේශගුණික විපර්යාස	1050	425
කසළ	750	750
ජලය	350	300
ප්‍රවාහන	1250	925
අධ්‍යාපනය සහ පර්යේෂණ	1250	925
සහභාගී වූ රටවල් ගණන	1050	956

සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය පරිසර හිතකාමී පුද්ගලයන් පෝෂණය කිරීමට සහ ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය පෝෂණය කිරීමට කැපවී සිටී.

7 කොටස – අනාගත සැලසුම්

7.0 අනාගත සැලසුම් - 2023

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විවෘත හා දුරස්ථ අධ්‍යාපනික උසස් අධ්‍යාපන ආයතනය ලෙස එහි මෙහෙවරෙහි සදහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සේවාවන් තවදුරටත් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අනාගත වැඩසටහන් කිහිපයක් පහත දැක්වේ. මෙම ව්‍යාපෘති යෝජනා කිරීමේදී තිරසාර සංවර්ධනයේ අංගයන් සැලකිල්ලට ගනු ලැබේ.

1 විශ්වවිද්‍යාලයේ හරිත ප්‍රතිපත්තියට පදනම්ව ප්‍රධාන මණ්ඩපය සහ ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන හරිත මණ්ඩප බවට පරිවර්තනය කිරීමට විශ්ව විද්‍යාලය අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.

2 කොළඹ මහනගර සභාව සමඟ කරන ලද සාකච්ඡාවට අනුව කොළඹ මහ නගර සභාව මගින් සිදු කරනු ලබන දැනට පවතින මලාපවහන වැඩිදියුණු කිරීමේ කටයුතුවලදී ප්‍රධාන මණ්ඩපයට සහ කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයට මලාපවහන හා ජලාපවහන පද්ධතියක් හඳුන්වා දීමට පියවර ගනිමින් සිටී.

3 ප්‍රධාන මණ්ඩපය සහ ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සැලසුම් කරමින් පවතින අතර 2023 වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කෙරේ. මේවාට ඇතුළත් වන්නේ;

I. සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා වන මහල් 5 කින් යුත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කරගෙන යාම.

II. කළුතර, ගම්පහ, අම්පාර, මන්නාරම, මඩකලපුව, මහනුවර, බණ්ඩාරවෙල අධ්‍යයන මධ්‍යස්ථාන සඳහා තාවකාලික විභාග ශාලා ඉදිකිරීම.

III. විශ්ව විද්‍යාලය දත්ත කලමනාකරණ මධ්‍යස්ථානය වෙත අධිසන්ධි සේවාදායක පද්ධතියක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරයි.

IV. ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම. මෙම පද්ධතිය ශිෂ්‍ය ලියාපදිංචි කිරීම සිට උපාධිය දක්වා සියලුම ක්‍රියාවලීන් ඇතුළත් වේ.

V. OUSL හි දෘශ්‍යතාව සහ ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා නාවල සහ අනෙකුත් ප්‍රාදේශීය මධ්‍යස්ථානවල දැනට පවතින ගොඩනැගිලි පහසුකම් ප්‍රතිසංස්කරණය කෙරේ.

4. විදේශීය රටවල උසස් අධ්‍යාපන වැඩසටහන් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇතුළුව ODL මාදිලිය හරහා ඒකාබද්ධ අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කිරීමේදී දේශීය සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සහයෝගීතාව වැඩි කිරීම.

5. විමධ්‍යගත පරිපාලන ක්‍රමය යටතේ බොහෝ අධ්‍යයන, පරිපාලන සහ මූල්‍ය ක්‍රියාකාරකම් හැසිරවීමට ප්‍රාදේශීය අධ්‍යාපන සේවා ප්‍රතිව්‍යුහගත කිරීම.

6. මධ්‍යම මණ්ඩපයේ සහ ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථාන අතර සන්නිවේදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නව PABX පද්ධතියක් ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.

7. OUSL හි සිසුන්ගේ සියලුම ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා විශ්ව විද්‍යාලයේ ඉගෙනුම් ආධාරක ඒකකය පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම. මේ සම්බන්ධව පීඨ 6 ම ඉගෙනුම් ආධාරක ඒකක පිහිටුවීය.

8. විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගනිමින් කීර්තිමත් සමකාලීන සමාලෝචන සූචිගත සඟරාවල පර්යේෂණ ලිපි පළ කිරීමට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දිරිමත් කිරීම.

9. OUSL හි අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටා ඇති නගරවල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා පුස්තකාල සේවා වැඩිදියුණු කිරීම සඳහා මහජන පුස්තකාල සමඟ හවුල්කාරිත්වය වර්ධනය කිරීම.

10. විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා කටයුතු දියුණු කිරීම සඳහා භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

11. කර්මාන්ත සම්බන්ධතා ඒකකයේ වැඩ කටයුතු පුළුල් කිරීම තුලින් වැඩි පර්යේෂණ අවස්ථාවන් සලසාදීම මඟින් භාණ්ඩ වාණිජ කරණය සඳහා යොමු කිරීම.

12. විශ්වවිද්‍යාලයේ විභාග අංශය තුළ වෙනම මාර්ගගත විභාග ඒකකයක් පිහිටුවීම. මාර්ගගත විභාග පැවැත්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම.

13. දැනට පවතින වෙබ් අඩවියට වඩා පරිශීලක-හිතකාමී ලෙස විශ්වවිද්‍යාල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.

14. නව අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කරමින් විශ්ව විද්‍යාලයට ශිෂ්‍ය ප්‍රවේශය පුළුල් කිරීම. ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ව්‍යාප්ත කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ ඉලක්ක සපුරාලීම සඳහා අවම වශයෙන් සිසුන් 5,000 ක් සඳහා පහසුකම් සැලසීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධි වැඩසටහන පුළුල් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

15. විශ්ව විද්‍යාලයේ වාර්තා කළමනාකරණ ප්‍රතිපත්තිය අවසන් කිරීමට සහ වඩාත් ක්‍රමානුකූල වාර්තා කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

16. යාවත්කාලීන පරිගණක ගත මානව සම්පත් මොඩියුලය 2023 අවසානයට පෙර ක්‍රියාත්මක කිරීමට නියමිතය.

17. සිසුන් විසින් නගන විවිධ ගැටළු විසඳීම සඳහා වඩාත් විධිමත් සහ ප්‍රතිචාරාත්මක ශිෂ්‍ය ප්‍රතිචාර පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

18. ජාතික සහ ජාත්‍යන්තර තත්ත්ව සහතික මිණුම් සලකුණු කරා ළඟා වීමට අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක බව ඉහළ නැංවීමට කටයුතු කිරීම.

19. විවෘත අධ්‍යාපන සම්පත් ඇතුළු ඉගෙනුම් සම්පත් වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම.

20. නියමිත වේලාවට උපාධි වැඩසටහන් සම්පූර්ණ කිරීම සඳහා වැඩසටහන්/පාඨමාලා ඇගයීම සහ ඇගයීම් යාන්ත්‍රණයන් වැඩි දියුණු කිරීම.

21. සිසුන්ගේ ව්‍යවසායකත්ව ගුණාංග වැඩිදියුණු කරන අතරම අදාළ කර්මාන්තවල ප්‍රායෝගික නිරාවරණය සඳහා අවස්ථා වැඩි කිරීම. මධ්‍යම කර්මාන්ත සම්බන්ධතා මධ්‍යස්ථානයක් පිහිටුවීම.

22. පර්යේෂණ සහ නවෝත්පාදනයන් වැඩි දියුණු කිරීමට සහ පර්යේෂණ ප්‍රකාශනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම.

23. ජාත්‍යන්තර සහභාගීත්වයෙන් පශ්චාත් උපාධි පර්යේෂණ සිසුන් බඳවා ගැනීම් වැඩිදියුණු කිරීම සහ කලාපීය සහ ගෝලීය පිළිගැනීමක් ලබා ගැනීමට කටයුතු කිරීම සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය පිහිටුවීමට පියවර ගනු ඇත.

24. විදේශීය විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් අන්තර් ජාතික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම. විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීමට විශ්ව විද්‍යාලය අපේක්ෂා කෙරේ.

25. අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා අවස්ථා වැඩි කිරීම සහ අන්තර් විනය අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා ශක්තිමත් කිරීම.

26. කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සියලුම කාණ්ඩ ආවරණය වන පරිදි කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ කටයුතු පුළුල් කිරීම.

27. යුරෝපා සංගමය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, මොරටුව සහ රුහුණු විශ්වවිද්‍යාලය යන තවත් යුරෝපීය හවුල්කාර විශ්වවිද්‍යාල තුනක් සමඟ එක්ව ප්‍රථම වරට චක්‍රීය ආර්ථිකයක් සඳහා වන ඒකාබද්ධ බලය සඳහා වන විද්‍යාපති උපාධි පාඨමාලාව ආරම්භ කරයි. යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සාමූහික එකමුතුවක ආකෘතියක් යෝජනා කෙරේ.

28. විශ්වවිද්‍යාල ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අභ්‍යන්තර සේවක ශ්‍රමය යොදා ගැනේ.

29. කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය සුබසාධන පහසුකම් වැඩි කිරීම.

30. රැකියා ඉලක්ක කරගත් නව උපාධි වැඩසටහන් හඳුන්වා දීම සහ OUSL විසින් පිරිනමනු ලබන සියලුම වැඩසටහන් සඳහා සිසුන් බඳවා ගැනීම වැඩි කිරීම.

8 කොටස – මූල්‍ය තොරතුරු

8.0 මූල්‍ය තොරතුරු

8.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර:

විෂය		2021 රු.	2022 රු.
අ.	පුද්ගලික වැටුප්	2,506,037,057	2,674,315,636
ආ.	ගමන් වියදම්	3,096,861	5,177,720
ඇ.	සැපයුම්	34,963,983	80,463,468
ඈ.	නඩත්තු සේවා	26,846,192	59,182,098
ඉ.	කොන්ත්‍රාත් සේවා	306,090,221	407,123,606
ඊ.	වෙනත්	128,766,488	274,402,665
එකතුව		**3,005,800,802**	**3,500,665,193**

8.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර:

විෂය		2021 රු.	2022 රු.
අ.	ගෘහ උපකරණ සහ කාර්යාලීය උපකරණ පවරා ගැනීම	15,389,830	49,023,430
ආ.	යන්ත්‍රෝපකරණ පවරා ගැනීම	2,434,759	9,715,380
ඇ.	ගොඩනැගිලි හා සැලසුම් පවරා ගැනීම්	194,273,440	12,546,761
ඈ.	වෙනත් (පුස්තකාල පොත්, ලෝගු හා මොටර් රථ වාහන)	8,456,159	23,963,751
	එකතුව	**220,554,188**	**95,249,322**

8.3 ව්‍යාපෘති ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සපයන ලද)

	නම සහ විස්තර	මූල්‍ය සැපයූ ආයතනය	සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව [TCE] රු.	2020 වියදම්	2021 වියදම්	2022.12.31 දිනට සමුච්චිත එකතුව	භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය	ගෘහස්ථ අරමුදල් (DF) රු.
1	තොරතුරු පරිගණක තාක්ෂණ කුසලතා සඳහා ඒකාබද්ධ විවෘත අධ්‍යාපනික සම්පත්	පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය	1,008,467.37	-	-	906,070.69	90%	
2	විද්‍යුත් ඉගෙනුම් පාඨමාලා සංවර්ධනය- ඉගැන්වීම හා ඉගෙනීම සඳහා උපදේශනාත්මක විඩියෝ නිෂ්පාදනය (C17-054)	පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය	2,773,144.06	-	-	1,907,392.74	69%	
3	"විවෘත අධ්‍යාපන සම්පත් හා විවෘත අධ්‍යාපන පුහුණු ප්‍රතිග්‍රහණය පිළිබඳව අධ්‍යාපනඥයන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අරමුණු කරගත් විශාල විවෘත මංගත පාඨමාලාවක් සැලසුම් කිරීම, සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම: සැලසුම් පදනම් වූ ධාරිතා සංවර්ධන වැඩසටහනකි" (19-ED 262) - අදියර 2	පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය	3,500,886.78	-	-	3,500,477.86	100%	
4	විද්‍යුත් පුස්තකාල ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය	පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	15,000,000.00	-	-	11,898,293.00	79%	
5	අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව පිරිනමන ගුරු අධ්‍යාපනඥයන් සඳහා පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව	ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය	1,925,000.00	48,000.00	-	1,526,297.00	79%	
6	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානය වෙනුවෙන් මූල්‍යාධාර	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	770,000.00	-	-	58,908.22	8%	
7	ECD ගුරු පුහුණුකරුවන් හා ECD ගුරුවරුන් සඳහා විෂයමාලා සංවර්ධන කෙටිකාලීන පුහුණු පැකේජය - ශ්‍රී ලංකා රජයේ ECD ව්‍යාපෘතිය යටතේ	කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය	956,425.00	-	-	582,134.00	61%	
8	ග්‍රාමීය ගොවි කාන්තා ප්‍රජාව අතර ජංගම ඉගෙනීම ප්‍රවර්ධනය සඳහා කාන්තාව සවිබල ගැන්වීම	පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය	1,423,245.94	-	-	821,277.41	58%	
9	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය හා එක්ව ඒකාබද්ධව ගොවීන් සඳහා යාවජීව ඉගෙනුම් වැඩි දියුණු කිරීම (A.No. CR18-299).	පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය	1,207,392.74	553,138.67		731,492.73	61%	

	නම සහ විස්තර	මූල්‍ය සැපයූ ආයතනය	සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව [TCE] රු.	2020 වියදම්	2021 වියදම්	2022.12.31 දිනට සමුච්චිත එකතුව	භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය	ගෘහස්ථ අරමුදල් (DF) රු.
10	ශ්‍රී ලාංකීය උසස් ද්විතීය පාසල් මට්ටමේ ගුරුවරුන් හා ශිෂ්‍යයන් විසින් පවත්වන පොදුරාජ්‍ය මණ්ඩලීය ඩිජිටල් අධ්‍යාපන නායකත්ව පුහුණුව ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන (C-DELTA) (A.No C-19-008)	පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය	7,824,308.56	923,394.01	1,878,492.79	7,771,287.65	99%	
11	විෂය බාහිර ක්‍රියාකාරකම් වල නිරත වන විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ධෛර්යමත් කිරීම සඳහා අක්මුදල්.	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	4,500,000.00	-	-	3,766,709.00	84%	
12	CONTESSA	ග්‍රාස් විශ්වවිද්‍යාලය	13,294,850.89	56,000.00	1,644,697.32	9,265,062.69	70%	
13	ගොවීන් සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය - යාවජීව ඉගෙනුම් අදියර 1 (C20-318)	පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය	406,595.56	-	-	-	0%	
14	ග්‍රාමීය පදික මාර්ග/ වාහන ගමන් කරන පටු පාලම් ඉදිකිරීම සඳහා මූලික අධ්‍යයනය	ග්‍රාමීය මාර්ග සහ වෙනත් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය	37,043,700.00	-	18,686,300.00	37,043,700.00	100%	
15	විද්‍යුත් පුස්තකාල මධ්‍යස්ථානය සහ නෝඩල් පොයින්ට් සංවර්ධනය	පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	9,949,575.00	2,194,785.00	2,440,000.00	9,949,575.00	100%	
16	ශ්‍රී ලංකාවේ අපනයන කෘෂිකර්මය පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් (Col-L3f) ව්‍යාපෘතිය (C22-289)	පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය	1,091,460.30	-	-	982,000.00	90%	
17	දැනට පවතින ඉදිකර ඇති ග්‍රාමීය මාර්ගවල කල් පැවැත්ම සහ කාර්ය සාධනය	ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය	459,000.00	-	-	417,187.50	91%	
9.8 පසුගිය වර්ෂ පහ තුළ මුල්‍යමය ලෙස වැදගත් සිදුවීම්

විස්තරය	2018 (Restated)	2019 (Restated)	2020	2021 (Restated)	2022
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන	1,320,000,000	1,600,000,000	1,920,000,000	2,280,000,000	2,484,000,000
පර්යේෂණ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	9,425,000	9,000,000	-		-
ආයෝජන සඳහා පොලිය	113,333,807	93,743,600	40,531,326	23,863,338	121,221,816
ණය සහ අත්තිකාරම්වලින් පොලිය	3,299,244	3,376,124	3,458,172	3,233,012	3,275,711
දේපළවලින් ලැබෙන කුලිය	3,000,399	1,953,813	2,827,241	958,841	2,732,468
පැරණි ගබඩා අලෙවිය	1,973,022	783,820	4,100		31,500
විවිධ ලැබීම්	11,176,486	12,540,349	11,914,685	18,344,085	4,665,986
ලියාපදිංචි ගාස්තු	4,256,403	25,354,799	7,560,100	17,679,366	19,246,638
ශිෂ්‍යයින්ගෙන් ලැබුණු ආදායම	812,508,895	1,214,557,500	739,787,584	951,801,361	1,720,679,953
විභාග ගාස්තු	1,696,349	4,754,172	4,332,170	1,106,996	12,025,403
ප්‍රකාශන/අයදුම්පත්‍ර අලෙවි කිරීම	27,612,887	14,199,170	50,422,798	24,657,224	65,047,975
පුස්තකාල දඩ	325,840	280,520	91,770	11,438	104,550
පරිපූරක ගාස්තු	3,500	3,500	-	75,000	120,000
නේවාසික ගාස්තු	1,546,050	1,633,500	504,350	45,450	924,150
කෙටි පාඨමාලා වලින් හා වෙනත් මූලාශ්‍රවලින් ලැබෙන ආදායම	46,000,262	29,136,288	51,397,032	82,125,354	63,222,705
වාහන කුලියට දීම	245,977	105,674	64,747	-	125,306
බැඳුම්කර උල්ලංඝනය කිරීමට අදාළව ලැබුණු ආදායම	5,227,117	8,427,337	22,386,910	9,420,072	18,713,974
විනිමය අනුපාත වෙනස				17,085	376,943
මුළු එකතුව	**2,361,631,238**	**3,019,850,166**	**2,855,282,985**	**3,413,338,622**	**4,516,515,078**
වියදම්					
සාමාන්‍ය පරිපාලන සහ කාර්ය මණ්ඩල සේවා	460,931,733	459,503,554	415,057,866	431,588,220	499,118,590
<u>එකතු කළා : ක්ෂයවීම්</u>	522,527,983	551,644,732	546,051,251	557,553,843	403,248,964
	983,459,716	**1,011,148,286**	**961,109,117**	**989,142,063**	**902,367,554**
සංසරණය නොවන ද්‍රව්‍ය බැහැර කිරීම සහ කාර්ය මණ්ඩල සේවා				2,891,380	1,065,551
ලැබිය යුතු මුදල් නොලැබීම් (ශිෂ්‍ය)	31,229,282	37,827,384	40,655,161	-	
ලැබිය යුතු මුදල් නොලැබීම (කාර්ය මණ්ඩල/ ශිෂ්‍ය)	-	-	-	43,729,298	10,487,725
විනිමය අනුපාත වෙනස	-	11,706			
අධ්‍යයන සේවා	1,792,238,763	2,540,839,811	2,397,981,360	2,256,130,720	2,530,045,369
ඉගැන්වීම් සම්පත්	120,022,702	158,260,681	146,332,728	137,930,943	155,735,019
සෞඛ්‍ය සේවා	5,095,028	5,510,585	6,220,381	6,641,971	6,727,842
ඉඩම් හා ගොඩනැගිලි නඩත්තුව	55,210,179	66,606,729	60,435,254	58,542,667	83,597,120
අනුෂාංගික කටයුතු	106,647,186	124,669,971	98,229,330	121,139,264	225,441,255
මුළු එකතුව	**3,108,196,974**	**3,947,257,506**	**3,713,345,684**	**3,619,590,398**	**3,918,959,036**

10 කොටස - විගණන වාර්තාව

10.0 විගණන වාර්තා

10.1 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/F/1/OUSL/2022/FA/17 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 සැප්තැම්බර් 27 දින

උපකුලපති,
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. +94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. +94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka. ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) විවෘත විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි 02 කට තෙකලා විදුලි සම්බන්ධතාවය ලබාගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණු රු.4,098,592 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 22 ඡේදය ප්‍රකාරව ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කිරීමකින් තොරව වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම හා වර්ෂයේ අතිරික්කය එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වාරික වශයෙන් ලැබෙන පාඨමාලා ආදායම් වර්ෂයට අදාළව හඳුනාගැනීමේ පදනම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 39 ඡේදය ප්‍රකාරව අනාවරණය කර නොතිබීම හේතුවෙන් 2022 සැප්තැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව පාඨමාලා 18 ක් සඳහා ලියාපදංචි වූ සිසුන්ගෙන් ලැබුණු ආදායමෙන් රු.70,057,777 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙසත් රු.165,437,666 ක් කලින් ලද ආදායමක් ලෙසත් ගිණුම්ගත කර තිබුණද එහි නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

(ඇ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට 2022 වර්ෂයේදී උසස් අධ්‍යාපන ප්‍රවේශ වැඩිකිරීමේ ව්‍යාපෘතියෙන් (AHEAD) ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් සඳහා සහ ස්ථාවර වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු.1,919,830ක් සහ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු.37,582 ,783ක් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ට අනුව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී 2021 දෙසැම්බර් 31 දිනට පැවති වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන රු.392,547,770 ක ශේෂය ද වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු.24,789,318 ක ශේෂය හා පරිත්‍යාග හා අනෙකුත් ප්‍රදාන රු.623,653,404 ක ශේෂවල එකතුව රු.1,040,990,492 ක් මූලධන සමුච්චිත අරමුදලටද පොදු සංචිතයෙන් මූලධන සමුච්චිත අරමුදලට රු.262,678,203 ක් හා පුනාරවර්තන සමුච්චිත අරමුදලට රු.267,960,710 ක් මාරු කිරීමේදී ජ'ර්නල් සටහන් හා ලෙජර සඳහා සටහන් යොදා නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.30,282,945 ක් වූ උපචිත වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම්වලින් අඩුකර දැක්වීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ශිෂ්‍ය ආදායම නිවැරදිව හඳුනාගැනීමකින් තොරව ශිෂ්‍ය ආදායම් පාලන ගිණුමේ ශේෂය හා හඳුනානොගත් ශිෂ්‍ය ආදායම් ගිණුමේ ශේෂය අතර රු.760,779,170 ක වෙනස ලැබිය යුතු ශිෂ්‍ය ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එහි කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුලදී රු.22,972,539 ක් වූ වැඩිපුර ක්ෂය ගිණුම්ගත කිරීම සංශෝධිත මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමේදී දෝෂ සහගත ලෙස ජර්නල් සටහන් යෙදීම හේතුවෙන් ක්ෂය හා ක්ෂය වෙන්කිරීමේ ලෙජර් ගිණුම්වල ශේෂය රු.45,914,112 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) ගෙවීම් වවුචර්, ලදුපත් හා ජර්නල් වවුචරය වැනි මූලාශ්‍ර ලේඛන පිළියෙල කිරීමකින් තොරව, ක්ෂය, ක්ෂය වෙන්කිරීම් හා වත්කම් ගිණුම්වලට පරිගණක ගිණුම් පද්ධතිය තුළින් සටහන් යෙදීම සිදු වී තිබුණි. එවැනි සටහන් තුළින් යොදන ලද වැරදි සටහන් නිවැරදි කිරීම සඳහා වර්ෂය අවසානයේදී ජර්නල් සටහන් යොදා ක්ෂය හා ක්ෂය වෙන් කිරීමේ ගිණුම්වලින් රු.277,275,406 ක් ඉවත් කර තිබුණි.

(එ) 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.5,408,784 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදී ගත් දිනයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්‍රමක්ෂය කර නොතිබුණි.

(ඒ) ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන 08 ක හා නාවල ප්‍රධාන පුස්තකාලයේ 2022 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය ශුනය වී තිබුණු රු.208,381,961 ක් හා ශුද්ධ අගය රු.44,264,590 ක් වූ පුස්තකාල පොත් හා සහරා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 42 හා 43 ඡේදවලට අනුකූල නොවන ආකාරයට 2022 දෙසැම්බර් 31 දිනට රු.325,093,568 ක අගයකට ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණන අතිරික්තය ලෙස රු.280,829,078 ක් ගිණුම්ගත කර තිබුණි .

(ඔ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයට ගෙවිය යුතු ශේෂ එකතුව රු.2,021,113 ක් දක්වා තිබුණද එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂ රු.4,013,523 ක් වූයෙන් රු.1,992,410 ක වෙනසක් පැවතුණි.

(ඕ) 2022 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාදේශීය මධ්‍යස්ථාන 25 ක හා ඇදීම් උපකරණ ඒකකයේ ඇතුළත් පිරිවැය රු.47,666,626 ක් වූ පාඨමාලා ද්‍රව්‍ය තොගය, භෞතිකව පරීක්ෂා කර නොතිබීම හේතුවෙන් එම තොගයෙහි පැවැත්ම හා වටිනකාම්වල නිවැරදිතාවය තහවුරු කරගැනීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (ඊ), (උ) සහ (ඒ) ඡේද යටතේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 102, 103, 104, හා 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එකතුව රු.31,072,291 ක් වූ හානි වූ හා යල් පැනගිය අධ්‍යයන ද්‍රව්‍ය (Course materials) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය විසින් කපාහැරීමට අනුමැතිය ලබාදී තිබුණි.
	(ii) මුදල්රෙගුලාසි 113(3)(ආ)	ආයතනයේ ප්‍රතිපත්තිය අනුව ලියාපදිංචිය අළුත් නොකරන වර්ෂ 05 ඉක්ම වූ ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු රු.10,516,756 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2021 දක්වා එසේ කපාහැර තිබුණු ශිෂ්‍ය ආදායම රු.392,551,000 ක් විය.

(ආ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11(අ) වගන්තිය	අදාල අමාත්‍යවරයාගේ හා මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් 2022 දෙසැම්බර් 31 දින වන විට රු.1,516,407,982 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.
(ඇ)	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය වක්‍රලේඛය හා 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය	(i) අධ්‍යයන කාර්යයන් සඳහා සහ සප්ත වාර්ෂික නිවාඩු මත විදේශගත වන විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ගුවන් ටිකට්පත් සහ අනෙකුත් පහසුකම් ලබාදීමට දේශීය අරමුදල් භාවිතා නොකල යුතු වුවද 2022 අප්‍රේල් 26 දින සිට 2023 මාර්තු 31 දින දක්වා සප්ත වාර්ෂික නිවාඩු මත විදේශගත වූ ආචාර්ය්වරුන් 04 දෙනෙකු හා කලත්‍රයෙක් සඳහා දේශීය අරමුදල්වලින් රු.435,500 ක්ද බැදුම්කර හා ගිවිසුම් කඩවීම්වලින් ලැබුණු මුදලින් රු.1,466,300 ක්ද ගුවන් ටිකට්පත් හා උණුසුම් ඇදුම් දීමනා සඳහා වැයකර තිබුණි. (ii) බැදුම්කර හා ගිවිසුම් කඩවීම් හේතුවෙන් අයකරගන්නා මුදල් වෙනත් කාර්යයන් සඳහා යොදා නොගෙන ලද සැනින් රාජ්‍ය ආදායමට බැරකල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.19,007,654 ක් විශ්වවිද්‍යාලයේ ආදායම් ලෙසද ඊට පෙර වර්ෂවල ලැබුණු රු.133,497,387 ක් ස්ථාවර තැන්පතුවලද ආයෝජනය කර තිබුණි.
(ඈ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය	1989 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ බැදුම්කර ගිවිසුම් කඩකරන ලද නිලධාරීන් 31 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.58,298,333 ක් 2022 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

(ඉ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.14,415,469,928 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සහ පිරිවැය රු.12,744,012 ක් වූ අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.
(ඊ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 වගන්තිය	එකතු කළ අගය මත බදු වැටි ඉන්වොයිසිය ලැබුණු පසුව සැපයුම්කරුට ගෙවිය යුතු වුවත්, වැටි ඉන්වොයිසි ලබාගැනීමකින් තොරව 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතුව රු.10,088,143 ක් වූ වැටි බදු රඳවාගෙන තිබුණි.
(උ)	2021 නොවැම්බර් 16 දිනැති හා Operational Manual (01/2021) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 වගන්තිය	පාඨමාලා මෙහෙයවීමේ ක්‍රියාකාරකම් කාලසටහන් (activity schedule) පිළිබඳව හා විශ්වවිද්‍යාලයේ සියළුම අංශවල ක්‍රියාකාරකම් ඇතුළත්ව 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. එහි කාර්යසාධන මට්ටම පරීක්ෂා කිරීමට 2020,2021 හා 2022 වර්ෂවල ක්‍රියාකාරී සැලැසුම්වල ප්‍රගතිය සකස්කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) පිරිවැය රු.මිලියන 58 ක් වූ විශ්වවිද්‍යාලයේ අංශ 05 ක කටයුතු සම්බන්ධයෙන් මොඩියුල වශයෙන් ස්ථාපිත කර තිබුණු කළමනාකරණ තොරතුරු පද්ධතියේ (omis) පවතින අඩුපාඩු නිරාකරණය කරගැනීමට නඩත්තු සමාගම්වලට නොහැකි වී තිබුණු බැවින් 2018 වර්ෂයේ සිට නව අභ්‍යන්තර කළමනාකරණ තොරතුරු පද්ධතිය (new omis) ස්ථාපිත කිරීම සඳහා රු.45,757,992 ක් වැය කළද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නව කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ආ) විවෘත විශ්වවිද්‍යාලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කරන ලද සේවක රක්ෂණ ණය යෝජනා ක්‍රමය සඳහා 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රජයේ මුදල් රු.42,192.534 ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවා තිබුණි. තවද, 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රජයේ මුදල් රු.30,000,000 ක් හා සේවක දායකය රු.27,789,813 ක් විශ්වවිද්‍යාලය තුළ පිහිටුවන ලද ගෙවිය යුතු රක්ෂණ ගිණුමක් හරහා අභ්‍යන්තරව පත්කළ කමිටුවක නිර්දේශ මත සේවක රක්ෂණ ඉල්ලුම්පත්‍ර සඳහා රු.57,037,256 ක් වූ මුළු මුදලම ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඇ) රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ වහලය හා තාපගතික විද්‍යාගාරයේ (thermodynamic lab) නවීකරණ කටයුතු සෘජු ශ්‍රම පදනම මත ඉටුකිරීමට 2022 අගෝස්තු, සැප්තැම්බර් හා නොවැම්බර් මාසවල රු.11,272,916 ක අමුද්‍රව්‍ය මිලදීගෙන තිබුණු නමුත් මෙම නවීකරණයන් 2023 මැයි 15 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

(ඈ) රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව නාමික ගාස්තුවක් අයකරමින් විශේෂ දීමනා පත්‍රයක් මඟින් හෙක්ටයාර් 8.2965 ක් වූ ඉඩම් 17 ක අයිතිය විවෘත විශ්වවිද්‍යාලය වෙත පවරාදීම වෙනුවෙන් 2021 ජූලි 19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී තිබුණද විගණිත දිනය වූ 2023 මැයි 08 දින වනවිටත් එම ඉඩම් පවරාගැනීම් කටයුතු නිම කර නොතිබුණු අතර විවෘත විශ්වවිද්‍යාලය භුක්ති විඳින හෙක්ටයාර් 2.4506 ක් වූ ඉඩම් 05 ක අයිතියද පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 41 දෙනෙකු සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 252 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.100,314,372 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණු අතර, තාවකාලික පදනම මත අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 21 දෙනෙකුද බඳවාගෙන දීමනා ගෙවා තිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

10.2 පිළිතුරු වාර්තාව

මගේ අංකය
எமது இல.
My No. VV/AC/A.R / 2022

ඔබේ අංකය
உமது இல.
Your No. HED/F/I/OUSL/2022/FA/17

දූරකථනය
தொலைபேசி 94 11 2881208
Telephone 94 11 2369762

Facsimile : 94 11 2369762

Email : bursar@ou.ac.lk

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
இலங்கை திறந்த பல்கலைக்கழகம்
THE OPEN UNIVERSITY OF SRI LANKA

නැපැල් පෙට්ටිය 21,
නාවල,
නුගේගොඩ.

அஞ்சற் பெட்டி 21,
நாவல,
நுகேகொட.

P.O.Box 21,
Nawala
Nugegoda.

2023 ඔක්තෝම්බර් 13

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) විදුලි බල මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලද විදුලි රැහැන් පද්ධතිය විශ්වවිද්‍යාලයේ වත්කමක් නොවන අතර එය විදුලි බල මණ්ඩලය සතු වත්කමකි. එම නිසා විදුලි රැහැන් පද්ධතිය වෙනුවෙන් ගෙවන ලද සේවා ගාස්තුව පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

(ආ) විශ්වවිද්‍යාලය විසින් ලියාපදිංචි ශිෂ්‍යයන්ගෙන් වාර්ෂිකව ශිෂ්‍ය ගාස්තු අය කරන අතර, එය වාරික 2 ක් යටතේ ශිෂ්‍යයන්ගෙන් අයකර ගනු ලබයි. අධ්‍යයන වර්ෂය හා ගිණුම් වර්ෂය අතර වෙනසක් පවතින බැවින් සමාලෝචිත ගිණුම් වර්ෂයට අදාල ආදායම එම වසරේ ශිෂ්‍ය අදායම ලෙස හඳුනාගන්නා අතර ඉතිරිය කලින් ලද ආදායමක් ලෙස ගිණුම්ගත කරනු ලබයි.

(ඇ) AHEAD ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයේ ගිණුම් වලින් පරිබාහිරව වෙනමම ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ඒ අනුව, ගණුදෙනු වෙනමම බැංකු ගිණුමක් යටතේ පවත්වාගෙන යනු ලබන අතර, එහි ගිණුම් කටයුතු ද වෙනමම ලෙජර් ගිණුමක් යටතේ පවත්වා ගෙන යනු ලබයි. එමනිසා, AHEAD ව්‍යාපෘතියේ වියදම් විශ්වවිද්‍යාලයේ ගිණුම් වලින් හෙළිදරව් කිරීමක් සිදු නොවන බව සඳහන් කරනු කැමැත්තෙමි.

(ඈ) පරිගණක පද්ධතියේ පවතින සීමාවන් හේතුවෙන් පොදු සංචිත ගිණුම වෙනුවට නව ලෙජර් ගිණුම් 02ක් ඇති කිරීම කඩිනමින් සිදුකල නොහැක. ඒ අනුව, මූලධන සමුච්චිත අරමුදලට අදාල සියළු ගැලපීම් පොදු සංචිත ගිණුම හරහා සිදුකිරීමට කටයුතු කරන ලදී.

(ඉ) 2021 වසරට අදාලව උපචිත වියදම් වෙනුවෙන් ගෙවීම් සිදු කිරීමේදී එම වියදම උපචිත වියදම් ගිණුමට හර කිරීම වෙනුවට අදාල වියදම් ගිණුමට හර කර තිබීම නිවැරදි කිරීමට 2022 වර්ෂයේ අදාල වියදම් ගිණුමෙන් අඩු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව, සමාලෝචිත වසරේ වියදම අඩුවෙන් වාර්තා කර ඇත යන්න පිළිගත නොහැකිය.

(ඊ) OMIS පරිගණක පද්ධතියේ පවතින අපහසුතා හේතුවෙන් ශිෂ්‍ය ආදායමට අදාලව නිවැරදි කාල විශ්ලේෂණයක් ලබා ගැනීමට නොහැකි වී ඇත. නව පරිගණක පද්ධතිය මඟින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී බලාපොරොත්තු වේ.

(උ) සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අවස්ථාව වන විට 2022 වර්ෂයේ මූල්‍ය කටයුතු අවසන් කර පරිගණක පද්ධතිය අගුලු දමා තිබුණු බැවින් එය නැවත 2022 වර්ෂය සඳහා විවෘත කල නොහැකිය. ඒ අනුව ක්ෂය නිවැරදි කිරීම පරිගණක පද්ධතිය මඟින් 2023-01-01 දිනට සිදුකරන ලදී.

නමුත් වැඩිපුර ගිණුම්ගත කල ක්ෂය වියදම නිවැරදි කිරීම සඳහා යොදන ලද ජ'නල් සටහනේ වැරදීමකින් හර බැර මාරුකර ගිණුම්ගත කර ඇත. ඒ අනුව ක්ෂය නිවැරදි කිරීමට යොදන ලද ජ'නල් සටහන වැරදි බව පිළිගනිමි.

එම ජ'නල් සටහන අවලංගු කර JNL2023000563 මඟින් ක්ෂය වියදම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලදී.

(ඌ) OMIS පද්ධතියේ වත්කම් ලේඛනය වර්ෂ කිහිපයක් නිවැරදිව යාවත්කාලීන නොවූ බව නිරීක්ෂණය වූ අතර, එම පද්ධතිය තුල පවතින සීමාවන් හේතුවෙන් එය පසුව නිවැරදි කිරීමට ද නොහැකි විය. එම නිසා පරිගණක පද්ධතිය මඟින් ක්ෂය ගණනය කිරීම් නිවැරදිව සිදු නොවේ.

ඒ අනුව පරිගණක පද්ධතිය මඟින් ලබා දෙන ක්ෂය ගණනය කිරීම් ජර්නල් සටහන් මඟින් ඉවත්කර, නිවැරදිව ගණනය කරන ලද වාර්ෂික ක්ෂය අගය ජර්නල් සටහන් මඟින් පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම සිදුකරයි.

(එ) රු. 5,340,344.00 ක් වූ E-books හා මෘදුකාංග (Software) හි ජීවිත කාලය පුරෝකථනය කල නොහැකි බැවින් එම වත්කම් අවිනිශ්චිත ජීවිත කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත.

(ඒ) පුස්තකාලය විසින් 2018 වර්ෂයේදී පුස්තකාල පොත් තොග සත්‍යාපනය සිදුකර, නැතිවී ඇති පොත් සඳහා නිසි අවසරය ලබාගෙන ප්‍රතිග්‍රහන ලේඛනයේ Missing ලෙස සඳහන් කරන ලදී. ඉන් අනතුරුව 2019 වර්ෂයේදී පුස්තකාල පොත් එකතුව සඳහා මිල තක්සේරුව ආරම්භ කරන ලද අතර ප්‍රථමයෙන් පුස්තකාල කොහා පද්ධතිය භාවිතා කරමින් අදාල පුස්තකාල එකතුවේ තොරතුරු පිටපතක් Excell Sheet එකතුව ලබා ගන්නා ලදී. ඉන් අනතුරුව පහත සඳහන් ආකාරයට එම පොත් සඳහා වන මිල ගණන් තීරණය කර එම Excell Sheet යාවත්කාලීන කරන ලදී.

- පොත් මිලදී ගන්නා අවස්ථාවේ කෘතියේ වටිනාකම් ප්‍රතිග්‍රහන ලේඛනයේ සඳහන් කරන අතර එම මිල ප්‍රථමයෙන්ම ලබා ගැනීම.
- ප්‍රතිග්‍රහන ලේඛනයේ මිල සඳහන් නොවන පොත් සඳහා පොත භෞතිකව රැගෙන එහි සඳහන් මිල ලබා ගැනීම.

- ඉහත ආකාර දෙකටම මිල සොයා ගත නොහැකි අවස්ථාවන් වලදී අන්තර්ජාලය මඟින් අදාල කෘතියට අදාල මිල ගණන් සොයා ගැනීම.

- විදේශ මුදල් ඒකක වලින් මිල ගණන් සඳහන්ව ඇති අවස්ථාවන් වලදී එම කෘතියේ ප්‍රකාශිත වර්ෂයට අදාල විනිමය අනුපාතයට අනුව ලංකාවේ මුදල් ඒකකයට පරිවර්තනය කර වටිනාකම් සකසා ගන්නා ලදී.

- ඉහත එක් ආරයකටවත් මිල සොයාගත නොහැකි වන අවස්ථාවන් වලදී පිටුවකට රු. 2.00 ක මිලක් ගෙන අදාල කෘතියේ පිටු ගණනින් වැඩිකර මිල සකසා ගැනීම.

- මිල සඳහන් නොවන අධ්‍යයන ද්‍රව්‍ය (Course Materials) සඳහා සාමාන්‍ය මිලක් (Average Price) සකසා ගැනීම.

- මිල සඳහන් නොවන ශ්‍රව්‍ය තැටි හා පටි සඳහා සාමාන්‍ය මිලක් යොදාගන්නා ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක: 7 ප්‍රකාරව ප්‍රත්‍යාගණන අගයන් ගිණුම්ගත කර ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි.

(ඔ) Zoom Business Accounts 05 ක් වෙනුවෙන් 2022-11-30 සිට 2023-11-29 කාලයට අදාලව ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය විසින් විශ්වවිද්‍යාලය වෙනුවෙන් රු. 396,019.00 ක් දරා ඇත. ඒ සම්බන්ධයෙන් 2022 ගිණුම් වර්ෂයට අදාල කොටස වන රු. 33,001.56 ක වියදම පශ්චාත් උපාධි ඉංග්‍රීසි ආයතනයට ගෙවිය යුතු මුදලක් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. විගණනය විසින් සඳහන් කර ඇති ශේෂයට හේතුව මෙම වෙනස වේ.

විශ්වවිද්‍යාලය විසින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද මුද්‍රණ ඇනවුම් වල වටිනාකම් පදනම්ව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ශේෂය ගිණුම්ගත කර ඇත.

නමුත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව අප විසින් ඉල්ලුම් කල ඇනවුම් වලට අදාලව මුද්‍රණ කටයුතු සිදුකර ගෙන යාමේදී, මුද්‍රණ පිරිවැය ඉහල යාම හේතුවෙන් ඇති වූ මිල වැඩිවීම් ද ඔවුන් විසින් නිකුත් කරන ලද බිල්පත් වලට එකතු කර ඇත. එමෙන්ම, විශ්වවිද්‍යාලය විසින් ඉල්ලුම් කල පොත් සංඛ්‍යාවට වඩා වැඩි පොත් ප්‍රමාණයක් මුද්‍රණය කර නිබුණු අතර එම අමතර පොත් සංඛ්‍යාවේ වියදම ද ඔවුන් විසින් නිකුත් කල බිල්පත් වලට ඇතුලත් කර ඇත.

ඉහත කරුණු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් අගය හා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු ලියවිලි වල සඳහන් අගය අතර වෙනසට හේතු වී ඇත.

(ඕ) විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල පාඨමාලා ද්‍රව්‍ය ප්‍රාදේශීය මධ්‍යස්ථාන වල සහකාර අධ්‍යක්ෂක වරුන්ගෙන් සැදුම් ලත් කමිටු මඟින් භෞතිකව පරීක්ෂා කර බලා තොග ගණනය කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව පාඨමාලා ද්‍රව්‍යය (මුද්‍රිත පොත්) භෞතිකව පරීක්ෂාකර නොනිබුණු බව පිළිගත නොහැකිය.

2.2.2

නීතිරීති/විධානයට යොමුව			නිරීක්ෂණය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		.
	(i)	මුදල් රෙගුලාසි 102,103,104, හා 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	විශ්වවිද්‍යාලය විසින් වාර්ෂිකව ලියාපදිංචි වන ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන අධ්‍යයන ප්‍රකාශන මුද්‍රණය කරනු ලබයි. මෙය විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය වියදමකි. නමුත් අධ්‍යයන වර්ෂ අතරතුර සිසුන් විසින් පාඨමාලා හැරයාම, විෂය නිර්දේශයන් වෙනස්වීම් ආදී කරුණු හේතුවෙන් ඇතැම් විට මුද්‍රණය කරන ලද පොත්පත් ඉවත් කිරීමට සිදුවේ. මෙය මාර්ගගත අධ්‍යාපනය ලබාදෙන විශ්වවිද්‍යාලයක් තුල සිදුවිය හැකි පොදු තත්වයකි. ඒ අනුව මුද්‍රණය කරන ලද පොත් පත් භාවිතයෙන් ඉවත් කිරීම තොග හානියක් ලෙස සඳහන් කල නොහැකිය. ඒ අනුව පාලක සභා අනුමැතිය මත එම පාඨමාලා ද්‍රව්‍ය අදාල වසරේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.
	(ii)	මුදල් රෙගුලාසි 113 (3) (ආ)	විශ්වවිද්‍යාලයේ කිනම් හෝ පාඨමාලාවක් සඳහා ලියාපදිංචියක් ලබාගත් සියළුම සිසුන්ගේ දත්ත විශ්වවිද්‍යාලයේ පරිගණක පද්ධතිය මඟින් පවත්වාගෙන යනු ලබයි. යම් ශිෂ්‍යයෙක් පාඨමාලාවෙන් ඉවත් වීම /හැරයාම/ අවසන් කිරීම යන කිනම් අවස්ථාවකදී වුවත් එම ශිෂ්‍යයාගේ තොරතුරු පරිගණක පද්ධතියෙන් ඉවත් කිරීමක් සිදු නොකරයි. ඒ අනුව වසර 5 ක් ඉක්මවා ලියාපදිංචි අළුත් නොකල සිසුන්ගේද දත්ත පරිගණක පද්ධතියෙන් ඉවත් කිරීමක් සිදු නොකරනු ලබයි.
(ආ)		1971 අංක 38 දරන මුදල් පනතේ 11(අ) වගන්තිය	භාණ්ඩාගාර අනුමැතිය ලැබෙන තුරු කෙටිකාලීන ආයෝජන කිරීම් ප්‍රමාද කල නොහැකි බැවින් භාණ්ඩාගාර නිලධාරීන්ගේ උපදෙස් මත ස්ථාවර තැන්පතු වල අයෝජනය කරන අවස්ථාවේදීම භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලීම් ලිපි භාණ්ඩාගාරයට යොමුකර ඇත.
(ඇ)		2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය	(i) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් රාජ්‍ය, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් ඇතුළු සියළුම රාජ්‍ය ආයතන අමතා නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 දරණ 2022 අප්‍රේල් මස 26 දිනැති චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාලය විසින් සියළුම අනුමත කිරීම් අත් හිටවන ලදී. ඉන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපි අංක UGC/DA-F/Bond violation 2022 නොවැම්බර් මස 09 දිනැති ලිපිය මඟින් පහත කාරණාවන් හට ඉඩදෙන ලදී.

4

			• ස්ථිර සේවක සංඛ්‍යාවේ නිහය පියවා ගැනීම සඳහා තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, එවැනි බඳවා ගැනීම් පිරවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට යටත්ව. • අධ්‍යයන නිවාඩු මත විදේශගත වීමට අවශ්‍ය පරිවාස කථිකාචාර්යවරුන් සේවයේ ස්ථිර කිරීමට පෙර අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා විදේශ ගත වීම්. • සප්ත වාර්ෂික නිවාඩු මත විදේශගත වීමට කැමති තහවුරු කර ඇති සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය සඳහා. (ii) එකඟ නොවේ. මෙම අරමුදල් ඒකාබද්ධ අරමුදලෙන් ලබාගත් ප්‍රතිපාදන නොවන බව ප්‍රකාශ කරමි. විශ්වවිද්‍යාලයේ විවිධ අංශ සඳහා CERC සහ C-SAP යන ආයතන මඟින් කරන ලද කෙටිකාලීන පාඨමාලා සහ පශ්චාත් උපාධි පාඨමාලා මඟින් උපයන අතිරික්තයෙන් කොටසක් අදාළ අංශවල පොදු අරමුදල්වලට බැර කරනු ලැබේ. එම අරමුදල්වල භාරකාරීත්වය ඇත්තේ ඒ ඒ අංශවලටය. කෙසේ වෙතත් පොදු කටයුතු සඳහා වියදම් කිරීමේදී සෑම විටම මුදල් කමිටුවේ නිර්දේශ මත පාලක සභා අනුමැතියට යටත්ව වියදම් කර ඇත.
(ඇ)		විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය	(i) පී. සමරනායක, (ii) එස්. දලුවත්ත, (iii) වී.පී.එස්. ඒකනායක, (iv) ජේ.ඒ. එස්. ඩී. සේතුංග, (v) එච්.කේ.ඩී.ඒ.ටී.එන්. අන්නක්කගේ, (vi) ඩබ්ලිව්. එස්. ටී. ෆෝන්සේකා, (vii) එම්.කේ. එම්. පී. සී. රාජපක්ෂ බැදුම්කර කඩකර වසර දහය ඉක්මවා ඇති ඉහත නම් සඳහන් නිළධාරීන් හා අනෙක් නිළධාරීන් පිළිබඳව 2021.10.07 වැනි දින පැවැති නිවාඩු කමිටුවේ දී පහත සඳහන් තීරණ ගන්නා ලද අතර ඒ අනුව කටයුතු කරමින් සිටී. අදාළ නිළධාරීන්ගේ අර්ථ සාධක අරමුදලේ ඇති ශේෂය, ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන ලිපිය රහිතව අය කර ගැනීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට උපකුලපතිවරයාගේ අත්සනින් ලිපියක් සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත යවා ඇත. නිළධාරීන්ගේ හා ඔවුන්ගේ ඇප කරුවන්ගේ වර්තමාන ලිපිනයන් සොයාබැලීම. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් යෝජනා කර

			ඇති පරිදි, කල්ගත වී ඇති බැඳුම්කර කඩකිරීම් පිළිබඳව සොයා බැලීමට කමිටුවක් පත් කිරීමට කටයුතු කිරීම. ඒ අනුව අයකර ගැනීමේ කටයුතු එම තීරණ අනුව තවදුරටත් සිදුකිරීමට උත්සාහ ගනිමින් සිටියි. (viii) යූ.ජී. ජයසේකර මයා බැඳුම්කර මුදල අයකර ගැනීමට නීති මඟින් කටයුතු කර ඇත. ඒ අනුව දිස්ත්‍රික් උසාවියේ (ගල්කිස්ස) 2014.04.30 දින නඩු පවරා ඇත (Case No. 7362/14/M). 2019.12.19 දින විශ්ව විද්‍යාලයට වාසිදායක ලෙස තීන්දුව ලබා දී ඇත. කෙසේ වෙතත් එම තීන්දුවට එරෙහිව ජයසේකර මහතා විසින් WP/HCCA/MT/30/2020 F-A සහ WP/HCCA/MT/30/2020 F-B යන අංක යටතේ ගල්කිස්ස සිවිල් අභියාචනා මහාධිකරණයේ අභියාචනා ගොනු කර ඇත. මේ අතරතුර 2022.09.27 දින අභියාචනා චිත්තිකරු විසින් වග උත්තරකාර පැමිණිලිකරු වන විවෘත විශ්වවිද්‍යාලය වෙත සමථයක් යෝජනා කර තිබේ. එකී සමථය සලකා බැලූ විශ්වවිද්‍යාලයේ පාලක සභාව 2022.10.28 දින පැවති සිය 492 වැනි රැස්වීම්වාරයේ දී ප්‍රති සමථයක් යෝජනා කරන ලද අතර, සම්බන්ධයෙන් අභියාචක චිත්තිකරු ප්‍රතිචාර නොදැක්වීම මත,2023.05.08 දින නඩු කටයුත්ත විචාදයට ගන්නා ලදී. මේ සම්බන්ධ ගරු ගල්කිස්ස සිවිල් අභියාචනා මහාධිකරණයේ තීන්දුව 2023.06.15 දිනට දීමට නියමිතය. (ix) පී.ටී.ආර්. දාබරේ ගිවිසුමේ වටිනාකමේ කොටසක් අර්ථ සාධක අරමුදලේ ශේෂයෙන් අයකර ගැනීමට අවශ්‍ය අර්ථ සාධක අරමුදල නිදහස් කිරීමේ පත්‍රිකා 2021.08.28 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත යොමු කර ඇත. ඉතිරි මුදල ඇයගෙන් හා ඇප කරුවන්ගෙන් අයකර ගැනීමට නීතිමය ක්‍රියා මාර්ග සඳහා යොමුකර ඇත. (x) එච්.ඒ.සී.එම්. පෙරේරා - ගිවිසුමේ වටිනාකමින් කොටසක් අර්ථ සාධක අරමුදලේ ශේෂයෙන් අයකර ගැනීමට අවශ්‍ය අර්ථ සාධක අරමුදල නිදහස් කිරීමේ පත්‍රිකා සකස් කිරීම කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම් වෙත යැවීමට නියමිතව ඇත.

			විශ්‍රාම පාරිතෝෂික මුදල ද ඇයගේ කැමැත්ත ලබා ගෙන අයකර ගැනීමට කටයුතු කර ඇත. කාරණා කිහිපයක් සඳහන් කරමින්, බැඳුම්කර වටිනාකම් නැවත ගණනය කරන මෙන් පෙරේරා මහත්මිය ඉල්ලීමක් කර ඇත. එසේ නැවත ගණනය කළ වටිනාකම් දැන්වූ පසුව සංශෝධිත බැඳුම්කරයේ වටිනාකම් ගෙවන බව ද ඇය විසින් දන්වා ඇත. (xi) කේ.සී. අහංගම - ගිවිසුමේ වටිනාකම් රුපියල් 634,094.65 කි. අර්ථ සාධක අරමුදලේ ශේෂය රුපියල් 707,731.11 කි. ගිවිසුමේ වටිනාකම් අර්ථ සාධක අරමුදලේ ශේෂයෙන් අයකර ගැනීමට අවශ්‍ය අර්ථ සාධක අරමුදල නිදහස් කිරීමේ පත්‍රිකාව 2023.03.23 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත යොමු කර ඇත.
(ඉ)		1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර වක්‍රලේඛය	විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් වලට වාර්ෂිකව එකතු වෙන ප්‍රමාණයන් හා ඒවායේ වටිනාකම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සටහන් මඟින් සෑම වසරකම විගණනයට ලබාදීමට කටයුතු කර ඇත.
(ඊ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 වගන්තිය		රු.10,088,143.00 ක රඳවාගෙන ඇති වැටි බඳු මුදලට අදාලව, අදාළ සැපයුම් කරුවන් විසින් වැටි බඳු නිෂ්කාශන සහතිකය අපවෙත මෙතෙක් ඉදිරිපත් කර නැත. එබැවින් එම මුදල අදාල සහතිකය ඉදිරිපත් කරන තෙක් රඳවාගෙන ඇත. වැටි බදු සැපයුම් කරුවන් වෙත කරනු ලබන ගෙවීම් පිළිබඳ විස්තර සෑම කාර්තුවක් අවසානයේදීම නියමිත දින වන විට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. මෙහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොමැති නමුත්, ඉදිරියේදී පිළියෙල කරනු ලබන අදාල වාර්තාවල පිටපතක් විගණකාධිපති වෙත ද ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.
(උ)	2021 නොවැම්බර් 16 දිනැති හා Operational Manual (01/2021) දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 2.3 වගන්තිය		2022 වර්ෂයට අදාළ ව පරිපාලන අංශයන් හි ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීම සිදු වී නොමැති බව පිළිගනිමු. කෙසේ වෙතත් පසුව 2022 වර්ෂය සඳහා පරිපාලන අංශවල ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාලයේ අරමුණු ලභා කර ගැනීම සඳහා යෙදූ ආකාරය පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කිරීමට කටයුතු කරන ලද අතර 2023 වර්ෂයේ සිට ඉදිරියට නිවැරදිව පරිපාලන අංශ සඳහා අදාළ ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කර විශ්වවිද්‍යාල

		ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම 2021 වසර අවසානයේ පිළියෙළ කොට 486 වන පාලක සභාව වෙත 22. 04.2022 ඉදිරිපත් කරන ලදී. 2022 වසරේ පළමු කාර්තුව හා දෙවන කාර්තුව ලෙස ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති සමාලෝචනයන් දෙවරක් පාලක සභාව වෙත පහත පරිදි ඉදිරිපත් කෙරිණි. • 2022.10.25 වන දින පවත්වන ලද 492 වන පාලක සභාව වෙත පළමු කාර්තුවේ ප්‍රගති සමාලෝචනය (2022 ජනවාරි - ජුනි දක්වා) ඉදිරිපත් කෙරිණි • 2023.04.28 වන දින පවත්වන ලද 498 වන පාලක සභාව වෙත දෙවන කාර්තුවේ ප්‍රගති සමාලෝචනය (2022 ජුනි - දෙසැම්බර් දක්වා) ඉදිරිපත් කෙරිණි. 2023 වසර සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2022 වසරේ දී පිළියෙළ කර 27.01.2023 දින පැවති 495 වන පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

2.3 වෙනත් කරුණු

(අ) 2018 වසරේ සිට නව පරිගණක පද්ධතියක් ආරම්භ කිරීමට කටයුතු කලත් මේ වන විට පරිගණක පද්ධතිය නිර්මාණය සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීමේ කාර්යය පමණක් සිදුකර ඇති අතර, පරිගණක පද්ධතියක් ලෙස ගිණුම්ගත කිරීමට, පරිගණක පද්ධතියක් නිර්මාණය වී නොමැත. ඒ අනුව එම වියදම් ප්‍රාග්ධනිත කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි ඉටුවී නොමැති බැවින්, අදාල වියදම් පුනරාවර්ථන වියදම් සේ සලකා ගිණුම්ගත කරන ලදී. ඒ කෙසේ වෙතත් ඒ සඳහා මිලදී ගත් ස්ථාවර වත්කම් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

(ආ) විශ්වවිද්‍යාලයීය වෛද්‍ය සුබසාධන යෝජනා ක්‍රමය මුදල් කමිටුව හා පාලක සභා අනුමැතීන් මත පවත්වාගෙන ගිය අතර ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා 2023/07/10 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තුමා වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත.

පාලක සභාවේ අනුමැතිය ඇතිව උපකුලපතිතුමා විසින් පත් කරන ලද සාමාජිකයින් 6 දෙදෙනෙකුගෙන් සමන්විත වූ (වෛද්‍ය නිලධාරී, ලේඛකාධිකාරී විසින් නම් කල නිළධාරී, මූල්‍යාධිකාරී විසින් නම් කල නිළධාරී, හෙද අධ්‍යනාංශය, ඖෂධවේදී අධ්‍යනාංශය, වෛද්‍ය පරීක්ෂණාගාර විද්‍යා අධ්‍යනාංශය ප්‍රධානීන්) බිල්පත් ඇගයීම සිදුකරන අතර, විශ්වවිද්‍යාලයීය වෛද්‍ය නිලධාරීතුමා විසින් සියලු වෛද්‍ය වාර්තා නිර්දේශ කරනු ඇත.

(ඇ) රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ වහලය නවීකරණ කටයුතු ශ්‍රී ලංකා යුධ හමුදාවේ සෘජු ශ්‍රම දායකත්වයෙන් සිදු කිරීමට සැලසුම් කර ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය 2022 වසරේදී මිලදී ගන්නා ලදී. නමුත් යුධ හමුදාවෙන් ගත් හදිසි තීරණයක් මත එම කටයුතු ආරම්භ කිරීම කල් දැමීමට සිදුවිය. නමුත් නැවත වරක් යුධ හමුදා ශ්‍රමය ලබා දීමට ශ්‍රී ලංකා යුධ හමුදාවේ අනුමැතිය ලැබුණු බැවින් එම කටයුතු 2023 ජූනි මස මුල් සතියේ ආරම්භ කර මෙවන විට එම කටයුතු නිම කිරීමට කටයුතු කර ඇත.

(ඇ) අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ ඉඩම් කැබලි 17 අතරින් ඉඩම් කැබලි 11 ක් (මඩකලපුව, වවුනියාව, යාපනය, බදුල්ල, ත්‍රිකුණාමලය, බණ්ඩාරවෙල, අම්පාර, මාතලේ, පොලොන්නරුව, ගම්පහ, පුත්තලම) සඳහා ඉඩම් වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය වන අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිර්දේශ වාර්තාවන්, අදාළ පළාතේ ඉඩම් කොමසාරිස් මහින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු වෙමින් පවතින අතර ඊට අදාළ පසුවිපරම් විශ්වවිද්‍යාලය විසින් සිදු කරනු ලබයි. තවද යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය පිහිටි ඉඩම සඳහා රජයේ ඉඩම් ආඥා පනත 6(1) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් ගෙවිය යුතු වන නාමික ගාස්තුව ලෙස රු. 40,000.00 මුදලක් 2023.05.19 වන දින විශ්වවිද්‍යාලය විසින් නල්ලූර් ප්‍රදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

එසේම විශ්වවිද්‍යාලය විසින් භුක්ති විඳිනු ලබන අනෙකුත් ඉඩම් කැබලි සඳහා ද විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් සිදු කෙරෙමින් පවතින අතර ඊට අදාළ පසුවිපරම් ද විශ්වවිද්‍යාලය විසින් සිදු කරනු ලබයි.

(ඉ)

- මෙම විශ්වවිද්‍යාලයේ නාවල පරිශ්‍රයේ අමුත්තන්ගේ නිවාසයේ නිවාස භාරකරු සේවයෙන් පහකිරීමට සානුකම්පිත විකල්පයක් වශයෙන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම හේතුවෙන් එම අමුත්තන්ගේ නිවාසයේ කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට කෙනෙකු නොමැති වූ නිසා බඳවා ගැනීම් සිදු කිරීමට අවසර ලැබෙන තුරු තාවකාලික විසඳුමක් ලෙස එම තනතුර සඳහා පාලක සභාවේ අනුමැතිය ඇතිව කොන්ත්‍රාත් පදනම මත සේවකයෙකු පත් කර ගන්නා ලදී.

- වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ හෙද නිලධාරී තනතුරේ සේවය කළ සේවිකාව 2022.12.31 දින සිට විශ්‍රාම ගැනීම හා ඊට ප්‍රථම විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීම නිසා වෛද්‍ය මධ්‍යස්ථානයේ වෙනත් හෙද නිලධාරිණියක නොමැති බැවින් එම තනතුරට කොන්ත්‍රාත් පදනම මත අයෙකු බඳවා ගෙන ඇත.

- තොරතුරු තාක්ෂණ අංශයේ තාක්ෂණික නිලධාරිණියක් වැටුප් රහිත විදේශ නිවාඩු ලැබීම නිසා එම සේවකයා වෙනුවෙන් වෙන් කළ මුදලින් වැටුප් ගෙවීමේ පදනමින් එම රාජකාරි කටයුතු ආවරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත අයෙකු බඳවා ගන්නා ලදී. එම වැටුප් රහිත නිවාඩු ලැබූ සේවකයා නිවාඩු කාලය අවසානයේ නැවත සේවයට වාර්තා නොකළ බැවින් ඇය සේවය අතහැර ගිය අයෙකු සේ සලකන ලද අතර එම කටයුතු කොන්ත්‍රාත් පදනම මත පත් කළ අයෙකුගෙන් සපුරා ගැනීමට සිදුවිය.

- දැනට විශ්වවිද්‍යාලයේ රියදුරු තනතුරු 8ක් පුරප්පාඩු වී පවතින අතර විශ්වවිද්‍යාලයේ පීඨවල සහ අනෙකුත් අංශවල එදිනෙදා අවශ්‍යතා සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම දුෂ්කර වූ බැවින් රියදුරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත 5 දෙනෙකු බඳවා ගැනීමට පාලක සභාව අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව රියදුරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත එක් අයෙකු බඳවා ගෙන ඇත.

- මෙම විශ්වවිද්‍යාලයේ තාවකාලික නවාතැන් පහසුකම් (TRF) අංශය සඳහා නේවාසිකාගාර උපපාලක තනතුරු දෙකක් අනුමත වී ඇත. එහෙත් පිරිමි සහ කාන්තා නේවාසිකාගාර දෙක සඳහා එක් අයෙකු බැගින් පමණක් සේවයේ යෙදවීමේදී විවිධ දුෂ්කරතා හා ගැටළු මතුවීම නිසා පිරිමි නේවාසිකාරය සඳහා දෙදෙනෙකුද කාන්තා නේවාසිකාගාරය සඳහා දෙදෙනෙකුද බඳවා ගැනීමට පාලක සභාවේ අනුමැතිය ලැබුණු අතර ඒ අනුව එම තනතුර සඳහා නේවාසිකාගාර උපපාලකවරුන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී.

- නඩත්තු අංශයේ ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ප්‍රමාණ බිල්පත (BOQ) සකස් කිරීම හා ඊට අදාළ අනෙකුත් කටයුතු ප්‍රමාදයකින් තොරව කර ගැනීම සඳහා ඉංජිනේරුවන්

දෙදෙනා හැරුණු විට ඒ පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ඇති අය නොමැති නිසා පාලක සභාවේ අනුමැතිය ඇතිව ප්‍රමාණ පත්‍ර සකස් කිරීම, මිනුම් ගැනීම ආදී කටයුතු ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණ සමීක්ෂකවරුන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී.

- වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා වෛද්‍ය නිලධාරි තනතුරට ස්ථිර වෛද්‍ය නිලධාරියෙකුගේ සේවය 1998 වර්ෂයේ සිට නොමැති බැවින් එම තනතුරට කොන්ත්‍රාත් පදනම මත වෛද්‍ය නිලධාරිවරයෙකු බඳවා ගෙන ඇත. වෛද්‍ය නිලධාරි තනතුර වෙනුවෙන් වෙන් කළ මුදලින් වැටුප් ගෙවීමේ පදනමින් එම රාජකාරි කටයුතු ආවරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී.

- මෙම විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාන නිලධාරිණිය 2022.12.03 දින සිට සේවයෙන් විශ්‍රාම ගැනීම නිසා 2022.01.24 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සංඛ්‍යාන නිලධාරිණියක් තෝරා පත් කර ගනු ලැබුවද රජය විසින් නිකුත් කළ ජාතික අයවැය වක්‍රලේඛ අංක 3/2022 අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මුදල් වක්‍රලේඛ අංක 04/2022 අනුව පත්වීම සිදු නොකළ නිසා එම සේවකයා වෙනුවෙන් වෙන් කළ මුදලින් වැටුප් ගෙවීමේ පදනමින් එම රාජකාරි කටයුතු ආවරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත අයෙකු බඳවා ගන්නා ලදී.

- මෙම විශ්වවිද්‍යාලයේ කොන්ත්‍රාත් පදනම මත පහත සඳහන් තනතුරු සඳහාද බඳවා ගැනීම් සිදු කර ඇත.

1	කථිකාචාර්ය - Lecturer (on contract)	40
2	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - (Senior Lecturer on contract)	01
3	සහකාර අධ්‍යක්ෂ (NODES)	01
4	ව්‍යාපෘති සහකාර	136
5	අධ්‍යයන සම්බන්ධීකාරක	34
6	මෙහෙයුම් සහකාර සහ තාක්ෂණික සහකාර	55
7	මෘදුකාංග ඉංජිනේරු	01
8	සහකාර මෘදුකාංග ඉංජිනේරු	03
9	Business Analyst	02
10	තොරතුරු සහකාර Information Assistant	07
11	වායුසමීකරණ කාර්මික Technician (Air Condition)	01

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය /කථිකාචාර්ය (කොන්ත්‍රාත් පදනම මත)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය /කථිකාචාර්ය (කොන්ත්‍රාත් පදනම මත) තනතුරු සඳහා පහත සඳහන් කරුණු හේතු කර ගෙන පාලක සභාවේ අනුමැතිය සහිතව බඳවාගෙන ඇත.

- ස්ථිර තනතුරුවල පවතින පුරප්පාඩු හේතුවෙන් අධ්‍යයනාංශවල අධ්‍යයන කටයුතු ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා.

- ඇතැම් අධ්‍යයනාංශවල අධ්‍යයනාංශ ප්‍රධානීන් විසින් පවතින අවශ්‍යතාවය මත සාධාරණීකරණය කරමින් අමතර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කරන ඉල්ලීම් මත.

- ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව මත පදනම්ව.

- අධ්‍යයනාංශවල අලුතින් ආරම්භ කිරීමට සැලසුම් කර තිබෙන විශේෂ අධ්‍යයන වැඩසටහන් සඳහා.

- වැටුප් රහිත නිවාඩු ලබා සිටින අධ්‍යයන කාර්යය මණ්ඩලය වෙනුවට අධ්‍යයනාංශවල අධ්‍යයන කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා.

10

මෙම විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල අධ්‍යයනාංශවල සහ අනෙකුත් අංශවල පරිපාලන කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම සඳහා ඉහත සඳහන් අනෙකුත් තනතුරු සඳහා පාලක සභාවේ අනුමැතිය සහිතව විශ්වවිද්‍යාලයේ උපයන මුදල්වලින් කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගෙන ඇත.

- මෙම විශ්වවිද්‍යාලයේ තාවකාලික පදනම මත පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගෙන ඇත.

1	තාවකාලික කථිකාචාර්ය (Temporary Lecturer)	21
2	තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (Temporary Demonstrator)	177
3	තාවකාලික පර්යේෂණ සහකාර (Temporary Research Assistant)	04

අනුමත කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩුවලට වෙන් කළ මුදල් භාවිතා කර (against permanent cadre vacancies) අධ්‍යයනාංශවල අධ්‍යයන කටයුතු ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා තාවකාලික කථිකාචාර්යවරුන් බඳවාගෙන ඇත.

තාවකාලික ශිල්ප ප්‍රදර්ශක තනතුරු සඳහා සහ තාවකාලික පර්යේෂණ සහකාර තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර ඇත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාවට යටත්වය.(approved cadre 2017)

මෙයට විශ්වාසී,

මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න
උපකුලපති